*"Your Vital Island" – ශ්‍රී ලංකාවේ ජාතික අපනයන සන්නාමය*

# වාර්ෂික වාර්තාව

# 2024

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**

**අංක 42, NDB/EDB ගොඩනැගිල්ල, නවම් මාවත, කොළඹ 02.**

# පටුන


| | පිටු අංකය |
|---|---|
| පටුන | 1 |
| සභාපති / ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ පණිවිඩය | 3 |
| හැඳින්වීම | 5 |
| ආයතනික තොරතුරු | 6 |
| සංවිධාන ව්‍යුහය | 7 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | 8 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්ය මණ්ඩලය | 11 |
| අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්ය මණ්ඩලයේ විස්තර | 12 |
| විගණන කමිටු වාර්තාව | 25 |
| ආයතනික පාලන වාර්තාව | 28 |
| අවදානම් විශ්ලේෂණය | 33 |
| අපනයන කාර්යසාධනය 2024 | 35 |
| 1. අපනයන අංශයේ ක්‍රියාකාරිත්වය | 36 |
| 1.1 සමස්ත නිරීක්ෂණය | 36 |
| 1.2 ප්‍රධාන අපනයන කාණ්ඩ වශයෙන් සැලකූ විට අපනයන අංශයේ ක්‍රියාකාරිත්වය | 37 |
| 1.3 2024 වර්ෂයේ අපනයනවල සංයුතිය | 37 |
| 1.4 ප්‍රධාන වෙළඳපොළවල් වෙත සිදුකරන ලද අපනයනයන් | 38 |
| 1.5 ගෝලීය වශයෙන් පවතින ප්‍රධාන කලාප වෙත සිදුකරන ලද අපනයනයන් | 39 |
| 2. 2024 වර්ෂය තුළ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සිදුකළ සංවර්ධන ක්‍රියාකාරකම්හි ප්‍රගතියේ සාරාංශයක් | 39 |
| 2.1 අපනයන සංවර්ධනය සහ ප්‍රවර්ධනය සඳහා ආංශික ක්ෂේත්‍ර | 39 |
| 2.1.1 තොරතුරු සන්නිවේදන තාක්ෂණ/ ව්‍යාපාරික ක්‍රියාවලි කළමනාකරණය ආශ්‍රිත ක්ෂේත්‍රය | 39 |
| 2.1.2 කුළුබඩු සහ සාන්ද්‍රණ ක්ෂේත්‍රය | 40 |
| 2.1.3 බෝට්ටු සෑදීමේ ක්ෂේත්‍රය | 42 |
| 2.1.4 ආහාර සහ පානවර්ග සම්බන්ධිත ක්ෂේත්‍රය | 42 |
| 2.1.5 ඉලෙක්ට්‍රොනික් සහ ඉලෙක්ට්‍රිකල් සංරචක ක්ෂේත්‍රය | 45 |
| 2.1.6 සැපයුම්දාම කළමනාකරණ ක්ෂේත්‍රය | 48 |
| 2.1.7 පොල් ආශ්‍රිත නිෂ්පාදන ක්ෂේත්‍රය | 48 |
| 2.1.8 ඇඟළුම් අංශය | 48 |
| 2.1.9 රබර් ආශ්‍රිත නිෂ්පාදන ක්ෂේත්‍රය | 50 |
| 2.2 අපනයන සංවර්ධන සහ ප්‍රවර්ධන කාර්යයන් සඳහා අනෙකුත් අංශ | 50 |
| 2.2.1 මැණික් සහ ස්වර්ණාභරණ අංශය | 50 |
| 2.2.2 ඖෂධ නිෂ්පාදන | 51 |
| 2.2.3 පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදන | 51 |
| 2.2.4 ඉදිකිරීම් සහ විදුලිබල සහ බලශක්ති ක්ෂේත්‍රය | 51 |
| 2.2.5 අධ්‍යාපන සේවා | 52 |
| 2.2.6 සමුද්‍රීය සහ අක්වෙරළ සේවා | 53 |

| | |
|---|---|
| **2.3** නිදහස් වෙළඳ ගිවිසුම්/ වරණීය වෙළඳ ගිවිසුම්/ වෙළඳ සහ ආයෝජන රාමුගත ගිවිසුම් යටතේ පවතින සහන උපරිම කරගැනීම | 54 |
| **2.4** සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය | 57 |
| **2.5** අපනයනකරුවන් සඳහා පහසුකම් සැලසීම | 61 |
| **2.6** ජාතික ඇසුරුම්කරණ මධ්‍යස්ථානය (NPC) | 63 |
| **2.7** ජාතික කාබනික පාලන ඒකකය (NOCU) | 63 |
| ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ කාර්යසාධනය වැඩිදියුණු කිරීම සඳහා මධ්‍ය කාලීන වශයෙන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත පියවර | 65 |
| 2025 වර්ෂය සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ අනාගත සැලසුම් | 68 |
| මූල්‍ය ප්‍රකාශන 2024 | 69 |
| 2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය | 70 |
| 2024.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | 71 |
| 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය | 72 |
| 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 73 |
| පොදු තොරතුරු සහ විශේෂිත ගිණුම්කරණ ප්‍රතිපත්ති | 74 |
| මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් | 90 |
| විගණකාධිපති වාර්තාව - 2023 | 108 |
| 2015 සිට 2024 දක්වා මූල්‍ය කටයුතුවල සුවිශේෂී කරුණු | 117 |

## සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ පණිවිඩය



2024 වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව මා විසින් ඉදිරිපත් කරනුයේ ඉමහත් සාඩම්බරයෙනි. ජාත්‍යන්තර වෙළඳ කටයුතුවල දී ශ්‍රී ලංකාවේ ස්ථානය ඉදිරියට රැගෙන යන අතරතුර ගෝලීය වශයෙන් පැන නැඟුනු ආර්ථික අභියෝග හසුරුවා ගනිමින් කටයුතු ඉටුකළ මෙම වර්ෂය ඔරොත්තු දීමේ හැකියාව, නවෝත්පාදන හා ක්‍රමෝපායික පරිවර්තන සනිටුහන් වූ වසරවල් අතුරින් එකකි.

ආයතනයේ ආරම්භක අවස්ථාවේ සිටම, ශ්‍රී ලංකාව සඳහා තිරසර, වැඩි දියුණු ආර්ථික වර්ධනයක් සහතික කරන පරිද්දෙන් අපනයන බහුල කිරීම, අපනයන භාණ්ඩ පරාසය සහ අපනයන වෙළඳපොළවල් පුළුල් කිරීම, නවෝත්පාදන ඇති කිරීම, සහ රැකියා අවස්ථා බිහිකිරීම යන සිය ඉලක්කය සාක්ෂාත් කරගැනීම සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය කැපවී සිටී. ශ්‍රී ලංකාව තුළ අපනයන මූලික ආයෝජන දිරිගැන්වීම සිදුවන පරිසරයක් වැඩි දියුණු කරමින් අපනයන දිරිගැන්වීම හා අපනයනකරුවන්ගේ ප්‍රජාව වෙත සහාය ලබාදීම පිණිස අප විසින් නිරන්තරයෙන් ප්‍රයත්න දරනු ලැබේ.

රජයේ ඉලක්කය වනුයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් හා අංකුර ව්‍යවසායකයින් වැඩිදියුණු මට්ටමට පත්කිරීම, අගය එකතු කිරීමේ අංශවල හවුල්කාරිත්වය ඉහළ නැංවීම, සහ විශේෂිත වෙළඳපොළවල් වෙත යොමුවන අතරතුර වෙළඳපොළ විවිධාංගිකරණය ඔස්සේ අපනයන ආර්ථිකය වර්ධනය කරමින් ශ්‍රී ලංකාව ධනවත් රටක් බවට පරිවර්තනය කරලීම යි. මෙම පරිවර්තන ක්‍රියාවලිය තුළ අපනයන ප්‍රවර්ධනය හා ඒ සඳහා පහසුකම් සලසමින්, වර්ධනය සඳහා උත්ප්‍රේරකයක් ලෙස ක්‍රියාකරමින් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් වැදගත් භූමිකාවක් ඉටු කරමින් සිටී.

2024 වර්ෂය මුළුල්ලේ, තරඟකාරිත්වය වැඩි දියුණු කරමින්, වෙළඳපොළ ප්‍රවේශය සඳහා පහසුකම් සලස්වමින්, සහ අපනයනකරුවන්ට ගෝලීය වශයෙන් ව්‍යාප්තවීම සඳහා සහාය ලබාදෙමින් අපනයන අංශයේ වර්ධනය මෙහෙයවීමේ සිය මෙහෙවර සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය ස්ථිර වශයෙන්ම පෙනී සිටින ලදී. භූදේශපාලන අවිනිශ්චිතතා සහ ආර්ථිකයන්ගේ විචලන ඇතුළු බාහිර අභියෝග මධ්‍යයේ වුව ද, අපගේ අපනයනකරුවන්ගේ කැපවීම සහ උපාය කුසලතාවයන් පිළිබිඹු කරමින් ශ්‍රී ලංකාවේ අපනයන ක්ෂේත්‍රය විසින් සුවිශේෂී අනුගතවීමක් සහ සවිමත්භාවයක් පෙන්නුම් කරන ලදී.

අප විසින් මීට පූර්ව වර්ෂයේ දී පිළිබිඹු කළ ආකාරයෙන්ම, ශ්‍රී ලංකාවේ අපනයන ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය සහ ප්‍රගමනය උදෙසා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ගනු ලැබූ වැදගත් පියවර සම්බන්ධයෙන් මා තුළ නිහතමානී මහත් ආඩම්බරයක් පවතී. ගෝලීය ආර්ථික අවිනිශ්චිතතා සහ දේශීය වශයෙන් මෙහෙයුම් පිරිවැය මගින් එල්ල වූ අභියෝග හමුවේ වුව ද, අපගේ අපනයනකරුවන් විසින් සුවිශේෂී දරාගැනීමේ හැකියාවක් සහ අනුගතවීමක් පෙන්නුම් කරන ලදී.

ඉදිරි කටයුතුවලදී ද, ගෝලීය අභියෝග මඟහරවා ගැනීමට සහ නැඟී එන අවස්ථාවන් උපයෝගී කරගැනීම පිණිස අපගේ අපනයනකරුවන් වෙත සහාය ලබා දීමට ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය කැපවී සිටී. අපනයන අංශයේ වර්ධනය, නවෝත්පාදන සහ තිරසාරත්වය සඳහා වන හිතකර පරිසරයක් වැඩිදියුණු කිරීම සඳහා අපි කැපවී සිටින්නෙමු.

මෙම පණිවිඩයේ සමාප්තිය සනිටුහන් කිරීමේ දී, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී භූමිකාව මා වෙත පැවරීම සම්බන්ධයෙන් රජය වෙත මාගේ අවංක කෘතඥතාවය පළ කිරීමට කැමැත්තෙමි.

සිය වටිනා දායකත්වයන් ලබාදීම වෙනුවෙන් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මාගේ ප්‍රශංසාව පුදකරන අතරම, සියලුම පාර්ශවකරුවන්ට ඔවුන්ගේ සහාය වෙනුවෙන් ස්තූතිය පුද කරමි. මෙම ආයතනයේ ඉලක්ක අත්පත් කර ගැනීම සඳහා වූ ප්‍රබල කැපවීම සහ අධිෂ්ඨානය

වෙනුවන් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ කළමනාකාරිත්වය සහ කාර්ය මණ්ඩලය වෙත ද ප්‍රශංසාව පිරිනැමිය යුතු ය.

ශ්‍රී ලංකා ආර්ථිකයේ වඩාත්ම වැදගත් අංශය බවට අපනයන අංශය මේ වනවිට පත්වී ඇති අතර, අප විසින් ප්‍රතිඵල ලබාදීමේ කාර්යයේ අඛණ්ඩව නියුක්ත අතරම ජාත්‍යන්තර වෙළඳ ක්ෂේත්‍රයේ නව මානයන් තුළ ජයග්‍රහණයන් සාක්ෂාත් කරගන්නා තවත් වසරක් කෙරෙහි අපේක්ෂා රඳවා සිටින්නෙමු.



.......................................

සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරි
ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

# ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB)

## හැඳින්වීම

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය යනු අපනයන සංවර්ධනය කිරීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ආයතනය වන අතර, 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩල පනත යටතේ 1979 වර්ෂයේ දී මෙය ස්ථාපනය කරන ලදී. 2024 වර්ෂය වන විට වෙළඳ භාණ්ඩ සහ සේවා අංශයේ අපනයනය තුළින් ඇමරිකානු ඩොලර් බිලියන 16.4 ක විදේශ විනිමය ඉපැයුම් ලබා ගැනීමේ අරමුණ ඇතිව ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ශ්‍රී ලංකාවේ අපනයන සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම උදෙසා නව ක්‍රමෝපායික ප්‍රවේශයක් අනුගමනය කරන ලද අතර එමඟින් රජය විසින් ඉලක්ක කරන ලද සංවර්ධන අරමුණු සඳහා දායකත්වය ලබා දෙන ලදී. ජාතික අපනයන ඉලක්ක සාක්ෂාත් කරගැනීම සඳහා නව ක්‍රමෝපායක් දියත් කිරීමේ දී සිය වගකීම් ඉටු කිරීම පිණිස ප්‍රතිපත්ති උපදේශක, අධීක්ෂක, ප්‍රවර්ධක, පහසුකම් සැපයුම්කරු සහ දැනුම් සම්පාදක වශයෙන් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සිය භූමිකාවන් ඉටුකරනු ලැබේ.

**දැක්ම**

සුවිශේෂී නිෂ්පාදන සහ සේවා සඳහා ප්‍රමුඛතම අපනයන කේන්ද්‍රස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව ස්ථානගත කිරීම.

**මෙහෙවර**

ක්‍රමෝපායික සහයෝගිතාවය ඔස්සේ ශ්‍රී ලංකාවේ අපනයනයන් ගෝලීය වශයෙන් තරඟකාරීබවට පත්කිරීම.

## ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ කාර්යයන්

ශ්‍රී ලංකාවේ අපනයන සංවර්ධනය සහ ප්‍රවර්ධනය කිරීම සඳහා වගකිවයුතු රජයේ නියෝජිතායතනයක් වශයෙන්, අප විසින් පහත කාර්යයන් ඉටු කරනු ලැබේ.

- **පහසුකම් සපයන්නා** — අපනයන සංවර්ධනය සඳහා කේන්ද්‍රීය ස්ථානය වශයෙන් කටයුතු කිරීම, සියලුම පාර්ශවකරුවන් සමඟ අපනයන සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් පහසුකම් සැලසීම සහ සම්බන්ධීකරණය සිදු කිරීම.
- **ප්‍රවර්ධකයා** — ශ්‍රී ලංකාවේ නිෂ්පාදන සහ සේවා ප්‍රවර්ධනය සඳහා නිෂ්පාදිත, සැලසුම්, සන්නාම, වෙළඳපොළ සංවර්ධන සහ වෙළඳපොළ ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- **දැනුම් සම්පාදකයා** — අපනයනකරුවන් සඳහා අපනයන ව්‍යාපාර සම්බන්ධ සියලු කරුණු සහ වෙළඳපොළ වාණිජමය අගයක් ඇති යාවත්කාලීන තොරතුරුවලට අදාළව උපදේශක සේවා හා තොරතුරු සැපයීම.
- **අධීක්ෂක** — ගෝලීය සහ දේශීය ව්‍යාපාරික පරිසරය ඇගයීම සහ අපනයන කාර්යසාධනය අධීක්ෂණය සහ අපනයන ඉලක්ක වෙත ළඟාවීම සඳහා යෝග්‍ය පියවර ගැනීම.
- **ප්‍රතිපත්ති උපදේශක** — අපනයන සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ජාතික අපනයන සංවර්ධන ප්‍රතිපත්ති පිළිබඳව රජයට උපදෙස් ලබා දීම.

## ආයතනික තොරතුරු

| | |
|---|---|
| ආයතනයේ නම | : ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය |
| නීතිමය ව්‍යුහය | : මෙය 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ ස්ථාපිත ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. |
| ප්‍රධාන කාර්යාලයේ ලිපිනය | : අංක .42, නවම් මාවත, කොළඹ 02 |
| දුරකථන අංකය | : 011 2300705 - 11 |
| ෆැක්ස් | : 011 2300715 |
| විද්‍යුත් තැපැල | : edb@edb.gov.lk |
| පාරිභෝගික උපකාරක කවුළුව | : 011 2300710 (Hotline)<br>helpdesk@edb.gov.lk |
| වෙබ් අඩවිය | : www.srilankabusiness.com |
| විගණකවරුන් | : විගණකාධිපති - ජාතික විගණන කාර්යාලය |
| නිල බැංකුකරු | : ලංකා බැංකුව<br>ජාතික සංවර්ධන බැංකුව (NDB)<br>සම්පත් බැංකුව |
| පළාත් කාර්යාල | : # දකුණු පළාත් කාර්යාලය<br>පළමු මහල , අංක 5ඒ , සී.ඒ.ආරියතිලක මාවත, මාතර<br># මධ්‍යම පළාත් කාර්යාලය<br>675,තුන්වන මහල , විලියම් ගොපල්ලව මාවත, නුවර<br># වයඹ පළාත් කාර්යාලය<br>දෙවන මහල, ජී-සික්ස් ගොඩනැගිල්ල , අංක 42, මිහිඳු මාවත<br>කුරුණෑගල<br># උතුරු පළාත් කාර්යාලය<br>එන්එච්ඩීඒ ගොඩනැගිල්ල, වනජීවී කාර්යාල පටුමඟ, චුන්ඩික්කුලි,<br>යාපනය |

# ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය - සංවිධාන ව්‍යුහය



## අධ්‍යක්ෂ මණ්ඩලය – 2024 (ජනාධිපතිවරණයට පෙර)

| | | | සිට | දක්වා |
|---|---|---|---|---|
| 1. | **ආචාර්ය කිංග්ස්ලි බර්නාඩ් මහතා** | සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී | 2023.04.03 | 2024.09.19 |
| 2. | **ඉන්දිරා මල්වත්ත මෙය** | සාමාජික | 2023.04.03 | 2024.10.08 |
| 3. | **ජගත් ප්‍රනාන්දු මහතා** | සාමාජික | 2023.04.03 | 2024.08.01 |
| 4. | **ශිරේන්ද්‍ර ලෝරන්ස් මහතා** | සාමාජික | 2023.04.03 | 2024.09.19 |
| 5. | **කේ.ඒ.විමලෙන්තිරරාජා මහතා**<br>අධ්‍යක්ෂ ජනරාල්<br>වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව<br>මුදල් අමාත්‍යාංශය | සාමාජික | 2022.03.02 | 2024.10.30 |
| 6. | **ඩබ්.එම්.ඩී.ටී.වික්‍රමසිංහ මෙය**<br>අතිරේක ලේකම් (ප්‍රතිපත්ති සහ සංවර්ධන)<br>වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | සාමාජික | 2023.01.05 | 2024.10.30 |
| 7. | **ඒ.එච්.එස්.ෆරීඩා මෙය**<br>අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්)<br>ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යාංශය | සාමාජික | 2020.09.14 | 2025.01.30 |
| 8. | **අයි.චමින්ද පතිරාජ මහතා**<br>අතිරේක ලේකම් (ආංශික සංවර්ධන)<br>කර්මාන්ත අමාත්‍යාංශය | සාමාජික | 2023.03.02 | 2025.05.29 |
| 9. | **ශානිකා දිසානායක මෙය**<br>අතිරේක ලේකම්<br>විදේශ කටයුතු අමාත්‍යාංශය | සාමාජික | 2023.05.03 | 2025.02.27 |
| 10. | **රේණුකා එම්.වීරකෝන් මෙය**<br>වැ.බ. අධ්‍යක්ෂ ජනරාල්<br>ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය | සාමාජික | 2022.05.05 | මේ දක්වා |
| 11. | **ආචාර්ය ඊ.ආර්.එස්.පී.එදිරිමාන්න මහතා**<br>අතිරේක ලේකම් (කෘෂි තාක්ෂණ)<br>කෘෂිකර්ම අමාත්‍යාංශය | සාමාජික | 2023.08.31 | 2025.01.16 |
| 12. | **ඊ.එම්.එස්.බී.ජයසුන්දර මහතා**<br>අතිරේක ලේකම් (සංවර්ධන)<br>ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ ගුවන් සේවා අමාත්‍යාංශය | සාමාජික | 2024.04.18 | මේ දක්වා |
| 13. | **අනෝජා හේරත් මෙය**<br>අතිරේක ලේකම් (සංවර්ධන)<br>ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය | සාමාජික | 2024.04.04 | 2024.09.19 |

## අධ්‍යක්ෂ මණ්ඩලය – 2024 (ජනාධිපතිවරණයට පසු)

| | | | සිට | දක්වා |
|---|---|---|---|---|
| **1.** | **මංගල විජේසිංහ මහතා** | සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී | 2024.10.11 | මේ දක්වා |
| **2.** | **ඒ.එච්.එස්.ෆරීඩා මෙය**<br>අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්)<br>ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යාංශය | සාමාජික | 2020.09.14 | 2025.01.30 |
| **3.** | **අයි.චමින්ද පතිරාජ මහතා**<br>අතිරේක ලේකම් (ආංශික සංවර්ධන)<br>කර්මාන්ත අමාත්‍යාංශය | සාමාජික | 2023.03.02 | 2025.03.27 |
| **4.** | **ශානිකා දිසානායක මෙය**<br>අතිරේක ලේකම්<br>විදේශ කටයුතු අමාත්‍යාංශය | සාමාජික | 2023.05.03 | 2025.02.27 |
| | **දර්ශන එම්.පෙරේරා මහතා**<br>ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ ජනරාල්<br>විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය | සාමාජික | 2025.03.28 | මේ දක්වා |
| **5.** | **රේණුකා එම්.වීරකෝන් මෙය**<br>වැ.බ. අධ්‍යක්ෂ ජනරාල්<br>ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය | සාමාජික | 2022.05.05 | මේ දක්වා |
| **6.** | **ආචාර්ය ටී.ආර්.එස්.පී.එදිරිමාන්න මහතා**<br>අතිරේක ලේකම් (කෘෂි තාක්ෂණ)<br>කෘෂිකර්ම අමාත්‍යාංශය | සාමාජික | 2023.08.31 | 2025.01.16 |
| | **ආචාර්ය ඩබ්.ඒ.ආර්.ටී.වික්‍රමාරච්චි මහතා**<br>අතිරේක ලේකම් (කෘෂි තාක්ෂණ)<br>කෘෂිකර්ම අමාත්‍යාංශය | සාමාජික | 2025.01.29 | 2025.04.30 |
| **7.** | **යූ.එන්.මල්ලවආරච්චි මහතා**<br>අතිරේක අධ්‍යක්ෂ ජනරාල්<br>ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව<br>මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | සාමාජික | 2024.11.18 | මේ දක්වා |
| **8.** | **එස්.එන්.අත්තනායක මෙය**<br>අතිරේක ලේකම් (වැවිලි කර්මාන්ත නවීකරණ සහ විවිධාංගීකරණ)<br>වැවිලි කර්මාන්ත සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය | සාමාජික | 2025.01.07 | මේ දක්වා |
| **9.** | **ටී.එම්.එස්.බී.ජයසුන්දර මහතා**<br>අතිරේක ලේකම් (සංවර්ධන)<br>ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ ගුවන් සේවා අමාත්‍යාංශය | සාමාජික | 2024.04.18 | මේ දක්වා |
| **10.** | **එච්.ටී.ආර්.නාලිකා පියසේන මෙය**<br>අතිරේක ලේකම් (සංවර්ධන II)<br>ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය | සාමාජික | 2025.01.07 | මේ දක්වා |

| | | | | |
|---|---|---|---|---|
| **11.** | **ජේ.එම්.තිලකරත්න බණ්ඩා මහතා**<br>අතිරේක ලේකම් (ප්‍රතිපත්ති)<br>වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය | සාමාජික | 2025.02.11 | 2025.06.26 |
| **12.** | **එන්.බී.කරුණාරත්න මහතා**<br>අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී<br>සිලෝන් බිස්කට් සමාගම | සාමාජික | 2024.10.15 | මේ දක්වා |
| **13.** | **එච්.ටී.චමින්ද මහතා**<br>උප සභාපති (මානව සම්පත්)<br>සියැට් ශ්‍රී ලංකා | සාමාජික | 2024.10.15 | මේ දක්වා |
| **14.** | **සී.උඩවත්ත මහතා**<br>සමාගම් අධ්‍යක්ෂ<br>හේලීස් ට්‍රැවල්ස් ඇන්ඩ් ඒවියේෂන් සමාගම | සාමාජික | 2024.10.15 | මේ දක්වා |
| **15.** | **බී.ලියනගේ මහතා**<br>සමූහ අධ්‍යක්ෂ<br>හේලීස් ඇඩ්වාන්ටිස් සමාගම | සාමාජික | 2024.10.15 | මේ දක්වා |
| **16.** | **එච්.අශ්රෆ් මහතා**<br>කළමනාකරණ අධ්‍යක්ෂ<br>ෆැන්ටේසියා ඉලාස්ටික්ස් (පුද්ගලික) සමාගම | සාමාජික | 2024.10.15 | මේ දක්වා |
| **17.** | **ආචාර්ය (ඉංජිනේරු) එන්.සී.සපුමානගේ මහතා**<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මෙහෙයුම්)<br>ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව | සාමාජික | 2024.10.15 | මේ දක්වා |

## ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්ය මණ්ඩලය 2024

| | | | |
|---|---|---|---|
| 1. | සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී | ආචාර්ය කිංග්ස්ලි බර්නාඩ් | [2024.10.15දක්වා] |
| | | මංගල විජේසිංහ මහතා | [2024.10.16 සිට] |
| 2. | වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල් | පී.වී.ඒ.එම්.බැද්දෙගමගේ මිය | [2024.02.02දක්වා] |
| | අධ්‍යක්ෂ ජනරාල් | චම්පිකා ඩී.ධර්මසේන මෙය | [2024.08.12 සිට]<br>[2025.08.21දක්වා] |
| 3. | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - මූල්‍ය සහ පරිපාලන | එස්.ආර්.පී.ඉන්ද්‍රකීර්ති මහතා | [2024.04.30දක්වා] |
| 4. | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - සංවර්ධන | පී.වී.ඒ.එම්.බැද්දෙගමගේ මෙය | [2024.02.02දක්වා] |
| | වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - සංවර්ධන | අනෝමා ප්‍රේමතිලක මෙය | [2024.02.03 සිට] |
| | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - සංවර්ධන | අනෝමා ප්‍රේමතිලක මෙය | [2024.07.22 සිට]<br>[2025.06.13දක්වා] |
| 5. | අධ්‍යක්ෂ - වෙළඳපොළ සංවර්ධන | අනෝමා ප්‍රේමතිලක මෙය | [2024.07.21දක්වා] |
| | වැඩ බලන අධ්‍යක්ෂ - වෙළඳපොළ සංවර්ධන | කේ.කේ.එස්.කන්නන්ගර මෙය | [2024.08.01 සිට] |
| 6 | අධ්‍යක්ෂ - ප්‍රාදේශීය සංවර්ධන | සේපාලිකා ජයවර්ධන මෙය | [2024.10.01දක්වා] |
| | වැඩ බලන අධ්‍යක්ෂ - ප්‍රාදේශීය සංවර්ධන | ඩී.එම්.පී.දිසානායක මහතා | [2024.10.02 සිට] |
| 7. | අධ්‍යක්ෂ - ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායික සැලසුම් | ඕ.එම්.සී.කුමුදුනී මෙය | |
| | වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ ජනරාල්- සංවර්ධන | | [2025.06.26 සිට] |
| 8. | අධ්‍යක්ෂ - අපනයන සේවා | එල්.වයි.ආර්.අයි. කොඩිකාර මෙය | |
| 9. | අධ්‍යක්ෂ - මූල්‍ය | කේ.ඩී.පෙරේරා මහතා | |
| 10. | අධ්‍යක්ෂ - අපනයන කෘෂිකර්ම | ජේ.එස්.බඳුගම මහතා | |
| 11 | අධ්‍යක්ෂ - නීති | තක්ෂිලා විජේරත්න මෙය | [2024.07.04 සිට] |
| 12. | වැඩ බලන අධ්‍යක්ෂ - තොරතුරු තාක්ෂණ | ඩී.කේ.ඩී.එස්.සිසිල් මහතා | [2020.03.20 සිට] |
| 13. | වැඩ බලන අධ්‍යක්ෂ - කාර්මික නිෂ්පාදන | මනෝජා දිසානායක මෙය | [2024.04.30දක්වා] |
| | අධ්‍යක්ෂ - කාර්මික නිෂ්පාදන | මනෝජා දිසානායක මෙය | [2024.05.01 සිට] |
| 14. | වැඩ බලන අධ්‍යක්ෂ - මානව සම්පත් කළමනාකරණ | යූ.අක්මීමන මහතා | [2024.05.01දක්වා] |
| | අධ්‍යක්ෂ - මානව සම්පත් කළමනාකරණ | රිකා ගෆූර් මෙය | [2024.05.02 සිට] |
| 15. | වැඩ බලන අධ්‍යක්ෂ - වෙළඳාම සඳහා පහසුකම් සැලසීම සහ වෙළඳ තොරතුරු | අචිනි වීරවර්ධන මෙය | [2024.04.30දක්වා] |
| | අධ්‍යක්ෂ - වෙළඳාම සඳහා පහසුකම් සැලසීම සහ වෙළඳ තොරතුරු | ආචාර්ය සංජීව රත්නසේකර | [2024.05.01 සිට] |
| 16. | අභ්‍යන්තර විගණක | නිල්මිණී රණසිංහ මෙය | [2024.06.24 දක්වා] |
| | | තක්ෂිල හෙට්ටිආරච්චි මහතා | [2025.02.04 සිට] |

# අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්ය මණ්ඩලයේ විස්තර

# අධ්‍යක්ෂ මණ්ඩලය

**මංගල විජේසිංහ මහතා - සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී**

ඖෂධ, රසායනික ද්‍රව්‍ය, පාරිභෝගික සහ ඉලෙක්ට්‍රොනික් භාණ්ඩ, කාර්මික ඉංජිනේරු විසඳුම්, සහ ජංගම දුරකතන සහ විදුලි සංදේශ කටයුතු ඇතුළුව විවිධ ක්ෂේත්‍රවල ජ්‍යෙෂ්ඨ සහ ඉහළ කළමනාකාරිත්ව තනතුරුවල වසර 25කට අධික පලපුරුද්දක් සහිත මංගල විජේසිංහ මහතා ශ්‍රී ලංකාවේ ආයතනික ක්ෂේත්‍රය තුළ ප්‍රමුඛ නායකයෙකි. ආයතනික කාර්යක්ෂමතාවය සහ ව්‍යාපාරික වර්ධනය සඳහා විවිධ ව්‍යාපාරික ක්ෂේත්‍ර තුළ සුප්‍රසිද්ධ සන්නාමවලට අදාළ ජාත්‍යන්තර සැපයුම්කරුවන් සමඟ මොහු සාර්ථකව කටයුතු කළමනාකරණය කර තිබේ.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ මූලික උපාධියක් දරන මොහුට ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියක් ද හිමි ය. ව්‍යාපාරික කළමනාකරණය සහ ආයතනික ක්‍රමෝපාය පිළිබඳ සිය දක්ෂතා තවදුරටත් සවිමත් කරගනිමින් මෙරට සිටින වරලත් වෘත්තීය කළමනාකරුවෙකු ද වේ. තිරසර සාර්ථකත්වය කරා ආයතන මෙහෙයවීම පිණිස අවශ්‍ය විශේෂඥ දැනුමෙන් සන්නද්ධ වීම පිණිස අවශ්‍ය කරන අධ්‍යාපනික සුදුසුකම් සමඟින් පුළුල් ආයතනික අත්දැකීම් ද මොහු සතු ය.

2021 සිට 2023 වර්ෂය දක්වා විජේසිංහ මහතා පශු වෛද්‍ය ආනයනකරුවන්ගේ සහ නිෂ්පාදක යන්ගේ සංගමයේ (VIMA) සභාපති වශයෙන් කටයුතු කළ අතර, එකී ක්ෂේත්‍රය තුළ ප්‍රමිතීන් ඉහළ නංවාලීම පිණිස මොහුගේ නායකත්වය තුළින් ප්‍රමුඛතම කාර්යභාරයක් සිදුකරන ලදී. පාඩු ලබන ව්‍යාපාර එකී තත්ත්වයෙන් මුදාගෙන කෙටි කාල සීමාවක් තුළ ලාභදායි තත්ත්වයට පත්කිරීම උදෙසා මඟ පෙන්වීම සඳහා මොහු සතු හැකියාව ක්ෂේත්‍රය තුළ ප්‍රකට ය. තව ද, මොහු අපනයන සංවර්ධනයට අදාළ බොහෝ දේශීය සහ ජාත්‍යන්තර සංවිධාන සමඟ සක්‍රිය ආකාරයෙන් සම්බන්ධවී සිටින අතර, එමඟින් ක්ෂේත්‍රය තුළ සිය බලපෑම තවදුරටත් පුළුල් කරගැනීමේ හැකියාව සතු ය. ආයතනික වශයෙන් ලබා ඇති සාර්ථකත්වයන්ට වැඩිමනක් වශයෙන්, සිය දූරදර්ශී නායකත්වය සහ ආයතනික සාර්ථකත්වය සඳහා ඇති කැපවීම සම්බන්ධයෙන් මොහු පිළිගැනීමට ලක්වී ඇත.

ශ්‍රී ලංකාවේ අපනයන ක්ෂේත්‍රය වැඩිදියුණු කිරීමට සහ ගෝලීය වෙළඳ සබඳතා සවිමත් කිරීම පිණිස සිය දැනුම් සම්භාරය සහ විශේෂඥතාවය උපයෝගී කරගැනීමේ මනා අවස්ථාවක් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ සභාපති වශයෙන් වූ නව භූමිකාව ඔස්සේ විජේසිංහ මහතා වෙත ලැබී ඇත.

**රේණුකා එම් වීරකෝන් මෙය**
**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික**

ඍජු විදේශ ආයෝජන ව්‍යාපෘති සඳහා පහසුකම් සැලසීමේ පුළුල් අත්දැකීම් සහ දැනුමෙන් හෙබි රේණුකා එම්.වීරකෝන් මෙය ජ්‍යෙෂ්ඨ නිලධාරිනියකි. වසර 35කට අධික ඇයගේ වෘත්තීය කාලසීමාව තුළ ඇය වර්තමානයේ දී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් (වැඩ බලන) තනතුර හොබවනු ලබයි.

නීතිඥ, ප්‍රසිද්ධ නොතාරිස් සහ දිවුරුම් කොමසාරිස්වරියක වන වීරකොන් මෙය කොළඹ පිහිටි ප්‍රසිද්ධ නීතිඥ සමාගමක උපදේශන නීතිඥවරියක ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කරන ලදී. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙන් ව්‍යාපාරික පරිපාලනය පිළිබඳ ලබාගත් පශ්චාත් උපාධියක් ද මැයගේ අධ්‍යයන කුසලතාවලට ඇතුළත් ය.

ජාත්‍යන්තර වාණිජ මණ්ඩලයේ (ICC) මෙන්ම ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක වශයෙන් ඇය දැනට කටයුතු කරනු ලැබේ. අධ්‍යාපන, බලශක්ති සහ පරිසර ඇතුළු ඉතා වැදගත් ක්ෂේත්‍ර ගණනාවක ව්‍යාපෘති අනුමත කිරීමේ කමිටුවල කටයුතුවල ද ඇය සක්‍රීය වශයෙන් නියැලී සිටී. මෙහෙයුම් කමිටු, ප්‍රතිපත්ති කමිටු සහ අන්තර් නියෝජිතායතන කමිටු සඳහා සහභාගිත්වය ලබාදීමේ කාර්යයේ ද නියැලෙමින් ආයෝජකයන් මුහුණ දෙන ගැටලු විසඳීමට සහ ආයෝජන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා ද ඇය විසින් දායකත්වය ලබාදේ.

**ඊ.එම්.එස්.බී.ජයසුන්දර මහතා**

**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික**

ප්‍රතිපත්ති සංවර්ධනය, නායකත්වය සහ ප්‍රජා සංවර්ධනය වැනි ක්ෂේත්‍ර තුළ පෘථුල අත්දැකීම් සම්භාරයක් සමඟින් රාජ්‍ය සේවයේ වසර 24කට වැඩි කාලසීමාවක් නියැලී සිටින ජයසුන්දර මහතා රාජ්‍ය පරිපාලන සේවයේ කීර්තිමත් වෘත්තිකයෙකි.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස්වරයෙකු වශයෙන් 2001 වර්ෂයේ දී පළමු පත්වීම ලැබී ඇති මොහු ඉන් අනතුරුව, ස්ථාන කිහිපයක ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සහකාර ලේකම්, සහකාර ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් වශයෙන් ද, ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පාලකවරයෙකු ලෙස ද, ඉන් අනතුරුව අමාත්‍යාංශ කිහිපයක අතිරේක ලේකම්, වැ.බ. ලේකම් වශයෙන් ද කටයුතු කර ඇත. ජයසුන්දර මහතා දැනට වරාය, නාවික සහ ගුවන් සේවා අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (සංවර්ධන) ලෙස කටයුතු කරනු ලැබේ.

රුහුණ විශ්වවිද්‍යාලයේ වාණිජ විද්‍යා උපාධිය සහ කැලණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපති උපාධියක් හිමි මොහු ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනනයේ පරිපාලන නීතිය පිළිබඳ ඩිප්ලෝමාව ද හදාරා තිබේ.

**යූ.එන්.මල්ලවාරච්චි මහතා**

**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික**

**- භාණ්ඩාගාර නියෝජිත**

2002 වර්ෂයේ දී රාජ්‍ය සේවයට එක් වූ යූ.එන්.මල්ලවආරච්චි මහතා ශ්‍රී ලංකා සැලසුම් සේවයේ නිලධාරියෙකි. මොහු දැනට මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් කටයුතු කරනු ලැබේ.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදී (භෞතික විද්‍යා) උපාධිධාරියෙකු වන මල්ලවාරච්චි මහතා මොරටුව විශ්වවිද්‍යාලයෙන් ප්‍රවාහනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සහ කැලණිය විශ්වවිද්‍යාලයේ මූල්‍ය ආර්ථික පශ්චාත් උපාධිය ද හදාරා තිබේ.

රාජ්‍ය සේවයේ විවිධ තනතුරුවල වසර 23කට අධික කාලයක් සේවය කර ලබා ඇති අත්දැකීම් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය වෙත රැගෙන එන මොහු දැනට මෙම මණ්ඩලයේ සහ ලංකා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස කටයුතු කරනු ලැබේ. ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාව, දුරස්ථ ඉගැනුම් මධ්‍යස්ථානය, සහ වෘත්තිය පුහුණු අධිකාරිය ආදී වශයෙන් වූ ආයතනවල මොහු මීට පෙර අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස කටයුතු කර තිබේ.

**එච්.ටී.ආර්.නාලිකා පියසේන**

**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික**

රාජ්‍ය සේවයේ වසර 24කට වැඩි අත්දැකීම් දරන එච්.ටී.ආර්.නාලිකා පියසේන මෙය ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරිනියකි. ඇය දැනට ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීම් අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (ග්‍රාමීය සංවර්ධන) ධූරයේ කටයුතු කරනු ලැබේ.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රවේදී උපාධියක් හිමි පියසේන මෙය කැලණිය විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධියක් ද හදාරා තිබේ.

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීම් අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (ග්‍රාමීය සංවර්ධන) ධූරය හෙබවීමට පෙර, මැය විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල කිහිපයක අතිරේක ප්‍රාදේශීය ලේකම්, දෙහිඕවිට සහ කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ප්‍රාදේශීය ලේකම්, ග්‍රාම ශක්ති සංවර්ධන කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්, වෙනත් අමාත්‍යාංශ කිහිපයක අතිරේක ලේකම් වශයෙන් රාජ්‍ය සේවය තුළ විවිධ තනතුරු හොබවා තිබෙන අතර මෙමඟින් රාජ්‍ය සේවයේ විවිධ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ඇයගේ දැනුම සහ අත්දැකීම් සම්භාරය පෝෂණය කර තිබේ.

රාජ්‍ය පරිපාලනය ආශ්‍රිත ගැටලු සම්බන්ධයෙන් පුළුල් අත්දැකීම් ලබාගැනීමට අවස්ථාවක් හිමිකර ගනිමින් රාජකාරි සම්බන්ධිත විවිධ දේශීය සහ අන්තර්ජාතික වැඩසටහන් සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ රාජකාරි තුළ මැය සහභාගීවී තිබේ.

**එස්.නිලන්ති අත්තනායක මෙය**

**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික**

2003 වර්ෂයේ දී රාජ්‍ය සේවයට එක් වූ එස්.නිලන්ති අත්තනායක මෙය ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරිනියකි. ඇය දැනට වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (වැවිලි කර්මාන්තය නවීකරණය සහ විවිධාංගිකරණය) ධූරයේ කටයුතු කරනු ලැබේ.

මැය පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් විද්‍යාවේදී උපාධිය සහ කොළඹ විශ්වවිද්‍යාලයෙන් තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය හිමිකරන ගෙන තිබේ. ජර්මනියේ ඩොර්ට්මුන්ඩ් විශ්වවිද්‍යාලය සහ පිලිපීන විශ්වවිද්‍යාලය විසින් ඒකාබද්ධව පිරිනමන කලාපීය සංවර්ධන සැලසුම්කරණය පිළිබඳ විද්‍යාපති උපාධියක් ද මැය හිමිකර ගෙන ඇත.

භාණ්ඩාගාර දෙපාර්තමේන්තු දෙකක සහකාර අධ්‍යක්ෂවරියක වශයෙන්, වැවිලි අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (සංවර්ධන), කළුබෝවිටියාන ටී ෆැක්ටරි ලිමිටඩ්හි කළමනාකරණ අධ්‍යක්ෂ (වැ.බ), පොල් වගා කිරීමේ මණ්ඩලයේ සාමාන්‍යාධිකාරි (වැ.බ) සහ පොල් සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ) වශයෙන් රාජ්‍ය සේවයේ විවිධ වූ තනතුරුවල වසර 22කට වැඩි අත්දැකීම් මැය ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය වෙත රැගෙන එනු ලැබේ. එසේම, ඇය උක් පර්යේෂණ ආයතනය, පොල් පර්යේෂණ ආයතනය, ජාතික පරිසර සභාව සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව යන ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක් වශයෙන් ද කටයුතු කර ඇත.

දේශීය මෙන්ම ජාත්‍යන්තර වශයෙන් විවිධ පාඨමාලා හැදෑරීම සහ විවිධ විෂයයන්ට අදාළව ශ්‍රී ලංකා දූත පිරිස් නියෝජනය කිරීම ඔස්සේ මැයගේ දැනුම සහ අත්දැකීම් තවදුරටත් පුළුල් වී තිබේ.

**නලින් බී.කරුණාරත්න මහතා**

**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික**

ශ්‍රී ලංකාවේ පුද්ගලික අංශයේ ප්‍රමුඛතම ව්‍යාපාරික ආයතනවල වසර 35 කට අධික කීර්තිමත් සේවා කාල සීමාව ඔස්සේ නලින් බී.කරුණාරත්න මහතා සතුව දේශීය සහ අන්තර්ජාතික වෙළඳපොළවල් පිළිබඳ පුළුල් දැනුමක් සතු ය. රජයේ පුළුල් අරමුණු සමඟින් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ ඉලක්ක සම්බන්ධකරලීම උදෙසා අවශ්‍ය විශේෂඥ දැනුම මොහු විසින් මණ්ඩලය වෙත රැගෙන එනු ලැබේ.

මොහු එක්සත් රාජධානියේ වරලත් අලෙවිකරුවන්ගේ ආයතනයේ සහ වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ සාමාජික යෙකි. එසේම ස්විට්සර්ලන්තයේ අයිඑම්ඩී බිසිනස් ස්කූල්, ඇමරිකා එක්සත් ජනපදයේ හාවඩ් බිසිනස් ස්කූල් සහ පිලිපීනයේ ඒෂියන් ඉන්ස්ටිට්යුට් ඔෆ් මැනේජ්මන්ට්හි වැනි කීර්තිමත් ආයතනවලින් විධායක අධ්‍යාපන වැඩසටහන් කිහිපයක් ද මොහු විසින් සම්පූර්ණ කර තිබේ.

සිලෝන් බිස්කට්ස් ලිමිටඩ් සහ සීබීඑල් එක්ස්පෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන ආයතනවල අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරි වශයෙන් මොහු දැනට කටයුතු කරන අතර, සීබීඑල් ෆුඩ්ස් ඉන්ටර්නැෂනල් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් ද කටයුතු කරනු ලැබේ. සීබීඑල් වෙස්ට් ඇෆ්රිකා (ඝානා) ලිමිටඩ්, ජ්ලෙන්ටි ෆුඩ්ස් ඉන්දියා එල්එල්පී සහ සිලෝන් බිස්කට්ස් බංග්ලාදේශ් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමූහයේ විදේශ සමාගම්හි කළමනාකරණ කටයුතු සඳහා ද සක්‍රිය අයුරින් දායකත්වය දරනු ලැබේ.

කරුණාරත්න මහතා ඔරියන්ට් ෆයිනෑන්ස් පීඑල්සී ආයතනයේ විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස ද දැනට කටයුතු කරන අතර, ලංකා සේවක සම්මේලනයේ සභා සාමාජිකයෙකු වශයෙන් ද කටයුතු කරනු ලැබේ.

කළමනාකරණ ගණකාධිකාරවරුන්ගේ වරලත් ආයතනය විසින් 2021වර්ෂයේ දී සිදුකළ TOP 50 CIMA Business Icon and Trailblazers අතරට කරුණාරත්න ද මහතාද තේරී සිටි අතර, එය මොහුගේ සුවිශේෂී වෘත්තීමය ජයග්‍රහණයක් ලෙස සැලකිය හැකි ය.

**බිනූප ලියනගේ මහතා**
**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික**

2000 වර්ෂයේ දී හේලීස් ඇඩ්වාන්ටිස් ලිමිටඩ් වෙතින් සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළ බිනූප ලියනගේ මහතා, ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ව්‍යාපාරික සමූහ සමාගමක් වශයෙන් ඇති හේලීස් සමූහයේ විවිධ සමාගම්වල ක්‍රමක්‍රමයෙන් ඉහළ වගකීම් දරා 2024 වර්ෂයේ අප්‍රේල් මස සිට හේලීස් ඇඩ්වාන්ටිස් ලිමිටඩ්හි සමූහ අධ්‍යක්ෂ ලෙස පත්වී තිබේ. විවිධ මට්ටමේ කළමනාකරණ තනතුරු වසර 24 කට අධික කාලයක් දැරීම ඔස්සේ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්, සැපයුම්දාම මෙහෙයුම් ආදී කටයුතු ආශ්‍රිතව ශ්‍රී ලංකාව තුළ මෙන්ම ඉන් බැහැරව ද විවිධ වූ අත්දැකීම් සමුදායක් මොහු සතු ය.

ඕස්ට්‍රේලියාවේ,මෙල්බර්න්හි, රෝයල් මෙල්බර්න් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි වෙතින් සයිබර් සිකියුරිටි පිළිබඳ උපාධි සහතිකපත්‍රයක් ලබා ඇති ලියනගේ මහතා දැනට එම ආයතනයේම සයිබර් සිකියුරිටි පිළිබඳ පශ්චාත් උපාධියක් හදාරමින් සිටී. තාක්ෂණ කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සහ මොරටුව විශ්වවිද්‍යාලයේ සිවිල් ඉංජිනේරු විද්‍යාවේදී උපාධියක් ද මොහු හිමිකර ගෙන ඇත. මොහු විසින් ඇමරිකා එක්සත් ජනපදයේ ව්‍යාපෘති කළමනාකරණ ආයතනය වෙතින් ව්‍යාපෘති කළමනාකරණ වෘත්තියෙකු (PMP) ලෙස සහ කළමනාකරණ ගණකාධිකාරවරුන්ගේ වරලත් ආයතනය වෙතින් සහතිකකරණයක් හිමිකර ගෙන ඇත.

**එච්.තුෂාර චමින්ද මහතා**
**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික**

එච්. තුෂාර චමින්ද මහතා දැනට සියැට් ශ්‍රී ලංකා සමාගමේ උප සභාපති (මානව සම්පත්) වශයෙන් කටයුතු කරනු ලැබේ. සේවක බඳවාගැනීම් සහ රඳවාගැනීම, කාර්ය මණ්ඩල සංවර්ධනය, බේරුම්කරණ, අර්බුද විසඳීම, ප්‍රතිලාභ සහ වන්දි ඇතුළු මානව සම්පත් පිළිබඳ පුළුල් පසුබිමක් සහිතව මානව සම්පත් කළමනාකරණය ක්ෂේත්‍රයේ වසර 25කට වැඩි අත්දැකීම් සමඟ ප්‍රශංසනීය කාර්යසාධනයක් මොහු සතු ය.

1998 වර්ෂයේ දී පර්යේෂණ සහකාරවරයෙකු ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළ මොහු ඉතාමත් කෙටි කාලයකින් මානව සම්පත් ක්ෂේත්‍රය වෙත සිය වෘත්තීය භූමිකාව පුළුල් කරන ලදී. 1999 වර්ෂයේ දී ඕෂන් ලංකා ප්‍රයිවට් ලිමිටඩ්හි ජ්‍යෙෂ්ඨ කළමනාකරු - මානව සම්පත් තනතුරට එක්වූ මොහු ඉන් අනතුරුව 2010 -2017 දක්වා කාලසීමාව තුළ රිචඩ් පීරිස් (ආර්පිකෝ) සමූහයේ මානව සම්පත් ප්‍රධානී වශයෙන් කටයුතු කරන ලදී.

ඕස්ට්‍රේලියාවේ මොනෑෂ් විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ ගෞරව උපාධිධාරියෙකු වන මොහු එක්සත් රාජධානියේ මැන්චෙස්ටර් මෙට්රෝපොලිටන් විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියක් ද හිමිකර ගෙන ඇත.

**ඉංජිනේරු එන්.සී. සපුමානගේ මහතා**
**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික**

ඉංජිනේරු සපුමානගේ මහතා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිසමේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මෙහෙයුම්) ලෙස 2023 සැප්තැම්බර් මාසයේ සිට කටයුතු කරන අතර, කොමිසමේ කාර්යයන් කාර්යක්ෂම අයුරින් ඉටුකිරීම සහතික කරමින් කොමිසමේ මූල්‍ය, මානව සම්පත්, තොරතුරු තාක්ෂණ, අනුකූලතා සහ පර්යේෂණ යන අංශවල කටයුතු අධීක්ෂණය සිදුකරනු ලැබේ. මෙම තනතුරට පත්වීමට පෙර මොහු එහි අධ්‍යක්ෂ (නියාමන අංශය) තනතුරෙහි රාජකාරි ඉටු කරන ලදී.

මොහු විදුලි ඉංජිනේරු විද්‍යාවේදී උපාධිධාරියෙකු වන අතර, විදුලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද හිමිකර ගෙන සිටී. තව ද, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ ඉහළ විද්‍යාපති උපාධියක් ද හිමිකර ගෙන තිබේ. 2020 වර්ෂයේ දී මොහු විසින් ආචාර්ය උපාධිය ලබාගන්නා ලදී.

**සී.උඩවත්ත මහතා**

**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික**

හේලීස් සමූහ ව්‍යාපාරයේ සංචාරක සහ ගුවන් සේවා අංශවල විවිධ ව්‍යාපාරික මෙහෙයුම්වල වසර 30කට අධික පුළුල් අත්දැකීම් උඩවත්ත මහතා විසින් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය වෙත ගෙන එනු ලැබේ. විවිධ අංශවල කටයුතුවල නිරතවීම ඔස්සේ සිය අත්දැකීම් වැඩිදියුණු කරගෙන ඇති උඩවත්ත මහතා, ක්‍රමෝපායික ව්‍යාපාර සැලසුම්කරණය, ව්‍යාපෘති සැලසුම්කරණය සහ ක්‍රියාත්මක කිරීම, වෙළඳපොළ විශ්ලේෂණය සහ පර්යේෂණ, නායකත්වය හා සාමූහික කළමනාකරණය වැනි ක්ෂේත්‍රවලට අදාළ මූලික නිපුණතා සතු කරගෙන සිටී.

මොහු දැනට හේලීස් ට්‍රැවල්ස් සහ ඒවියේෂන්හි අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරනු ලැබේ.

**එච්.අස්රෆ් මහතා**

**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික**

1989 වර්ෂයේ දී ස්ථාපිත කරනු ලැබූ ෆැන්ටාසියා ඉලාස්ටික් (ප්‍රයිවට්) ලිමිටඩ් හි ආරම්භකයෙකු/ කළමනාකරණ අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කරන ලදී. 2000 වර්ෂයේ දී එම සමාගමට ආයෝජන මණ්ඩලය විසින් විසින් අනුමත යන තත්ත්වය ලබාගැනීම සඳහා ද වගකීම දරන ලදී. මොහුගේ මුල් වෘත්තීය කාලසීමාව තුළ පවුලේ සමාගමක් වෙත බැඳුනු අතර, ගොතන ලද, වියන ලද ඉලාස්ටික් මේස් සහ ගොතන ලද රෙදි නිෂ්පාදනය කිරීම කළමනාකරණය කරන ලදී.

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ජාතික පර්යේෂණ හා සංවර්ධන සහ තාක්ෂණික සේවා සැපයුම්කරු වන කාර්මික තාක්ෂණ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් ද මොහු කටයුතු කරනු ලැබේ. ලංකා බැංකුවේ පරිපාලිත සමාගමක් වන බීඕසී ප්‍රොපර්ටි ඩෙවලොප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් ද කටයුතු කරනු ලැබේ.

2003 වර්ෂයේ දී රෙදිපිළි සහ උපාංග නිෂ්පාදකයන්ගේ සංගමය (FAAMA) පිහිටුවීම සඳහා පුරෝගාමී වූ අස්රෆ් මහතා එහි ලේකම් වශයෙන් වසර 10කට වැඩි කාලයක් කටයුතු කරන ලදී. ජාත්‍යන්තර වශයෙන් පැවති විවිධ වෙළඳ ප්‍රදර්ශන සඳහා මොහු සහභාගී වී ඇති අතර, එමගින් අපනයන සංවර්ධනය සහ ප්‍රවර්ධනය ආශ්‍රිත කරුණු සම්බන්ධයෙන් පුළුල් අත්දැකීම් ලබාගැනීමට හැකිවී ඇත. මොහු 2019 වර්ෂයේ සිට ෆැන්ටාසියා නැරෝ ෆැබ්රික් (ප්‍රයිවට්) ලිමිටඩ්හි අධ්‍යක්ෂ (මෙහෙයුම්) වශයෙන් කටයුතු කරනු ලැබේ.

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්ය මණ්ඩලය

**චම්පිකා ඩී.ධර්මසේන මෙය**

**අධ්‍යක්ෂ ජනරාල්**

ප්‍රතිපත්ති සම්පාදනය, සංවර්ධනය, ව්‍යාපෘති අධීක්ෂණය, සහ පරිපාලන සහ කළමනාකරණය පිළිබඳ දශක දෙකකට අධික අත්දැකීම් සතු චම්පිකා දිල්රුක්ෂි ධර්මසේන මෙය වර්තමානයේ දී අධ්‍යක්ෂ ජනරාල් ධූරයේ කටයුතු කරමින් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ (I ශ්‍රේණිය) මනා නිපුණත්වයෙන් හෙබි වෘත්තිකයෙකු ලෙස ඇයගේ විශේෂඥ දැනුම සහ නායකත්වය ශ්‍රී ලංකා අපනයන සංවර්ධනය මණ්ඩලය වෙත රැගෙන එනු ලැබේ.

ටෝකියෝහි, වෙසේඩා විශ්වවිද්‍යාලයේ, වෙසේඩා බිස්නස් ස්කූල් වෙතින් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියක් සහ කොළඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් ඇය හිමිකර ගෙන තිබේ. ඇය කැළණිය විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ආචාර්ය උපාධියක් දැනට හදාරමින් සිටී. ඇයගේ සවිමත් අධ්‍යාපනික පදනම ඉංග්‍රීසි, පරිපාලන සහ කළමනාකරණ ක්ෂේත්‍රවල බහුවිධ ඩිප්ලෝමා සමඟින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම විද්‍යාවේදී උපාධියකින් (ආහාර විද්‍යාව සහ තාක්ෂණය පිළිබඳ විශේෂඥතාවය සහිතව) සමන්විතය.

කෘෂිකර්ම අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (සංවර්ධන) සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම් යන ප්‍රධාන තනතුරු ඇය විසින් දරා තිබේ. දකුණු කොරියාව, මැලේසියාව සහ තායිලන්තය වැනි රටවල දී ලද පුහුණුව සමඟින් ග්‍රාමීය සංවර්ධනය, ඩිජිටල් කෘෂිකර්ම තාක්ෂණය, සහ මනා කෘෂිකාර්මික පරිචයන් (GAP) වැනි ක්ෂේත්‍ර ඔස්සේ ඇයගේ නායකත්ව හැකියාවන් ව්‍යාප්ත වී තිබේ.

සහකාර ප්‍රාදේශීය ලේකම්වරියක සහ සහකාර අධ්‍යක්ෂවරියක ලෙස රාජ්‍ය අංශය තුළ සහ තත්ත්ව සහතික කිරීමේ විධායකයෙකු ලෙස පුද්ගලික අංශය තුළ ඇයගේ රාජකාරි කාල සීමාවන් වනාහී රජයේ සහ කර්මාන්ත අංශයේ අභිවෘද්ධිය කාර්යක්ෂම අයුරින් එකිනෙක සම්බන්ධ කිරීම සඳහා ඇය සතු හැකියාව පිළිබඳ සාක්ෂියකි.

**අනෝමා ප්‍රේමතිලක මෙය**

**අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන)**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය තුළ වසර 31 කට අධික වෘත්තීය පලපුරුද්දක් අනෝමා ප්‍රේමතිලක මෙය සතු අතර මෙම කාල සීමාව තුළ ශ්‍රී ලංකාවේ නිෂ්පාදන සඳහා වෙළඳපොළ සංවර්ධනය සහ අපනයන ප්‍රවර්ධනය පිළිබඳ විශේෂඥවරියක වශයෙන් ඇය සිය ස්ථාවරත්වය ගොඩනංවා ගෙන සිටී. ජාත්‍යන්තර වෙළඳපොළ තුළ ශ්‍රී ලංකාවේ තරඟකාරිත්වය වැඩිදියුණු කිරීම අරමුණු කරගත් ක්‍රමෝපායික ප්‍රයත්නයන් තුළින් ඇයගේ පුළුල් රාජකාරි ස්වභාවය නිරූපණය කෙරේ

අපනයන සංවර්ධන වැඩසටහන් සැලසුම්කරණය, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය ඇතුළුව පුළුල් පරාසයක කාර්යයන් ඇයගේ වගකීම්වලට ඇතුළත් වේ. ශ්‍රී ලංකාවේ අපනයන නිෂ්පාදන අපනයන වෙළඳපොළට ප්‍රවේශ කරවීමේ අවශ්‍යතා සැලකිල්ලට ගෙන ඉතා වැදගත් නිර්දේශ සැපයීම, පුළුල් වෙළඳපොළ පර්යේෂණ සිදුකිරීම සහ ජාත්‍යන්තර සංවිධාන සහ වෙළඳ ප්‍රවර්ධන සංවිධාන සමඟ සහයෝගිතාවයන් වැඩිදියුණු කරගැනීම ඇය විසින් සිදුකර තිබේ. මීට අමතරව, ප්‍රේමතිලක මෙය විසින් ජාතික අපනයන සන්නාම මූලාරම්භය සහ අපනයන කරුවන්ට ඔවුන් ජාත්‍යන්තරය වෙත ප්‍රවේශවීමේ දී සහාය ලබාදීම පිණිස සැලසුම් කරන මූල්‍ය සහාය යෝජනා ක්‍රම සම්පාදනය සහ කළමනාකරණය සඳහා ද නායකත්වය ලබාදී ඇත.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙන් ලබාගත් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය, කාර්මික කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය, සහ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙතින් ලබාගත් ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ ඩිප්ලෝමාවක් ඇයගේ අධ්‍යාපනික සුදුසුකම්වලට ඇතුළත් ය.

**කුමුදුනී මුදලිගේ මෙය**

**අධ්‍යක්ෂ - ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායික සැලසුම්**

ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායික සැලසුම්කරණය, ධීවර සහ ජලජීවී වගාව, ජාත්‍යන්තර මුහුදු ආහාර වෙළඳාම, අලෙවිකරණය, ව්‍යාපෘති සම්බන්ධීකරණය, සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය යන ක්ෂේත්‍රවල විවිධාංගකෘත වෘත්තීය විශේෂඥ දැනුමක් කුමුදුනී මුදලිගේ මෙය සතු වන අතර, විවිධ වූ සංස්කෘතීන් අතර සහයෝගිතාවයන් ගොඩනැංවීම සඳහා ඇති කැමැත්ත සහ ගෝලීය සංදර්භයක් තුළ සුවිශේෂී ප්‍රතිඵල ලබාදීම සඳහා සනාථ කළ හැකියාව ද ඇය සතු ය.

2005 වර්ෂයේ දී ජලජීවී වගා සහ ධීවර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය සහ 1995 වර්ෂයේ දී දෙවන පෙළ පහළ සාමාර්ථයක් සමඟ විද්‍යාවේදී උපාධිය කැළණිය විශ්වවිද්‍යාලයෙන් හිමිකර ගෙන තිබේ. ඇයගේ පර්යේෂණ කාර්යයන් මනා පිළිගැනීමකට ලක්වී ඇති අතර, ජාත්‍යන්තර වශයෙන් ප්‍රකාශයට පත්කර තිබේ.

ඇය දැනට අධ්‍යක්ෂ - ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායික සැලසුම් ලෙස කටයුතු කරන අතර, මීට අමතරව වැ.බ. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - සංවර්ධන තනතුරෙහි ද 2025 ජූනි 26 වැනි දින සිට කටයුතු කරනු ලැබේ. රජය හරහා ලෝක බැංකු මූල්‍ය සහාය යටතේ වැඩි දියුණු කළ අගය එකතු කිරීම් සහ ක්‍රියාවලි වැඩිදියුණු කිරීම ඔස්සේ ව්‍යවසායන්ට ජාත්‍යන්තර වෙළඳපොළ සමඟ සම්බන්ධවීමට සහ තරඟ කිරීමට සහාය ලබාදෙන "වෙළඳපොළ ප්‍රවේශ සහාය යෝජනා ක්‍රමය" නැමති විශේෂ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සිදුකළ ව්‍යාපාර සහාය ඒකකයේ ප්‍රධානියා වශයෙන් ද ඇය කටයුතු කරන ලදී.

මුදලිගේ මෙය මැලේසියාවේ සිට ක්‍රියාත්මක වූ INFOFISH හි (ආසියා ශාන්තිකර කලාපය සහ ඉන් ඔබ්බට මත්ස්‍ය නිෂ්පාදන සඳහා අලෙවිකරණ තොරතුරු සහ තාක්ෂණික උපදේශක සේවා සඳහා වන ලෝක ආහාර සංවිධානය විසින් ස්ථාපනය කළ අන්තර් රාජ්‍ය සංවිධානයකි) සේවය කළ අතර, 2015-2017 කාල සීමාව තුළ ජ්‍යෙෂ්ඨ වෙළඳ ප්‍රවර්ධන නිලධාරී වශයෙන් ද කටයුතු කර ඇත.

**මනෝජා දිසානායක මෙය**

**අධ්‍යක්ෂ - කාර්මික නිෂ්පාදන**

මනෝජා දිසානායක මෙය ජාත්‍යන්තර වෙළඳාම, අපනයන ප්‍රවර්ධනය, කාර්මික නිෂ්පාදන නිෂ්පාදනය කිරීම, ඛනිජ ද්‍රව්‍ය අංශය, මැණික් සහ ස්වර්ණාභරණ අංශය, සෙරමික් නිෂ්පාදන අංශය වැනි විවිධ අංශ ඔස්සේ වසර 22කට අධික අත්දැකීම් සපිරි වෘත්තීයවේදිනියකි.

ඇය දැනට ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ - කාර්මික නිෂ්පාදන තනතුරෙහි සේවය කරන අතර, එහි දී විවිධ කාර්මික අංශ හරහා මෙරට අපනයන තරඟකාරිත්වය වැඩිදියුණු කිරීම සඳහා අදාළ වන ක්‍රමෝපාය සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රමුඛ භූමිකාවක් ඉටු කරනු ලැබේ.

රාජ්‍ය සහ පෞද්ගලික දෙඅංශයේම පෘථුල අත්දැකීම් සහිත පසුබිමක් සහිතව, දිසානායක මෙය විසින් ශ්‍රී ලංකාවේ නිෂ්පාදන ගෝලීය වෙළඳපොළ තුළ ප්‍රවර්ධනය කිරීම සඳහා මූලාරම්භයන් රාශියකට නායකත්වය ලබා දී ඇති අතර, විවිධ ජාත්‍යන්තර ඉසව් ද සම්බන්ධීකරණය සහ ජාත්‍යන්තර සංවිධාන සමඟ හවුල්කාරිත්වයන් ගොඩනංවා ගැනීම සඳහා පහසුකම් සැලසීම ද සිදුකර තිබේ. එසේම, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය සහ අපනයන වර්ධනය සඳහා ද සුවිශේෂී අයුරින් දායකත්වය ලබා දී තිබේ.

ඇය විසින් කොළඹ විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධිය, පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය හා විද්‍යාවේදී උපාධිය හිමිකර ගෙන තිබේ. මීට අමතරව, මහා බ්‍රිතාන්‍යයේ මැණික් අධ්‍යයනය පිළිබඳ සංගමයෙන් මැණික් අධ්‍යයනය පිළිබඳ ඩිප්ලෝමාවක් හිමිකර ගෙන ඇති අතර, සිංගප්පූරුව, නෙදර්ලන්තය හා තායිලන්තය යන රටවල්වල දී ආර්ථික සංවර්ධනය සහ ආයෝජන ප්‍රවර්ධනය පිළිබඳ විශේෂිත පුහුණු වැඩසටහන්වලට ද සහභාගී වී තිබේ.ඇයගේ නායකත්වය, අවංකභාවය, සහ ක්‍රමෝපායික සැලසුම්කරණය සහ අඛණ්ඩ වැඩිදියුණුව සඳහා ඇති කැපවීම පිළිගැනීමට ලක්වී ඇති අතර, ජාතික මට්ටමේ දී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, පාර්ශවකරුවන් අතර සම්බන්ධීකරණය ඇති කිරීම, සහ අපනයන ප්‍රවර්ධන මූලාරම්භයන් ඇතිකිරීම සඳහා ද දිසානායක මෙය දායක වී ඇත.

**ඉන්දුමිණී කොඩිකාර මෙය**

**අධ්‍යක්ෂ - අපනයන සේවා**

වසර 27 කට වඩා අත්දැකීම් සපිරි ඉන්දුමිණී කොඩිකාර මෙය නිපුණ සහ කැපවීමැති වෘත්තීයවේදිනියකි. අපනයන සංවර්ධනය සහ ආර්ථික වර්ධනය පිළිබඳ වසර ගණනාවක ප්‍රගාමී අත්දැකීම් සහ ජාතික මූලාරම්භයන් සඳහා නායකත්වය ලබාදීම, පාර්ශවකරුවන්ගේ සහභාගිත්වය වැඩිදියුණු කිරීම සහ අපනයනාභිමුඛ වෘද්ධි ක්‍රමෝපාය දියත් කිරීම පිළිබඳ සනාථ කළ වාර්තා සමඟින් ඇය දැනට ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ - අපනයන සේවා තනතුරෙහි කටයුතු කරනු ලැබේ.

ඇය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබාගෙන ඇත. ඇය විසින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් කෘෂි ආර්ථික විද්‍යාව පිළිබඳ විශේෂඥතාවය සහිතව දෙවන පෙළ ඉහළ සාමාර්ථයක් සමඟින් විද්‍යාවේදී කෘෂිකර්ම උපාධි යක් හිමි කරගෙන තිබේ. ඇය ශ්‍රී ලංකා පරිගණක සංගමයේ (CSSL) ද සාමාජිකාවකි.

වැඩසටහන් කළමනාකරණය, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ ප්‍රාදේශික සමූහයන් ඇතිකිරීම යන කටයුතුවලට අදාළව විවිධ වූ සහ ප්‍රතිඵල අභිමුඛ පසුබිමක් පිළිබිඹු කරමින් ඇය විසින් මීට පෙර අධ්‍යක්ෂ - ප්‍රාදේශික සමූහ බිහිකිරීම, වැඩසටහන් කළමනාකරු සහ ව්‍යාපෘති කළමනාකරු ඇතුළු ප්‍රධාන තනතුරු හොබවා තිබේ. තව ද ප්‍රධාන අධ්‍යාපනික ආයතනයක පරිපාලන කළමනාකරු (සංවර්ධන) යන තනතුරද හොබවා තිබේ. විවිධ කාර්යාත්මක කණ්ඩායම් කළමනාකරණය, ප්‍රතිඵලදායි සංවර්ධන රාමු සැලසුම් කිරීම සහ ජාතික ආර්ථික ප්‍රමුඛතා සමඟින් ආයතනික ඉලක්ක අනුගත කිරීමේ මනා ප්‍රවීණතාවයක් ද මැය සතු ය.

**ආචාර්ය සංජීව රත්නසේකර මහතා**

**අධ්‍යක්ෂ - වෙළඳ කටයුතු සඳහා පහසුකම් සැලසීම සහ වෙළඳ තොරතුරු**

වෙළඳාම සඳහා පහසුකම් සැලසීම, ප්‍රතිපත්තිමය උපදේශන, ආර්ථික පර්යේෂණ සහ ශාස්ත්‍රීය කටයුතු පිළිබඳ වසර 17 කට අධික විශේෂඥතාවය සහිත ආචාර්ය සංජීව රත්නසේක ර මහතා අධ්‍යක්ෂ - වෙළඳ කටයුතු සඳහා පහසුකම් සැලසීම සහ වෙළඳ තොරතුරු වශයෙන් කටයුතු කරනු ලැබේ.

කොළඹ විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධියක්, ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් ද, ආර්ථික සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සහ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධියක් ද මොහු හිමිකර ගෙන තිබේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන හාවඩ් විශ්වවිද්‍යාල මධ්‍යස්ථානය, සිංගප්පූරුවේ සිවිල් සේවා විදුහල, ශ්‍රී ලංකා මහ බැංකුව, ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය සහ කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ වරලත් ආයතනය වැනි සම්මානිත ආයතනවලින් සාර්ව ආර්ථික විනිශ්චය, ආර්ථිකමිති පුරෝකතන, වෙළඳ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ, සහ ව්‍යාපාරික ගිණුම්කරණය වැනි වෘත්තීය සහතිකකරණ කිහිපයක් මොහු විසින් සම්පූර්ණ කර තිබේ.

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ සහ සහකාර අධ්‍යක්ෂ තනතුරු සහ වෙළඳ සහ ඵලදායිතා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ ප්‍රතිපත්ති කළමනාකරු වැනි සුවිශේෂී තනතුරුවල මොහු සේවය කර තිබේ.

ආචාර්ය රත්නසේකර මහතා ශ්‍රී ලංකා ආර්ථික සංගමයේ සහ ලෝක ආර්ථික සංගමයේ ද සාමාජිකත්වය දරයි. ග්‍රන්ථ සහ සඟරා ඇතුළු ශාස්ත්‍රීය අධ්‍යයන කටයුතුවල ද මොහු නිරතවී සිටී. මොහු විසින් අදාළ ක්ෂේත්‍රයට සිදුකරන ලද සුවිශේෂී දායකත්වය අවධාරණය කරමින් පර්යේෂණ විශිෂ්ටත්වය සඳහා ජාතික විද්‍යා පදනම විසින් ආචාර්ය උපාධිය සඳහා පූර්ණ පර්යේෂණ ශිෂ්‍යත්වයක් ද පිරිනමා තිබේ.

**රිකා ගෆූර් මෙය**

**අධ්‍යක්ෂ - මානව සම්පත් කළමනාකරණ**

රාජ්‍ය සහ පුද්ගලික අංශය තුළ වසර 20කට අධික ප්‍රගාමී නායකත්ව අත්දැකීම් සමඟින් රිකා ගෆූර් මෙය මානව සම්පත් සහ පරිපාලනයේ නිපුණ වෘත්තීයවේදනියකි. ව්‍යාපාරික පරිපාලනය (ඇන්ග්ලියා රස්කින් විශ්වවිද්‍යාලය, එක්සත් රාජධානිය) සහ කම්කරු සබඳතා සහ මානව සම්පත් කළමනාකරණය (කොළඹ විශ්වවිද්‍යාලය) පිළිබඳ පශ්චාත් උපාධි ද්විත්වයක්ම සතු ඇය සංවර්ධන අධ්‍යයන පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සහ ශාස්ත්‍රවේදී උපාධියක් ලබා ගෙන තිබේ.

ක්‍රමෝපායික මානව සම්පත් කළමනාකරණය, ආයතනික සංවර්ධනය, කාර්මික සබඳතා, සහ පරිපාලන පාලන ක්‍රමය යන ක්ෂේත්‍ර ඔස්සේ ඇයගේ විශේෂඥ දැනුම විහි දී ගොස් තිබේ. ජාතික ඖෂධ නියාමන අධිකාරිය, ජාතික සමූපකාර කවුන්සිලය, අපනයන ණය රක්ෂණ සංස්ථාව ඇතුළුව ජාතික වශයෙන් වැදගත් ආයතන සහ පුද්ගලික අංශය තුළ ද ඇය විසින් සාර්ථක අයුරින් මානව සම්පත් කටයුතුවලට නායකත්වය ලබාදී ඇත.

ආයතනික සංස්කෘතිය සමඟ අනුගතව මානව සම්පත් ප්‍රතිපත්ති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම, සේවක සබඳතා ආශ්‍රිත සංකීර්ණ කරුණු කළමනාකරණය කරගැනීම, ආයතනික වශයෙන් අභ්‍යන්තර විනය පරීක්ෂණ පැවැත්වීම, වෘත්තීය සමිති සමඟ එකඟතා ඇති කර ගැනීම, අනුප්‍රාප්තික සහ වෘත්තීය මඟ පිළිබඳ සැලසුම් කිරීම සම්බන්ධිත සිය ප්‍රබල හැකියාව ගෆූර් මෙය විසින් ප්‍රදර්ශනය කර තිබේ.

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ මානව සම්පත් කළමනාකරණ අධ්‍යක්ෂ වශයෙන් ඇය වර්තමානයේ දී කටයුතු කරනු ලබන අතර, ආයතනික විශිෂ්ටත්වය, සේවක සංවර්ධනය, ඵලදායිතාවය සහ ලාභදායිබව වැඩිදියුණු කරන තිරසර පුද්ගල කේන්ද්‍රීය ව්‍යාපාර පරිචයන් නිර්මාණය කිරීම සඳහා වූ කැපවීම සමඟින් ඇය විසින් අදාළ කටයුතු මෙහෙයවනු ලැබේ.

**තක්ෂිලා විජයරත්න මෙය**

**අධ්‍යක්ෂ - නීති**

තක්ෂිලා විජයරත්න මෙය නීති ක්ෂේත්‍රය වෙත 2000.06.28 වැනි දිනැතිව එක්වී ඇති අතර, දැනට නීතිඥවරියක ලෙස වසර 25ක පළපුරුද්දක් ඇය සතු ය.

නීතිවේදී උපාධිය 1999 වර්ෂයේ දී ලබාගත් ඇය, යුනිවර්සිටි ඔෆ් වේල්ස් වෙතින් 2007 වර්ෂයේ දී ජාත්‍යන්තර වෙළඳ නීතිය පිළිබඳ පශ්චාත් නීති උපාධිය ලබාගෙන තිබේ. 2004 වර්ෂයේ දී කොළඹ විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාරික පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හිමිකර ගෙන තිබේ. ශ්‍රී ලංකා නීති විද්‍යාලයෙන් ජාත්‍යන්තර වෙළඳ නීතිය පිළිබඳ සහ බුද්ධිමය දේපළ නීතිය පිළිබඳ පශ්චාත් නීති ඩිප්ලෝමා ලබාගෙන තිබේ. ජාත්‍යන්තර අධ්‍යයන සඳහා වන බණ්ඩාරනායක කේන්ද්‍රයේ ජාත්‍යන්තර කටයුතු පිළිබඳ ඩිප්ලෝමාව ද ඇය හදාරා තිබේ.

සහකාර අධ්‍යක්ෂ - නීති තනතුර සඳහා 2005 සැප්තැම්බර් 20 දිනැතිව ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ සේවයට එක් වූ විජේරත්න මෙය ඉන් අනතුරුව වර්තමානයේ දී අධ්‍යක්ෂ - නීති තනතුර දරන අතර මණ්ඩලය තුළ ආසන්න වශයෙන් වසර 20ක සේවා කාලයක් සතු ය. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ සේවයට පැමිණීමට පෙර, ඇය පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ සහකාර කළමනාකරු - නීති තනතුර දරන ලදී.

ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ ඔප්පු ලිවීම සම්බන්ධ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඒ.බී.ඩබ්.ජයසේකර මහතා යටතේ 2001 වර්ෂය දක්වා නීතිඥවරියක ලෙස පුහුණු වීම ආරම්භ කළ ඇය ඉන් අනතුරුව දිසානායක අමරතුංග ඇසෝසියේට්ස් නීතිඥ සමාගමෙහි කනිෂ්ඨ නීතිඥවරියක ලෙස ද 2003 ජනවාරි දක්වා කටයුතු කරන ලදී.

**කුසල් දිෂාන්ත පෙරේරා මහතා**
**අධ්‍යක්ෂ - මුදල්**

නිපුණ වෘත්තීය බැංකුකරුවෙකු/ ජ්‍යෙෂ්ඨ මූල්‍ය වෘත්තිකයෙකු ලෙස බැංකු සහ වැවිලි කර්මාන්ත අංශයේ ස්ථාපිත සහ ලැයිස්තුගත සමාගම්හි සේවයේ නිරතව වසර 30කට අධික පලපුරුද්දක් කුසල් දිෂාන්ත පෙරේරා මහතා සතු ය.
මොහු කොළඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය පිළිබඳ ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධියක් හිමිකර ගෙන ඇති අතර, ශ්‍රී ලංකා වරලත් සහතිකලත් ගණකාධිකාරී ආයතනයේ සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සාමාජිකයෙකි. ශ්‍රී ලංකා වරලත් වෘත්තීය කළමනාකරුවන්ගේ ආයතනයේ සාමාජිකත්වය දරන අතර, එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධි කාරි ආයතනයේ ආශ්‍රිත සමාජිකයෙක් ද වේ.
සම්පත් බැංකුවේ සංවර්ධන බැංකුකරණ- කාර්ය මණ්ඩල සහායක වශයෙන් සිය වෘත්තිය ජීවිතය ආරම්භ කළ මොහු ක්‍රමිකව යුනියන් බැන්ක් ඔෆ් කළම්බුහි සහකාර උප සභාපති - මුදල් සහ නැවත අයකරගැනීම් තනතුරු දක්වා සාර්ථක අයුරින් ගමන් කරන ලදී. මල්වත්ත වැලේ ප්ලාන්ටේෂන් පීඑල්සීහි නියෝජ්‍ය අධ්‍යක්ෂ - මුදල් වශයෙන් ද සේවය කර ඇත.
ඔහු දැනට ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ - මුදල් ලෙස සේවය කරයි.

**ජනක් බදුගම මහතා**
**අධ්‍යක්ෂ - අපනයන කෘෂිකර්මය**

ජනක් බදුගම මහතා, ශ්‍රී ලංකාවේ හොඳින් ස්ථාපිත ප්‍රමුඛතම සමාගමක් වන ටොයොටා ලංකා (පුද්ගලික) සමාගමේ සේවය කරමින්, පෞද්ගලික අංශයේ වසර 30 කට වැඩි කාලයක් උපායමාර්ගික කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය සහ සැපයුම්දාම කළමනා කරණය පිළිබඳ පුළුල් අත්දැකීම් ඇති දක්ෂ වෘත්තිකයෙකි. ඔහු 1995 දී ටොයොටා ලංකා (පුද්ගලික) සමාගමේ අලෙවිකරණ විධායක යෙකු ලෙස සිය වෘත්තීය ආරම්භ කළ අතර ආයතනික සැලසුම්කරණය සහ අලෙවි කරණ කළමනාකරු දක්වා උසස්වීම් ලබා ඇත.

මොහු රාජ්‍ය මෙන්ම පුද්ගලික අංශයේ ද විශ්ව විද්‍යාල කිහිපයක බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස ස්වකීය දැනුම හා අත්දැකීම් බෙදාගැනීම ඔස්සේ ශ්‍රී ලංකාවේ ශාස්ත්‍රීය ප්‍රජාව තුළ වඩාත් ගෞරවනීය පිළිගැනීමට ලක්වී ඇති තැනැත්තෙකි.
බදුගම මහතා ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විශේෂ උපාධියක් සහ කොළඹ විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා ඇත. ඔහු දැනට ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ - අපනයන කෘෂිකර්මය ලෙස සේවය කරයි.

**ඩී.එම්.පී.දිසානායක මහතා**
**අධ්‍යක්ෂ - ප්‍රාදේශීය සංවර්ධන (වැ.බ.)**

ඩී.එම්.පී.දිසානායක මහතා ප්‍රාදේශීය ආර්ථික සංවර්ධනය, අපනයන ප්‍රවර්ධනය, සහ වෙළඳ කටයුතු සඳහා පහසුකම් සැලසීම සම්බන්ධයෙන් වසර 24කට අධික මනා අත්දැකීම් සපිරි වෘත්තිකයෙකි. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ සේවයට එක්වීමට පෙර මොහු දක්ෂිණ සංවර්ධන අධිකාරියේ සහ සවුත් ඒෂියා ට්‍රේඩ් ගේට්වේ සේවය කර තිබෙන අතර එහිදී ප්‍රාදේශීය සංවර්ධන අංශය, විශේෂ ව්‍යාපෘති අංශය සහ ට්‍රේඩ් නෙට් එස්එල් අංශය වැනි අංශ තුළ විවිධ තනතුරුවල සේවය කර ඇත.

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ විධායක තනතුරුවල වසර 18කට අධික අත්දැකීම් සහිත දිසානායක මහතා ප්‍රාදේශීය අපනයන සංවර්ධන කටයුතු සඳහා සුවිශේෂී දායකත්වයක් ලබාදී ඇත. 2002 සිට 2015 දක්වා කාල සීමාව තුළ මොහු මණ්ඩලයේ හම්බන්තොට පිහිටි විශේෂ ශාඛා කාර්යාලයේ සහ දකුණු පළාත් ප්‍රාදේශීය කාර්යාලයේ කටයුතු මෙහෙයවා තිබේ. මෙම කාල සීමාව තුළ, මොහු විසින් ජාතික අපනයන අංශය සඳහා ප්‍රාදේශීය සහභාගිත්වය වැඩිදියුණු කිරීම අරමුණු කරගත් ප්‍රමුඛ මූලාරම්භයක් වන ‘නව අපනයනකරුවන් සංවර්ධනය කිරීමේ වැඩසටහන’ ආරම්භ කර තිබේ.
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සංඛ්‍යානය පිළිබඳ මූලික විශේෂ උපාධියක් හිමි මොහු කැලණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය ද හිමිකර ගෙන තිබේ.
2017 වර්ෂයේ සිට මණ්ඩලයේ ප්‍රාදේශීය සංවර්ධන අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරන දිසානායක මහතා, 2024 සැප්තැම්බර් සිට අධ්‍යක්ෂ - ප්‍රාදේශීය සංවර්ධන (වැ.බ.) ලෙස ද රාජකාරි ඉටු කරනු ලැබේ.

**සෞම්‍යා කන්නන්ගර මෙය**

**අධ්‍යක්ෂ - වෙළඳපොළ සංවර්ධන (වැ.බ.)**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වසර 19කට අධික සේවා පළපුරුද්දක් හිමි සෞම්‍යා කන්නන්ගර මෙය විසින් වෙළඳපොළ සංවර්ධන සහ අපනයන ප්‍රවර්ධන කටයුතු සම්බන්ධයෙන් ප්‍රබල විශේෂඥතාවයක් ගොඩනංවාගෙන තිබේ. ක්‍රමෝපායික සැලසුම්කරණය සහ වැඩසටහන් දියත් කිරීම ඔස්සේ ශ්‍රී ලංකාවේ නිෂ්පාදනවලට ජාත්‍යන්තර වෙළඳපොළවල් තුළ තරඟ කිරීමේ අවස්ථාවට උපකාර කිරීම පිණිස ඇයගේ ප්‍රධාන රාජකාරී කේන්ද්‍රීය වී තිබේ.

ඇයගේ සමස්ත රාජකාරී විෂය පථය තුළ ජාතික අපනයන සංවර්ධන වැඩසටහන ආරම්භයේ සිට අවසානය දක්වා සැලසුම් කිරීමේ, ක්‍රියාත්මක කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ කාර්යය සඳහා වගකීම දරනු ලැබේ. ශ්‍රී ලංකාවේ නිෂ්පාදන විදේශ වෙළඳපොළට ඇතුළු වීමේ අවශ්‍යතා සඳහා ක්‍රමෝපායික මඟ පෙන්වීම ලබාදීම, සවිස්තරාත්මක වෙළඳපොළ පර්යේෂණ සිදුකිරීම, ජාත්‍යන්තර සංවිධාන සහ වෙළඳ ප්‍රවර්ධන සංවිධාන සමඟ සහයෝගිතාවයන් ගොඩනැංවීම ඇයගේ කාර්යයන්වලට ඇතුළත් වේ.

ඇයගේ කාර්යභාරය තුළ, ඇය විසින් ජාතික අපනයන සන්නාම ප්‍රවර්ධන මූලාරම්භයන් සඳහා නායකත්වය ලබා දී ඇත. අපනයනකරුවන්ගේ ජාත්‍යන්තර ප්‍රවේශය පුළුල් කිරීම සඳහා ඔවුන්ට රුකුලක් වීම පිණිස මූල්‍ය සහාය යෝජනා ක්‍රම සැලසුම් කිරීම සහ පරිපාලනය කිරීම් කටයුතු ඇය විසින් අධීක්ෂණය කරනු ලැබේ. ශ්‍රී ලංකාවේ සමාගම්වල සුවිශේෂී අපනයන කාර්යසාධනය හඳුනාගනිමින් ජාතික අපනයන සම්මාන ප්‍රදානය සංවිධානය කිරීම කළමනාකරණය කිරීම ද ඇය විසින් සිදුකරන ලදී.

කොළඹ විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර අධ්‍යයන පශ්චාත් උපාධියක්, සබරගමුව විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර අධ්‍යයන (අලෙවි කළමනාකරණ) විද්‍යාවේදී උපාධියක් කන්නන්ගර මෙයට හිමි ය.

**සමන් සිසිල් මහතා**

**අධ්‍යක්ෂ - තොරතුරු තාක්ෂණ (වැ.බ.)**

විද්‍යාවේදී උපාධිධාරයෙකු වන සමන් සිසිල් මහතා යෙදවුම් සැලසුම්, පද්ධති ක්‍රියාත්මක කිරීම සහ ව්‍යවසාය කළමනාකරණය ආවරණය කරමින් තොරතුරු තාක්ෂණය පිළිබඳ වසර 25කට අධික අත්දැකීම් මණ්ඩලය වෙත රැගෙන එනු ලැබේ.

1999 වර්ෂයේ දී ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ සේවයට එක්වීමේ සිට එහි ඩිජිටල් යටිතල පහසුකම් සහ සේවා සවිමත් කිරීම සඳහා මොහු විසින් ප්‍රමුඛතම කාර්යභාරයක් ඉටු කරනු ලැබීය. දැනට තොරතුරු තාක්ෂණ අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙස කටයුතු කරන මොහු විසින් සර්වර්, දත්ත සමුදායන්, ඊමේල් වේදිකාවන්, වෙබ් යෙදවුම් සහ ෆයර්වෝල්, එන්ඩ්පොයින්ට් ප්‍රොටෙක්ෂන් සහ පෙරිමීටර් ඩිෆෙන්ස් වැනි ආරක්ෂක පද්ධති ඇතුළුව ආයතනයේ තොරතුරු තාක්ෂණ පද්ධතියේ පූර්ණ පරිපාලනය සහ කළමනාකරණය අධීක්ෂණය කරනු ලැබේ.

තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් පවත්වා ගැනීමට අමතරව, මොහු විසින් වෙළඳ තොරතුරු සේවා සකස්කිරීම සහ ලබාදීම, තොරතුරු දත්ත සමුදායන් නිසි කාල අන්තරවලදී යාවත්කාලීන කිරීම, ආපදා අවස්ථාවලින් නැවත යථා තත්ත්වයට පැමිණීම සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම, තාක්ෂණික පිරිවිතර සකස් කිරීම සහ තාක්ෂණික ඇගයීම් සිදුකිරීම ඇතුළුව ප්‍රසම්පාදන ක්‍රියාවලි සඳහා සහාය ලබාදීම ආදිය සඳහා දායකත්වය ලබා දේ.

මොහුගේ සමස්ත වෘත්තීය වගකීම ඔස්සේ සුමට තොරතුරු තාක්ෂණ මෙහෙයුම් සහ ඵලදායී සහාය සහතික කරන අතර එමඟින් අපනයන ප්‍රවර්ධනය සඳහා පහසුකම් සලස්වන සුරක්ෂිත, විශ්වසනීය ඩිජිටල් විසඳුම් ලබාදීමට ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයට හැකි වේ.

**තක්ෂිල හෙට්ටිආරච්චි මහතා**

**සහකාර අධ්‍යක්ෂ - අභ්‍යන්තර විගණක**

ශ්‍රී ලංකාවේ පුද්ගලික සහ රාජ්‍ය අංශයේ වසර 20කට අධික විගණන අත්දැකීම් සතු තක්ෂිල හෙට්ටිආරච්චි මහතා විගණන සහ මුදල් ක්ෂේත්‍රවල කීර්තිමත් වෘත්තිකයෙකි. මූල්‍ය අධීක්ෂණය සහ අභ්‍යන්තර පාලනය සම්බන්ධිත මොහුගේ පූර්ව ක්‍රියාකාරී ප්‍රවේශය සහ විශිෂ්ටත්වය හඳුනාගෙන තිබේ.

හෙට්ටිආරච්චි මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ මූලික උපාධිය සහ කැලණිය විශ්වවිද්‍යාලයෙන් මූල්‍ය පිළිබඳ පශ්චාත් උපාධියක් හිමිකර ගෙන තිබේ. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ සේවයට එක්වීමට පෙර, මොහු පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අභ්‍යන්තර විගණක (වැ.බ) තනතුරේ කටයුතු කළ අතර, ප්‍රධාන ආයතනික ඉලක්ක සාක්ෂාත් කරගැනීම සඳහා මොහුගේ නායකත්වය යටතේ ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු විය.

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ අභ්‍යන්තර විගණක වශයෙන් වූ ඔහුගේ වර්තමාන භූමිකාව තුළ දැඩි මූල්‍ය පාලනයක් ඔස්සේ අභ්‍යන්තර මෙහෙයුම් සුසංවිධිත කිරීමට සහ ආයතනික මෙහෙවර සඳහා සහාය ලබාදීමට සිය විශේෂඥ දැනුම තුළින් අඛණ්ඩ දායකත්වයක් ලබාදේ.

## විගණන කමිටු වාර්තාව - 2024

### හැඳින්වීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වැනි වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ උප කමිටුවක් වශයෙන් විගණන කමිටුව පිහිටුවන ලදී. සමාලෝචිත කාල සීමාව තුළ විගණන කමිටුවේ සභාපතිත්වය දරන ලද මහා භාණ්ඩාගාරය නියෝජනය කරන අධ්‍යක්ෂවරයා ද ඇතුළුව අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක නොවන අධ්‍යක්ෂවරු සතරදනෙකුගෙන් විගණන කමිටුව සමන්විත විය.

විගණන කමිටුව අවම වශයෙන් කාර්තුවකට එක් වරක් බැගින් රැස්විය යුතු අතර, අංක DMA/01-2019 දරණ කළමනාකරණ විගණන චක්‍රලේඛයට අනුව වාර්ෂිකව අවම වශයෙන් රැස්වීම් 04ක් පැවැත්විය යුතු ය. අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ සහභාගිත්වයෙන් සහ ජාතික විගණන කාර්යාලයේ විගණන අධිකාරිවරයෙකු නිරීක්ෂක වශයෙන් සහභාගී වූ විගණන කමිටු හතරක් (04) පහත වගුවේ දක්වා ඇති පරිදි 2024 වර්ෂය තුළ දී පවත්වා ඇත.

**විගණන කමිටු රැස්වීම්වල විස්තර - 2024**

| කාර්තුව | දිනය | සාමාජිකයන් සහ නිරීක්ෂකවරු |
|---|---|---|
| 1 වැනි කාර්තුව | 2024 ජුනි 19 | *<u>සහභාගී වූ සාමාජිකයන්</u>*<br>කේ.ජේ.විමලෙන්තිරරාජා මයා<br>සභාපති (භාණ්ඩාගාර නියෝජිත)<br><br>ජේ.එච්.එස්.ෆරීඩා මෙය<br>විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික<br><br>ඊ. එම්. බී. එස්. ජයසුන්දර මයා<br>විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික<br><br>*<u>නිරීක්ෂක</u>*<br>ඩබ්ලිව්. එස්. විමලවීර මිය<br>විගණන අධිකාරී<br><br>ඩී. එන්. කේ. හෙට්ටිආරච්චි මෙය<br>ප්‍රධාන අභ්‍යන්තර විගණක - ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යංශය |
| විශේෂ විගණන කමිටු රැස්වීම | 2024 නොවැම්බර් 6 | *<u>සහභාගී වූ සාමාජිකයන්</u>*<br>කේ.ජේ.විමලෙන්තිරරාජා මයා<br>සභාපති (භාණ්ඩාගාර නියෝජිත)<br><br>ජේ.එච්.එස්.ෆරීඩා මෙය<br>විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |

| | | |
|---|---|---|
| | | ඊ. එම්. බී. එස්. ජයසුන්දර මයා<br>විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික<br><br>තුශාර හෙට්ටිතන්ත්‍රිගේ මයා<br>විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික<br><br>*නිරීක්ෂක*<br>ඩබ්ලිව්. එස්. විමලවීර මිය<br>විගණන අධිකාරී |
| 2 වැනි කාර්තුව | 2024 නොවැම්බර් 18 | *සහභාගී වූ සාමාජිකයන්*<br>කේ.ඒ.විමලෙන්තිරරාජා මයා<br>සභාපති (භාණ්ඩාගාර නියෝජිත)<br><br>ඒ.එච්.එස්.ෆරීඩා මෙය<br>විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික<br><br>ඊ. එම්. බී. එස්. ජයසුන්දර මයා<br>විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික<br><br>තුශාර හෙට්ටිතන්ත්‍රිගේ මයා<br>විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික<br><br>බීනුප ලියනගේ මයා<br>විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික<br><br>*නිරීක්ෂක*<br>ඩබ්ලිව්. එස්. විමලවීර මිය<br>විගණන අධිකාරී<br><br>ඩී. එන්. කේ. හෙට්ටිආරච්චි මෙය<br>ප්‍රධාන අභ්‍යන්තර විගණක - ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය |
| 3 වැනි කාර්තුව | 2024 දෙසැම්බර් 20 | *සහභාගී වූ සාමාජිකයන්*<br>යූ. එන්. මල්ලවආරච්චි මයා<br>සභාපති (භාණ්ඩාගාර නියෝජිත)<br><br>ඒ.එච්.එස්.ෆරීඩා මෙය<br>විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික<br><br>ඊ. එම්. බී. එස්. ජයසුන්දර මයා<br>විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික<br><br>බීනුප ලියනගේ මයා<br>විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික<br><br>*නිරීක්ෂක*<br>ඊ. වී. පී සිල්වා මිය<br>විගණන අධිකාරී |

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා නිර්දේශ ලබා දීම පිණිස යහපාලනයක් සඳහා වන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශවල සහ අංක DMA/01-2019 දරණ කළමනාකරණ විගණන චක්‍රලේඛයේ දක්වා ඇති විෂය පථයට අනුව විගණන කමිටුව විසින් සිය කාර්ය සහ කර්තව්‍යයන් ඉටුකරන ලදී.

**ප්‍රගතිය**

සමාලෝචිත වර්ෂය තුළ දී, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයන් සහ විගණන ක්‍රියාවලි වැඩිදියුණුව කරා මෙහෙයවීමට විගණන කමිටුව දායකවී තිබෙන අතර, ආයතනයේ මූල්‍ය කළමනාකරණ පරිචයන් සුවිශේෂී අයුරින් වැඩිදියුණු කිරීම සඳහා දායක වූ ප්‍රධාන නිර්දේශ, විධාන සහ යෝජනා කිහිපයක් ද ලබා දී තිබේ.

1. කමිටුව විසින් වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සමාලෝචනය, ඇගයීම සිදුකළ අතර එහි ඵලදායිතාවය සහ ආයතනික අරමුණු සමඟ අනුගතවීම සහතික කරමින් එකී සැලැස්ම වැඩිදියුණු කිරීම සඳහා යෝජනා ලබාදෙන ලදී.
2. ගිණුම්කරණ ප්‍රමිත සමඟ වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල අනුකූලතාවය සහ මූල්‍ය වාර්තාකරණයේ නිරවද්‍යතාවය වැඩිදියුණු කිරීම විගණන කමිටුව විසින් සහතික කරන ලදී.
3. විගණන කමිටුව විසින් 2024 වසර තුලදී අපනයන සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය හා පරිපාලන ක්‍රියාවලිය සම්බන්ධයෙන් නිරන්තර සමාලෝචනයක් සිදු කල අතර ඒ තුලින් හඳුනාගන්නා විචලතාවයන් සම්බන්ධයෙන් නිර්දේශ ලබා දිම සිදු කරන ලදි.
4. අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සිදුකරන කාර්යයන් සම්බන්ධයෙන් පසුවිපරම් ලබාගැනිම සඳහා උපදෙස් ලබාදිමෙන් සිදුකල කටයුතු නැවත සමාලෝචනය කිරිම මගින් අපනයන සංවර්ධන මණ්ඩලයේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට දායක වි ඇත.
5. ප්‍රාදේශිය කාර්යාල සිදුකරන ප්‍රායෝගික ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් අවධානය යොමු කල විගණන කමිටුව එම ක්‍රියාකාරකම් විධිමත් කිරිම සඳහා උපදෙස් ලබා දිම සිදු කර ඇත.
6. කමිටුව විසින් විගණකාධිපතිවරයාගේ විගණන විමසුම්, අභ්‍යන්තර විගණන වාර්තා සහ අපගමනයන් නිරවද්‍ය කිරීම සඳහා ගනු ලැබූ කළමනාකරණ පියවර සමාලෝචනය කර ඇගයීම සිදුකළ අතර, අඛණ්ඩ වැඩිදියුණු කිරීම් හා යහපත් පරිචයන්ට අනුගතවීම සහතික කරන ලදී.
7. පිරිවැය ඵලදායිකත්වය සම්බන්ධයෙන් අවධානය යොමු කරමින් කාර්තුමය මූල්‍ය ප්‍රගතිය නිරික්ෂණයන් කිරිමට කමිටුව කටයුතු කල අතර අනවශ්‍ය වියදම් අවම කිරිම සම්බන්ධව අවස්ථා හඳුනා ගන්නා ලදි.

යූ. එන්. මල්ලවආරච්චි
සභාපති - විගණන කමිටුව
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව
මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

# ආයතනික පාලන වාර්තාව

## හැඳින්වීම

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන අමාත්‍ය සභාව සංස්ථාපනය කිරීම සහ ශ්‍රී ලංකාවේ අපනයන සංවර්ධනය සහ ප්‍රවර්ධනය කිරීම සඳහා වන ප්‍රමුඛතම රජයේ ආයතනය ලෙස ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය පිහිටුවීම පිණිස වූ විධිවිධාන 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත මගින් සැලසේ. පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත ශ්‍රී ලංකා අපනයන සංවර්ධන අමාත්‍ය සභාව පිහිටුවීම සඳහා පනතේ 2 වැනි වගන්තිය මගින් විධිවිධාන සලස්වා ඇත:

- අතිගරු ජනාධිපතිවරයා, සභාවේ සභාපති විය යුතු ය;

- වෙළඳ, නැව් කටයුතු, කර්මාන්ත, කෘෂිකර්මය, වැවිලි කර්මාන්ත, පේෂ කර්මාන්ත, ධීවර, මුදල්, විදේශ කටයුතු, ක්‍රමසම්පාදන සහ ග්‍රාමීය කර්මාන්ත යන විෂයයන් භාර අමාත්‍යවරුන්.

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන අමාත්‍ය සභාව ස්ථාපනය කිරීමේ ප්‍රධාන අරමුණ වනුයේ අමාත්‍ය මණ්ඩලය විසින් ලබාදෙන යම් පොදු හෝ විශේෂ විධිවිධානවලට යටත්ව, ජාතික අපනයන සංවර්ධන ප්‍රතිපත්ති සහ වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම යි.

මණ්ඩලයේ සියලු කටයුතුවලදී විනිවිදභාවය, වගවීම හා සදාචාරාත්මක චර්යාව සහතික කිරීම උදෙසා ආයතනික පාලනයේ ඉහළ ප්‍රමිතීන් පවත්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය කැප වී සිටී. පාර්ශවකරුවන්ගේ විශ්වාසය සහ තිරසර වර්ධනය ප්‍රවර්ධනය වැඩිදියුණු කිරීම උදෙසා මෙම ප්‍රතිපත්ති අඛණ්ඩව පවත්වාගෙන යෑම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය කැපවී සිටී.

## අධ්‍යක්ෂ මණ්ඩලය

ශ්‍රී ලංකාවේ අනයන සංවර්ධනය සහ ප්‍රවර්ධනයට අදාළ කටයුතු කරගෙන යෑම සඳහා කර්මාන්ත, වෙළඳ, හෝ මූල්‍ය කටයුතුවල නැතහොත් අපනයන සංවර්ධනය හා සම්බන්ධිත වෙනත් ක්ෂේත්‍රයක පළපුරුද්ද සහ හැකියාවන් දක්වා ඇති පුද්ගලික අංශයෙන් තැනැත්තන් අතුරින් පත්කරනු ලබන සභාපති සහ සෙසු සාමාජිකයන් හය දෙනෙකුගෙන්, නිලබලයෙන් පත්වනු ලබන ලේකම් හෝ අතිරේක ලේකම් මට්ටමින් යථෝක්තව සඳහන් කළ වෙළඳ, නැව් කටයුතු, කර්මාන්ත, කෘෂිකර්මය, වැවිලි කර්මාන්ත, පේෂ කර්මාන්ත, ධීවර, මුදල්, විදේශ කටයුතු, ක්‍රමසම්පාදන සහ ග්‍රාමීය කර්මාන්ත යන විෂයයන් ආවරණය කරමින් රාජ්‍ය අංශයෙන් පත්වන සාමාජිකයන් සහ ජනාධිපතිවරයාගේ එකඟත්වය සහිතව අමාත්‍යවරයා විසින් මහ කොළඹ ආර්ථික කොමිෂන් සභාවෙන් (වර්තමානයේ ආයෝජන මණ්ඩලය) පත්වන සාමාජිකයෙකුගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වේ.

ආයතනය වෙත උපායමාර්ගික මඟපෙන්වීම සහ අධීක්ෂණ කටයුතු සඳහා අපනයන සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය වගකිවයුතු ය. සමබර සහ ස්වාධීන තීරණ ගැනීමේ ක්‍රියාවලියක් සහතික කරමින්, විවිධ පසුබිම් ඔස්සේ සහ විශේෂඥ දැනුමෙන් යුතුව රාජ්‍ය සහ පෞද්ගලික අංශ නියෝජනය කරන තැනැත්තන්ගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වේ. ආයතනයේ උපායමාර්ගික අරමුණු හා අනුගතවීම සහතික කරමින්, ප්‍රධාන ප්‍රතිපත්ති, අයවැය හා කාර්යසාධන වාර්තා සමාලෝචනය කිරීම සහ අනුමත කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චිත කාලාන්තරවලදී රැස්වෙනු ලැබේ.

## අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්භාරයන් සහ වගකීම්

අධ්‍යක්ෂ මණ්ඩලය පහත කරුණු සම්බන්ධයෙන් වගකිවයුතු ය.

- අපනයන සංවර්ධන මණ්ඩලයේ උපායමාර්ගික මඟපෙන්වීම සහ අරමුණු සකස් කිරීම.
- ක්‍රියාකාරී සැලැස්ම, උපායමාර්ග සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම.
- මූල්‍ය කාර්යසාධනය සහ අවදානම් කළමනාකරණය අධීක්ෂණය කිරීම.
- නෛතික හා නියාමන අවශ්‍යතාවලට අනුකූලතාවය සහතික කිරීම.
- ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය පත්කිරීම සහ කාර්යසාධනය ඇගයීම.

## පරිපාලන මාර්ගෝපදේශ සංග්‍රහය සහ කමිටු

සේවකයන්, අධ්‍යක්ෂවරු සහ පාර්ශවකරුවන් වෙත චර්යාධර්ම සංග්‍රහය හා ආචාරධර්ම, මෙන්ම අපනයන සංවර්ධන මණ්ඩලය සමඟ හෝ මණ්ඩලය තුළ කටයුතු කිරීම සඳහා වන ප්‍රමිත හා පරිචයන් සඳහා විධිවිධාන සලස්වන අනෙකුත් ආයතනික ප්‍රතිපත්ති ද ඇතුළුව අපනයන සංවර්ධන මණ්ඩලයේ ප්‍රතිපත්ති හා කාර්ය පටිපාටි පිළිබඳ වැදගත් තොරතුරු සහ පැහැදිලි මඟ පෙන්වීමක් ඉදිරිපත් කරමින් පරිපූර්ණ මාර්ගෝපදේශ සංග්‍රහයක් වශයෙන් අපනයන සංවර්ධන මණ්ඩලයේ පරිපාලන මාර්ගෝපදේශ සංග්‍රහය ක්‍රියා කෙරේ. මණ්ඩලයේ අභ්‍යන්තර මෙහෙයුම් අධීක්ෂණය කරවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත දැක්වෙන ප්‍රධාන කමිටු ස්ථාපිත කර තිබේ.

1) **කළමනාකරණ කමිටුව:** අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපනය කරන උපායමාර්ගික විධාන ක්‍රියාත්මක කිරීම සහ ආයතනයේ දෛනික වැඩ කටයුතු අධීක්ෂණය කිරීම සම්බන්ධයෙන් කළමනාකරණ කමිටුව වගකිව යුතු ය.

2) **විගණන කමිටුව:** මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලන, සහ අවදානම් කළමනාකරණ පරිචයන් අධීක්ෂණය කෙරේ.

3) **ප්‍රසම්පාදන කමිටුව:** ප්‍රසම්පාදන ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම, ප්‍රසම්පාදන රෙගුලාසි/ මාර්ගෝප දේශවලට අනුකූලතාවය සහතික කිරීම, සහ ආයතනික අවශ්‍යතා සපුරාලීමට සැපයුම්කරුවන් තෝරාගැනීම සඳහා ප්‍රසම්පාදන කමිටු වගකිව යුතු ය. ප්‍රසම්පාදන කටයුතුවල ස්වභාවය පදනම් කරගෙන ප්‍රසම්පාදන ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා දෙපාර්තමේන්තුගත ප්‍රසම්පාදන කමිටුව, උපදේශක ප්‍රසම්පාදන කමිටුව, සහ ක්ෂුද්‍ර ප්‍රසම්පාදන කමිටුව වශයෙන් ප්‍රසම්පාදන කමිටු ත්‍රිත්වයක් පත්කර තිබේ.

4) **පුහුණු කමිටුව:** පුහුණු අවශ්‍යතා හඳුනාගැනීම, දේශීය සහ විදේශීය පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් නම් කිරීම, පුහුණු වැඩසටහන් සකස් කිරීම, සහ සේවකයන්ගේ අඛණ්ඩ ඉගෙනුම සහ සංවර්ධනය සහතික කිරීම සඳහා එම පුහුණු වැඩසටහන්වල ඵලදායිතාවය ඇගයීම සම්බන්ධයෙන් පුහුණු කමිටුව වගකිව යුතු ය.

5) **මාරු කමිටුව:** අපනයන සංවර්ධන මණ්ඩලයේ මෙහෙයුම් අවශ්‍යතා සපුරාලන අතර සාධාරණ හා පාරදෘශ්‍ය ක්‍රියාවලියක් සහතික කරමින්, ආයතනය තුළ මාරුවීම් සිදුකිරීම සඳහා වන ඉල්ලීම් ඇගයීම සහ අනුමත කිරීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලයේ මාරු කමිටුව වගකීම දරනු ලැබේ.

6) **වෛද්‍ය කමිටුව:** වෛද්‍ය සහාය යෝජනා ක්‍රමය යටතේ අපනයන සංවර්ධන මණ්ඩලයේ සේවකයන් වෙත පිරිනැමෙන වරප්‍රසාද ලබාදීමේ ක්‍රියාවලිය මෙම කමිටුව විසින් අධීක්ෂණය කරනු ලැබේ.

## විනය ක්‍රියාමාර්ග

සේවකයින් සම්බන්ධ සියලුම විනය ක්‍රියාමාර්ග සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය ආයතන සංග්‍රහයේ II කොටස අනුගමනය කරයි.

## බඳවාගැනීමේ කාර්ය පටිපාටිය සහ උසස් කිරීමේ කාර්ය පටිපාටිය

සාධාරණ සහ විනිවිදභාවයකින් යුතු තෝරා ගැනීමේ ක්‍රියාවලියක් සහතික කරමින්, නව සේවකයින් බඳවා ගැනීම සඳහා වන නිර්ණායක සහ ක්‍රියා පටිපාටින් බඳවාගැනීමේ කාර්ය පටිපාටිය ඔස්සේ දක්වා තිබේ. අනෙක් අතින්, උසස් කිරීමේ කාර්ය පටිපාටිය මගින් ලකුණු සහ කාර්යසාධනය මත පදනම්ව දැනට සිටින සේවකයන් ඉහළ තනතුරුවලට උසස් කිරීමේ නිර්ණායක සහ ක්‍රියාවලි නිර්වචනය කෙරේ.

## විනිවිදභාවය සහ තොරතුරු අනාවරණය කිරීම

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් එහි කටයුතුවල විනිවිදභාවය පවත්වාගැනීම වෙනුවෙන් කැපවී සිටින අතර, විවිධ මාර්ග ඔස්සේ පාර්ශවකරුවන් සමග ක්‍රමික ආකාරයෙන් සන්නිවේදනය පවත්වාගෙන යනු ලැබේ. වාර්ෂික වාර්තා, මූල්‍ය ප්‍රකාශන, සහ කාර්යසාධන යාවත්කාලීන කිරීම් ප්‍රකාශයට පත්කිරීම සහ පොදු ජනතාවට ඒවා සඳහා පිවිසිය හැකි පරිද්දෙන් පවත්වාගෙන යනු ලබයි. ආයතනය විසින් එහි කාර්යයන්, ප්‍රතිපත්ති හා පාලන ව්‍යුහය වැනි තොරතුරු රැගත් www.srilankabusiness.com යන නමින් හැඳින්වෙන නිල වෙබ් අඩවියක් ද පවත්වා ගෙන යනු ලැබේ.

## විමසීම් ස්ථානය/ උපකාරක කවුළුව

ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳාම සඳහා පහසුකම් සැලසීමේ ගිවිසුමට අනුකූලව විමසීම් හා ගැටලු සඳහා කාලීන හා කාර්යක්ෂම අයුරින් විසඳුම් සැපයීම සිදුකරමින්, පාරිභෝගිකයන් වෙත අපනයන, පහසුකම් හෝ අනෙකුත් උපකාරී කාර්යයන්ට අදාළව සහාය, මාර්ගෝපදේශ ලබාගැනීම, සහ සේවා ඉල්ලුම් කිරීම සඳහා සම්බන්ධ විය හැකි කේන්ද්‍රීය ස්ථානය ලෙස අපනයන සංවර්ධන මණ්ඩලයේ උපකාරක කවුළුව (EDB Help Desk) ක්‍රියා කෙරේ.

## අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සිදුකරන ආයතනික මට්ටමේ නියෝජනය

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ආයතනික මට්ටමේ නියෝජනය ඔස්සේ සිය පාර්ශවකරුවන් සමඟ ආශ්‍රිත පාර්ශව සබඳතා පවත්වාගෙන යන අතර, ආයතනයේ උපායමාර්ගික දිශානතිය, ජයග්‍රහණයන් සහ හරාත්මක අරමුණුවල ඵලදායි සහයෝගීතාවයක් මීට අන්තර්ගත වේ. ශ්‍රී ලංකාවේ අපනයන ප්‍රවර්ධනය කිරීම සහ ආර්ථික සංවර්ධනය උදෙසා මණ්ඩලයේ අතිශය වැදගත් භූමිකාව අවධාරණය කරමින්, මෙම සන්නිවේදන කාර්යය රජයේ ආයතන, කාර්මාන්ත හවුල්කරුවන්, සහ පොදු ජනතාව ඇතුළුව විවිධ පාර්ශවකරුවන් වෙත යොමු වේ.

## අන්තර් නියෝජිතායතන සහයෝගිතාවය

### ආ) ජාතික මට්ටම:

- **අපනයනකරුවන්ගේ සමුළුව**

වයාපාරික ප්‍රජාව සහ අපනයනකරුවන් විසින් මුහුණපාන මෙහෙයුම් හා ප්‍රතිපත්ති ආශ්‍රිත ගැටලු විසඳීම සඳහා ඒකාබද්ධ වේදිකාවක් සැලසීම සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් අපනයනකරුවන්ගේ සමුළුවක් සංවිධානය කරන ලදී.

2024 ජූලි 25 වැනි දිනැතිව ගරු දිලුම් අමුණුගම මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති 24 වැනි අපනයනකරුවන්ගේ සමුළුවේ දී ප්‍රධාන ගැටලු 13කට අදාළව සාකච්ඡා කෙරුණු අතර, එහිදී ගැටලු දෙකක් විසඳීමට හැකි වූ අතර, ඉතිරි ගැටලු විසඳීම සඳහා වන පියවර ගැනීම ද ආරම්භ කෙරිනි. අපනයනකරුවන් හා සම්බන්ධිත අභියෝග විසඳීම සඳහා ස්ථාපනය කරන ලද වෙළඳාම සඳහා පහසුකම් සැලසීමේ කාර්යසාධක බලකාය විසින් අපනයනකරුවන් වෙත ලබාදෙන සහාය තවදුරටත් ශක්තිමත් කිරීම පිණිස රජයේ ආයතන 35ක සහභාගිත්වයෙන් එහි පළමු සැසිය 2024 ඔක්තෝබර් 29 දින කැඳවන ලදී.

මීට අමතරව, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ද ඇතුළුව, සෘජු හා වක්‍ර අපනයනකරුවන් මෙන්ම ප්‍රධාන අපනයනකරුවන් හා විද්වතුන් වශයෙන් වූ කාන්තා ව්‍යවසායකයන් 50 දෙනෙකු ජාලගත කිරීමේ සැසියක් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ දී 2024 නොවැම්බර් 29 දින පැවැත්විණි. ජාත්‍යන්තර වෙළඳපොළවල් වෙත සංක්‍රමණය වීමට සහ එතුළ සාර්ථකත්වයට පැමිණීම සඳහා කාන්තාවන් සවිබල ගැන්වීම අරමුණු කරගත් අර්ථාන්විත සබඳතා, දැනුම් හුවමාරුව, සහ සහයෝගිතාවයන් මෙම සැසිය තුළ දී වැඩිදියුණු විය.

තව ද, සියලු කරුණු ඇතුළත් අවසන් ඉලක්කය වූ අපනයනකරුවන්ගේ ගෝලීය තරඟකාරිත්වය වැඩිදියුණු කිරීම සඳහා හිතකර පරිසරය වැඩිදියුණු කිරීමේ අරමුණැතිව ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් අදාළ රේඛීය නියෝජිතායතන සමඟ සහයෝගිතාවයෙන් අපනයනකරුවන් විසින් මුහුණ දෙන මූල්‍ය ගැටලු විසඳීම සඳහා සක්‍රීයව පහසුකම් සලස්වන ලදී.

- උපදේශක කමිටු

නිෂ්පාදන සහ සේවා සකස්කිරීම වැඩිදියුණු කිරීම සහ අපනයන වෙළඳ කටයුතුවලට පිළියම් යෙදීමේ කාර්යභාරය සමඟින් 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 10 (1) වගන්තිය යටතේ 2021 ජූලි මස 15 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි උපදේශක කමිටු විසි හතරක් (24) ක්‍රියාත්මක වේ.

අපනයන ක්ෂේත්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන්, පුද්ගලික අංශයේ සංගම්, විශේෂඥ දැනුමෙන් හෙබි තැනැත්තන්, අදාළ රජයේ ආයතන නියෝජනය කිරීමට සහ අදාළ නිෂ්පාදන ක්ෂේත්‍රවල අත්දැකීම් සහිත සහ සිය විශේෂඥ දැනුම මත පදනම්ව එකී ක්ෂේත්‍රවල කාර්යයන් සඳහා දායකත්වයක් දරනු ලබන අදාළ රේඛීය අමාත්‍යාංශය විසින් නම් කරනු ලබන තැනැත්තන් උපදේශක කමිටු සාමාජිකයන් වශයෙන් තෝරා ගැනේ.

උපදේශක කමිටු සඳහා පුද්ගලික සහ රාජ්‍ය අංශයේ නියෝජනය මඟින් අන්‍යෝන්‍ය වශයෙන් පිළිගත හැකි යෝජනා සම්පාදනය සහ ඒවායේ කාර්යක්ෂම ක්‍රියාත්මකවීම සිදුවිය හැකි පරිසරයක් නිර්මාණය වීම අපේක්ෂා කෙරේ.

පහත දැක්වෙන නිෂ්පාදන සහ සේවා අංශ ආවරණය වන පරිද්දෙන් උපදේශක කමිටු ක්‍රියාත්මක වේ.

1. ඇඟළුම්
2. ආයුර්වේද හා ශාකසාර නිෂ්පාදන සහ රූපලාවණ්‍ය ද්‍රව්‍ය
3. බෝට්ටු හා නෞකා නිපදවීම
4. පොල් සහ පොල් ආශ්‍රිත නිෂ්පාදන
5. ඉදිකිරීමේ සේවා
6. අධ්‍යාපනික සේවා
7. විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික් උපාංග
8. අපනයන නිෂ්පාදන ගම්මාන

9. මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ
10. තොරතුරු සන්නිවේදන තාක්ෂණය/ ව්‍යාපාරික ක්‍රියාවලි කළමනාකරණය
11. අලෝක ඉංජිනේරු කටයුතු
12. සැපයුම්දාම කළමනාකරණය
13. සමුද්‍රීය සහ අක්වෙරළ ඉංජිනේරු කටයුතු
14. ඛනිජ ද්‍රව්‍ය පාදක නිෂ්පාදන
15. ජාතික තත්ත්වපාලන යටිතල පහසුකම්
16. කාබනික නිෂ්පාදන
17. විසිතුරු මසුන්
18. ඖෂධ ද්‍රව්‍ය
19. සැකසුම් කළ ආහාර සහ පානවර්ග
20. ප්‍රාදේශීය සංවර්ධනය
21. රබර් සහ රබර් ආශ්‍රිත නිෂ්පාදන හා ප්ලාස්ටික්
22. මුහුදු ආහාර සහ ජලජීවී අංශය
23. කුළුබඩු සහ සාන්ද්‍රණ
24. වෙළඳ ප්‍රවර්ධනය සහ වෙළඳ තොරතුරු

ආයුර්වේද සහ ශාකසාර නිෂ්පාදන, මැණික් හා ස්වර්ණාභරණ, සමුද්‍රීය සහ අක්වෙරළ ඉංජිනේරු කටයුතු, කුළුබඩු සහ සාන්ද්‍රණ, සහ අධ්‍යාපනික සේවා යන අංශ සඳහා 2024 වර්ෂය තුළ උපදේශක කමිටු රැස්වීම් හයක් (06) පවත්වන ලදී.

**ආ) ජාත්‍යන්තර මට්ටම:**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාල, ශ්‍රී ලංකාවේ පිහිටි විදේශීය තානාපති කාර්යාල, ජාත්‍යන්තර වෙළඳ මණ්ඩල, සහ වෙළඳ ප්‍රවර්ධන ආයතන සමඟ ප්‍රබල සහයෝගීතාවයන් වැඩිදියුණු කරගෙන තිබේ.

සමාප්තිය වශයෙන්, ආයතනික පාලනයේ ඉහළතම ප්‍රමිත ආරක්ෂා කිරීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය කැපවී සිටියි. ආයතනයේ මෙහෙයුම්වලට අදාළ සියලුම කරුණුවලදී විනිවිදභාවය, වගවීම සහ සදාචාරාත්මක චර්යාව ප්‍රවර්ධනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය අඛණ්ඩව කැපවී සිටියි.

## අවදානම් විශ්ලේෂණය

නව නිපැයුම් සහ සේවා සඳහා ශ්‍රී ලංකාව ප්‍රධාන අපනයන කේන්ද්‍රස්ථානයක් බවට පත්කිරිමේ අරමුණ පෙරදැරි කර ගනිමින්, නවෝත්පාදන, ව්‍යවසායකත්වය හා ගෝලීය සැපයුම්දාම සමඟ ඒකාබද්ධ වීම තුලින් අපනයන තරඟකාරිත්වය තහවුරු කිරිම සඳහා ගතික පරිසරයක් තුල ක්‍රියාත්මක වීමේදි අපනයන සංවර්ධන මණ්ඩලය මුහුණපාන අවදානම හඳුනා ගැනීම හා ඒවා අවම කරගැනීම අවදානම් විශ්ලේෂණයේ අරමුණ වේ.

### අභ්‍යන්තර මෙහෙයුම් අවදානම්

**1. මානව සම්පත් හිඟතාවය:**

විදේශ රැකියා සඳහා හෝ වෙනත් විදේශ රටවලට සංක්‍රමණය වීම සඳහා නිලධාරීන් රැකියාවලින් ඉවත්වීමේ වර්තමාන ප්‍රවණතාවය හේතුවෙන් අපනයන සංවර්ධන මණ්ඩලයේ කාර්ය සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා අවදානමක් ඇතිව තිබේ. මෙයට පිළියමක් ලෙස, අදාළ කාර්යයන් නිසි කලට ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ක්‍රමෝපායික ආකාරයෙන් අවශ්‍ය බඳවා ගැනීම් සැලසුම් කිරීම අවශ්‍ය කෙරේ.

**2. මූල්‍යමය පරායත්ත බව:**

මහා භාණ්ඩාගාරයෙන් වෙන් කරනු ලබන අරමුදල් මත රඳා පැවතීම හේතුවෙන් සිය සංවර්ධන හා පරිපාලන කාර්යයන් දියත් කිරීමේ දී අපනයන සංවර්ධන මණ්ඩලය මූල්‍ය අවදානම්වලට මුහුණ දෙනු ලැබේ. අරමුදල් මූලාශ්‍ර විවිධාංගීකරණය කරගැනීම උදෙසා පුද්ගලික අංශය, විභව්‍ය අරමුදල් ප්‍රදානකරුවන් සහ රාජ්‍ය නොවන සංවිධාන සමඟ සහයෝගීතාවයන් වර්ධනය කරගැනීම මඟින් මෙම අවදානම මඟහරවා ගත හැකි ය.

### අපනයන කර්මාන්ත ක්ෂේත්‍රය සම්බන්ධ අවදානම්

**1. වෙළඳපොළ අවදානම:**

ගෝලීය ආර්ථික අවිනිශ්චිතතාවයන්, භූ-දේශපාලනික පීඩනය සහ විචලනය වන්නා වූ පාරිභෝගික රුචිකත්වයන් ශ්‍රී ලංකාවේ අපනයනවල ඉල්ලුම කෙරෙහි බලපෑ හැකි ය. අපනයන සංවර්ධන මණ්ඩලය විසින් මෙම වෙළඳපොළ ප්‍රවණතා සමීප ආකාරයෙන් අධීක්ෂණය කිරීම, අපනයන වෙළඳපොළවල් විවිධාංගීකරණය කිරීම, සහ මෙම අවදානම මඟ හැරවීම සඳහා වෙළඳපොළ සම්බන්ධයෙන් වටිනාකමක් ඇති තොරතුරු වැඩිකරගැනීම සිදුකරනු ලැබේ.

**2. වෙළඳ ප්‍රතිපත්තිවල අවදානම:**

තීරු බදු සහ තීරු බදු නොවන බාධක ඇතුළුව වෙළඳ ප්‍රතිපත්ති හා රෙගුලාසිවල සිදුවන වෙනස්වීම් අපනයන තරඟකාරිත්වය කෙරෙහි බලපෑ හැකි ය. මෙම විභව්‍ය සෘණාත්මක බලපෑම් මඟහරවා ගැනීම සඳහා අදාළ පාර්ශවකරුවන් සමඟ අපනයන සංවර්ධන අමාත්‍ය සභාව හරහා කටයුතු කිරීම, දැනුවත් කිරීමේ මෙහෙයුම් සිදුකිරීම සහ ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ සැපයීම යන කාර්යය අපනයන සංවර්ධනය මණ්ඩලය විසින් සිදුකරනු ලැබේ.

**3. සැපයුම් දාම අවදානම්:**

අමුද්‍රව්‍යවල හිඟතාවය, ප්‍රවාහන අවහිරතා හා භූ-දේශපාලනික ගැටලු ඇතුළුව සැපයුම් දාමවල ඇතිවන බාධා අපනයන නිෂ්පාදනය හා බෙදාහැරීම කෙරෙහි බලපානු ලැබිය හැකි ය. සැපයුම් දාම අවදානම් මඟ හරවා ගැනීම සඳහා සැපයුම් මූලාශ්‍ර විවිධාංගීකරණය කරගැනීම, කාර්ය සැපයුම් කාර්යක්ෂමතාවය වැඩිදියුණු කරගැනීම සහ ඩිජිටල් තාක්ෂණය යොදා ගැනීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය අපනයනකරුවන් සමඟ කටයුතු කරනු ලැබේ.

**4. මූල්‍ය අවදානම:**

විනිමය අනුපාතික, පොලී අනුපාතිකවල විචලනයන් සහ ණය අවදානම්, අපනයනකරුවන්ගේ මූල්‍ය ස්ථාවරත්වය කෙරෙහි බලපානු ලැබිය හැකිය. මූල්‍ය අවදානම් මඟ හරවා ගැනීම සඳහා උපදේශන සේවා සැපයීම, හෙජිං යාන්ත්‍රණ ප්‍රවර්ධනය කිරීම, සහ මූල්‍ය අරමුදල් වෙත ප්‍රවේශය සඳහා පහසුකම් සැපයීම, අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සිදුකරනු ලැබේ.

**5. අනුකූලතා අවදානම්:**

තත්ත්ව පාලන ප්‍රමිතීන්, පාරිසරික රෙගුලාසි, සහ කම්කරු නීති ඇතුළුව නියාමන අවශ්‍යතා සමඟ අනුකූල නොවීම ඔස්සේ කීර්තිනාමයට හානිවීම සහ නෛතික ගැටලු පැන නැඟීම සිදුවිය හැකි ය. අනුකූලතා අවදානම් මඟ හරවා ගැනීම සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් ලබාදීම, විගණන සිදුකිරීම, සහ යහපත් පරිචයන් ප්‍රවර්ධනය කිරීම අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සිදු කෙරේ.

**6. තාක්ෂණික අවදානම:**

තාක්ෂණයේ සීඝ්‍ර වැඩිදියුණුවීම් සහ ඩිජිටල් අවහිරතා ශ්‍රී ලංකාවේ අපනයනවල තරඟකාරිත්වය කෙරෙහි බලපෑ හැකි ය. තාක්ෂණික අවදානම් මඟහරවා ගැනීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් තාක්ෂණික අනුගතවීම් ප්‍රවර්ධනය, ඩිජිටල් පුහුණු වැඩසටහන් ලබාදීම සහ තාක්ෂණික විසඳුම් සඳහා ප්‍රවේශවීමට පහසුකම් සැලසීම සිදුකෙරේ.

**7. ස්වභාවික ආපදා අවදානම:**

ගං වතුර සහ නියං තත්ත්වයන් ඇතුළු ස්වාභාවික ආපදාවලට ශ්‍රී ලංකාව ගොදුරුවීමේ අවදානමක් පවතින අතර එමඟින් අපනයන ක්‍රියාකාරකම්වලට බාධා ඇති වේ. ස්වභාවික අවදානම් මඟහරවා ගැනීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් අදාළ නියෝජිතායතන සමඟ සහයෝගීතාවයෙන් කටයුතු කිරීම, ආපදා තත්ත්වයන් සඳහා පෙර සූදානම්වීමේ සැලසුම් සකස් කිරීම සහ එවැනි බලපෑම්වලට ලක්වූ අපනයනකරුවන් සඳහා සහාය ලබාදීම සිදුකෙරේ.

**8. දේශපාලනික අවදානම:**

දේශපාලනික අස්ථාවරබව, නියාමන කාර්යයන්ගේ වෙනස්වීම් සහ වෙළඳ ආරවුල් අපනයන මෙහෙයුම් කෙරෙහි බලපෑ හැකි ය. දේශපාලනික අවදානම් කළමනාකරණය කරගැනීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් දේශපාලනික ප්‍රවණතා අධීක්ෂණය කිරීම, අවදානම් තක්සේරු ලබාදීම සහ අපනයනකරුවන් වෙත සහාය ලබාදීම සිදු කෙරේ.

මෙම අවදානම් මධ්‍යයේ වුව ද, අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ශ්‍රී ලාංකික අපනයනකරුවන් සඳහා සහාය ලබාදීමට කැපවී සිටින අතර අවදානම් මඟ හැරවීම සහ තිරසර අපනයන සංවර්ධනයක් සඳහා පවතින අවස්ථා ලබාගැනීම සඳහා වන ප්‍රගාමී පියවර ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව සිදු කෙරේ.

# අපනයන කාර්යසාධනය 2024

# 1. අපනයන අංශයේ ක්‍රියාකාරිත්වය - 2024

## 1.1 සමස්ත නිරීක්ෂණය

ගෝලීය ආර්ථික අභියෝග මධ්‍යයේ වුව ද, ශ්‍රී ලංකාවේ අපනයන අංශය 2024 වර්ෂය තුළ දී සිය ඔරොත්තු දීමේ හැකියාව සහ ස්ථාවර වර්ධනයක් පෙන්නුම් කරන ලදී. 2023 වර්ෂයට සාපේක්ෂව වාර්ෂිකව 7.52% ක වර්ධනයක් පෙන්නුම් කරමින්, වෙළඳ සහ සේවා අපනයන ඇතුළුව සමස්ත අපනයන ආදායම ඇ.ඩො. මිලියන 16,243.47 ක මට්ටමට ළඟා විය.

නිරන්තරයෙන් වෙනස්වන වෙළඳ ගතිකත්වයන් මධ්‍යයේ වුව ද, ශ්‍රී ලංකාවේ අපනයන අංශයේ ඔරොත්තු දීමේ හැකියාව සහ අඛණ්ඩ විභවය මෙම ක්‍රියාකාරිත්වය මගින් අවධාරණය කෙරේ.

2024 වර්ෂයේ දී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම ඇ.ඩො. මිලියන 12,771.94ක් දක්වා 2023 වර්ෂයට සාපේක්ෂව 7.23% ක ඉහළ යෑමක් සිදුවූ අතර, ඉතිහාසය තුළ වාර්ෂික අපනයන ආදායම ආශ්‍රිතව දෙවැනියට වාර්තා වී ඇති ඉහළතම අගය මෙය වේ. පෙට්රෝලියම් නිෂ්පාදනවලින් (නැව් සඳහා ඉන්ධන සැපයුම් පරිමාව වැඩිවීම) පළමු වරට ඇ.ඩො. බිලියන 1 සීමාව ඉක්මවා ලැබූ ආදායම මෙම ඉහළ යෑමට හේතු විය.

මීට අමතරව, 2023 වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂයේ දී සේවා අපනයන ආදායම ඇ.ඩො. මිලියන 3,471.53 දක්වා ළඟාවෙමින් 8.58%ක වර්ධනයක් වාර්තා කරන ලදී. තොරතුරු සන්නිවේදන තාක්ෂණ/ ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණය, ඉදිකිරීම් සේවා, මූල්‍ය සේවා සහ ප්‍රවාහන සහ සැපයුම්දාම කළමනාකරණය යනාදිය සේවා අපනයන වශයෙන් සැලකේ.

2022, 2023 සහ 2024 වර්ෂවල දී අපනයන අංශයේ ක්‍රියාකාරිත්වය පහත ප්‍රස්තාරය මගින් නිරූපණය වේ.

- වෙළඳ අපනයන
- සේවා අපනයන



## 1.2 ප්‍රධාන අපනයන කාණ්ඩ වශයෙන් සැලකූ විට අපනයන අංශයේ ක්‍රියාකාරිත්වය

2022, 2023 සහ 2024 වර්ෂවල දී ප්‍රධාන අපනයන කාණ්ඩවල ක්‍රියාකාරිත්වය ඇ.ඩො. වලින් පහත සංඛ්‍යා සටහන මගින් දක්වා ඇත.

සංඛ්‍යා සටහන 1: ප්‍රධාන අපනයන කාණ්ඩවල ක්‍රියාකාරිත්වය - 2022, 2023 සහ 2024

| | 2022 (ඇ.ඩො. මිලියන) | 2023 (ඇ.ඩො. මිලියන) | වර්ධනය % | 2024 (ඇ.ඩො. මිලියන) | වර්ධනය % |
|---|---|---|---|---|---|
| කෘෂිකාර්මික සහ මත්ස්‍ය අපනයන | 2,952.02 | 2,911.84 | -1.36 | 3,188.16 | 9.49 |
| කාර්මික අපනයන | 10,154.40 | 8,998.96 | -11.38 | 9,583.78 | 6.50 |
| සේවා අපනයන | 1,889.00 | 3,197.28 | 69.26 | 3,471.53 | 8.58 |
| **සමස්ත වෙළඳ සහ සේවා අපනයන** | **14,995.42** | **15,108.08** | **0.75** | **16,243.47** | **7.52** |

මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා රේගුව සහ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

සමස්ත අපනයන ආදායමෙන් 20%ක් වූ කෘෂිකාර්මික අපනයන ඇ.ඩො. මිලියන 3,188.6 ක් දක්වා පෙර වර්ෂයට සාපේක්ෂව 9.49% කින් ඉහළ ගොස් ඇත. මෙම කාල සීමාව තුළ දී කෘෂිකාර්මික අංශයේ සියලු ප්‍රධාන නිෂ්පාදනවල (තේ, ස්වාභාවික රබර්, පොල් ආශ්‍රිත නිෂ්පාදන, කුළුබඩු, එළවළු, පලතුරු, කැපූ ශාක පත්‍ර හා අතු, සගන්ධ තෙල් සහ අනෙකුත් අපනයන භෝග) සැලකිය යුතු ඉහළ යෑමක් වාර්තා විය.

ක්‍රමයෙන් ඉහළ යන ගෝලීය ඉල්ලුම, තරඟකාරී මිල ගණන්, සහ වෙළඳපොළ විවිධාංගීකරණය හේතුවෙන්, ශ්‍රී ලංකාවේ කාර්මික අපනයනයන්, විශේෂයෙන් ඇඟළුම් සහ රබර් ආශ්‍රිත නිෂ්පාදන, 2024 වර්ෂයේ දී වර්ධනය විය. ඇඟළුම් අපනයනයන් තිරසර සහ භෞතික ක්‍රියාකාරකම් සඳහා විශේෂණය වූ ඇඟළුම් වැනි ඉහළ අගයක් සහිත කාණ්ඩ වෙත පුළුල් වූ අතර, කාර්මික සහ ශල්‍ය අත්වැසුම් සඳහා වූ ඉහළ ගිය ඉල්ලුම හේතුවෙන් රබර් ආශ්‍රිත අපනයන සඳහා වාසිදායක තත්ත්වයක් ඇති විය.

## 1.3 2024 වර්ෂයේ අපනයනවල සංයුතිය

සමාලෝචිත වර්ෂයේ දී අපනයනවල සංයුතිය එක් එක් කාණ්ඩ වශයෙන් වෙන්කර පහත ප්‍රස්තාරය මගින් දැක්වේ. ශ්‍රී ලංකාවේ සමස්ත අපනයන ආදායමෙන් ආසන්න වශයෙන් 50% ක් ලැබෙනුයේ නිෂ්පාදිත සිවු වර්ගයකින්, එනම් ඇඟළුම් (31%), තේ (8.8%), රබර් ආශ්‍රිත නිෂ්පාදන (6%) සහ පොල් ආශ්‍රිත නිෂ්පාදන (5.3%) වලට අදාළව බව එමඟින් අනාවරණය වේ. සමස්ත අපනයන පිරිවැටුමෙන් ආසන්න වශයෙන් 90% ක් ලැබෙනුයේ නිෂ්පාදිත වර්ග 10 කින් සහ සේවා කාණ්ඩ 2 කින් වන අතර, ශ්‍රී ලංකාවේ අපනයන සංයුතියේ විවිධාංගීකරණයේ පවතින ඌනතාවය මෙමඟින් පිළිබිඹු කෙරේ.

**2024 වර්ෂයේ ශ්‍රී ලංකාවේ අපනයනවල සංයුතිය**




මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා රේගුව සහ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

## 1.4 ප්‍රධාන වෙළඳපොළවල් වෙත සිදුකරන ලද අපනයනයන්

2024 වර්ෂයේ දී ප්‍රධාන වෙළඳපොළවල් තුළ අපගේ අපනයනයන්ගේ පංගුව පහත ප්‍රස්තාරය මගින් දැක්වේ.

අපගේ සමස්ත අපනයනවලින් 23% ක් (ඇ.ඩො. වලින් සැලකූ විට) ලබා ගනිමින් ඇමරිකා එක්සත් ජනපදය ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත සඳහා ප්‍රමුඛතම අපනයන ගමනාන්තය වශයෙන් අඛණ්ඩව පවතින අතර, වරහන් තුළ දක්වා ඇති ප්‍රතිශතාත්මක අගයන් වලින් දැක්වෙන පංගුවලට දායක වෙමින් මීට පසුපසින් පවතින අපනයන වෙළඳපොළවල් වනුයේ එක්සත් රාජධානිය (7.21%), ඉන්දියාව (6.9%), ජර්මනිය (4.9%), ඉතාලිය (4.6%), නෙදර්ලන්තය (3.1%), එක්සත් අරාබි එමීර් රාජ්‍යය (2.6%), කැනඩාව (2.5%), ප්‍රංශය (2.1%) සහ චීනය (1.9%) වේ. 2023 වර්ෂයේ අනුරූප කාල සීමාවලට සාපේක්ෂව 2024 වර්ෂයේ දී ඇමරිකා එක්සත් ජනපදය වෙත සිදුකළ අපනයනවල වටිනාකම ඇ.ඩො. මිලියන 903.72 කින් එනම් 6.8% ක ඉහළ යෑමක් සිදු වී ඇත.

**ප්‍රධාන අපනයන ගමනාන්ත - 2024**




මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා රේගුව සහ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

### 1.5 ගෝලීය වශයෙන් පවතින ප්‍රධාන කලාප වෙත සිදුකරන ලද අපනයනයන්

2024 වර්ෂයේ දී ප්‍රධාන කලාප තුළ ශ්‍රී ලංකාවේ වෙළඳ අපනයන ආශ්‍රිත ක්‍රියාකාරිත්වය පහත ප්‍රස්තාරය මගින් දැක්වේ.

**ගෝලීය ප්‍රධාන අපනයන කලාප - 2024**




මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා රේගුව සහ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

## 2. 2024 වර්ෂය තුළ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සිදුකළ සංවර්ධන ක්‍රියාකාරකම්හි ප්‍රගතියේ සාරාංශයක්

### 2.1. අපනයන සංවර්ධනය සහ ප්‍රවර්ධනය සඳහා ආංශික ක්ෂේත්‍ර

#### 2.1.1 තොරතුරු සන්නිවේදන තාක්ෂණ/ ව්‍යාපාරික ක්‍රියාවලි කළමනාකරණය ආශ්‍රිත ක්ෂේත්‍රය

- **උතුරු ඇමරිකාව සමඟින් ව්‍යාපාරික සබැඳි වැඩසටහන**

  තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ අංකුර ව්‍යවසාය සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා වූ උතුරු ඇමරිකාව සමඟ ව්‍යාපාරික සබැඳි වැඩසටහන පිළිබඳ වෙබිනාර් වැඩමුළුව සහභාගිකයන් 86 දෙනෙකුගේ සහභාගිත්වයෙන් දෙසැම්බර් මාසයේ දී පවත්වන ලදී. ගෝලීය වශයෙන් තොරතුරු තාක්ෂණය ආශ්‍රිත ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම පිළිබඳ විවරණය, උතුරු ඇමරිකාවේ පවතින ප්‍රවණතා සහ වෙළඳපොළ වෙත ප්‍රවේශය හා එකී කටයුතුවල නිරතවීම ඉහළ නැංවීම යනාදිය මෙහිදී සාකච්ඡා කළ ප්‍රධාන මාතෘකා විය.

- **ජපාන වෙළඳපොළ ඉලක්ක කරගත් Japan Market Development Programme නැමති වැඩසටහන (ජයිකා ආයතනයේ තාක්ෂණ සහයෝගිතාවය සමඟින් "තොරතුරු සන්නිවේදන තාක්ෂණ/ ව්‍යාපාරික ක්‍රියාවලි කළමනාකරණය ආශ්‍රිතව ජපාන වෙළඳපොළ වෙත ප්‍රවේශය සඳහා සහාය ප්‍රවර්ධනය කිරීම")**

  ජපාන වෙළඳපොළ සමඟින් තාක්ෂණ සමාගම් හා අංකුර ව්‍යවසායන් සම්බන්ධ කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය සමඟ හවුල්කාරිත්වයෙන් වසර 02ක ව්‍යාපෘතියක් (2024-2025) ඔස්සේ මෙරට තොරතුරු සන්නිවේදන

තාක්ෂණ/ ව්‍යාපාරික ක්‍රියාවලි කළමනාකරණ ක්ෂේත්‍රය වැඩිදියුණු කිරීමේ නියැලී සිටී. තාක්ෂණික මඟ පෙන්වීම සහ දැනුවත් කිරීමේ සැසි පවත්වනු ලබන ජයිකා උපදේශකයන්ගේ සහාය ඇතිව ක්‍රියාත්මක වන මෙම ප්‍රයත්නයට වෙළඳපොළ වාණිජමය අගයන් ඇති තොරතුරු ලබාදීම, ව්‍යාපාරික පුහුණු සහ ව්‍යාපාරික කටයුතු ගැලපුම් කිරීමේ සේවා ඇතුළත් වේ.

ජයිකා ආයතනයේ උපදේශකවරු දෙදෙනෙකු විසින් තෝරාගත් සමාගම් 30ක් සඳහා එක් එක් ආයතනය වෙත වෙන් වෙන් වශයෙන් උපදෙස් ලබාදීම සිදුකළ අතර, මෙම සමාගම් සඳහා ජපාන පාර්ශවයෙන් යෝග්‍ය හවුල්කරුවන් තෝරාගැනීම සඳහා ප්‍රයත්න දරමින් සිටී. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ නිලධාරීන් සඳහා "පුහුණුකරුවන් පුහුණු කිරීමේ" වැඩසටහනක් සමඟින් ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය සඳහා දැනුවත් කිරීමේ සැසි දෙකක් පවත්වන ලදී.

- **ජර්මනිය / යුරෝපා සංගමය තුළ ශ්‍රී ලංකාව සඳහා වෙළඳපොළ දියුණු කිරීමේ වැඩසටහන** යෝජනාවක් ඉදිරිපත් කිරීමෙන් සහ තොරතුරු අනාවරණය කරගැනීමේ දූත මෙහෙවරක් සහ ආනයන ප්‍රවර්ධන කවුළුවක් (IPD) ස්ථාපනයෙන් අනතුරුව, ජර්මනිය විසින් විභව්‍ය තොරතුරු සන්නිවේදන තාක්ෂණ සේවා සැපයීමේ ගමනාන්තයක් වශයෙන් ශ්‍රී ලංකාව තෝරාගන්නා ලදී. මෙම වැඩසටහන යටතේ වැඩිදුරටත් සහාය ලබාදීම සඳහා ශ්‍රී ලංකාවේ සමාගම් පහක් තෝරාගෙන තිබේ.
- **GITEX Global සහ GITEX NorthStar වෙළඳ ඉසව්ව (2024 ඔක්තෝබර් 13-19 දක්වා)**

  ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ඩුබායිහි ශ්‍රී ලංකා කොන්සියුලර් ජෙනරාල් කාර්යාලය සමඟ හවුල්කාරිත්වයෙන් 2024 ඔක්තෝබර් 13 සිට 19 දක්වා පැවති EDB, GITEX Expand North Star සඳහා ශ්‍රී ලංකාවේ සහභාගිත්වය සංවිධානය කරන ලදී. තොරතුරු සන්නිවේදන තාක්ෂණ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්/ අංකුර ව්‍යවසායකයන් සමඟින් මෙරට තොරතුරු සන්නිවේදන තාක්ෂණ කර්මාන්තය විදහා දක්වමින්, කර්මාන්තයේ නව ප්‍රවණතා සහ තාක්ෂණ නවෝත්පාදන සම්බන්ධිත සියුම් විවරණ ලබාගනිමින් ගෝලීය තොරතුරු තාක්ෂණ ප්‍රජාව සමඟ සම්බන්ධ වන අතරම, ශ්‍රී ලංකාවේ නවෝත්පාදන ප්‍රවර්ධනය සහ ජාත්‍යන්තර හවුල්කාරිත්වයන් වැඩිදියුණු කරගැනීම සඳහා ව්‍යාපාරික රැස්වීම්, ජාලගත සැසි, සහ ක්ෂේත්‍ර චාරිකා මෙම ප්‍රයත්නය සඳහා ඇතුළත් විය.

### 2.1.2 කුළුබඩු සහ සාන්ද්‍රණ ක්ෂේත්‍රය

- **ශ්‍රී ලංකාවේ කුළුබඩු (Ceylon Spices), ශ්‍රී ලංකාවේ කුරුඳු (Pure Ceylon Cinnamon) සඳහා ලියාපදිංචි යෝජනා ක්‍රම සහ ආරක්ෂිත භූගෝලීය දර්ශක (PGI)**

  ශ්‍රී ලංකාවේ කුරුඳු සඳහා ආරක්ෂිත භූගෝලීය දර්ශක තත්ත්වය ලබාදීම සඳහා සමාගම් 55ක් සහතිකකරණය කරන ලද අතර අතිරේක ගිවිසුම් 11ක් දැනට සකස් කරමින් පවතී. Pure Ceylon

Cinnamon බලපත්‍ර තුනක් නිකුත් කර තිබේ. භූගෝලීය දර්ශක ආරක්ෂාව ලබාගත් පළමු කුරුඳු සාම්පලය ජර්මනිය වෙත නැව්ගත කර තිබේ.

- **ශ්‍රී ලංකාවේ කුරුඳු (Ceylon Cinnamon) චීන වෙළඳපොළ වෙත ඇතුළත් වීම සඳහා වැඩසටහන**

මෙම වැඩසටහන සඳහා සමාගම් හතලිස් හතක් ලියාපදිංචි වූ අතර, චීනය වෙත අපනයන සිදුකිරීමට සහතිකකරණය ලබාදීම පිණිස ජාතික ශාක නිරෝධායන සේවාව විසින් එයින් සමාගම් තිහක් විගණනය කරන ලදී. බීජිංහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සමඟ සහයෝගිතාවයෙන් චීන රේගු අධිකාරිය (China's General Administration of Customs - GACC) විසින් අගෝස්තු 28-29 දෙදින තුළ මාර්ගගත ආකාරයෙන් විගණනයක් සිදුකරන ලදී. මීට අමතරව, ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාවේ (IFC) මූල්‍ය සහ තාක්ෂණික සහාය ඇතිව වීඩියෝපටයක්, රූපවාහිනී ස්ලයිඩ, විද්‍යුත් පත්‍රිකාවක් ඇතුළුව ප්‍රවර්ධන ද්‍රව්‍ය සකස් කළ අතර, ඒවා චීනයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය වෙත ලබාදෙන ලදී.

- **යුරෝපා සංගමය කලාපයේ ජාත්‍යන්තර ආහාර ප්‍රදර්ශන සඳහා සහභාගිත්වය (ස්වාභාවික අමුද්‍රව්‍ය, සිලෝන් සිනමන්, පියෝ සිලෝන් සිනමන් සහ ආරක්ෂිත භූගෝලීය දර්ශක ලකුණු ප්‍රවර්ධනය කිරීම) - Biofach 2024 (ජර්මනියේ නියුරෙම්බර්ග්හි දී 2024 පෙබරවාරි 13 සිට 16 වැනි දින දක්වා)**

ආරක්ෂිත භූගෝලීය දර්ශක සහතිකකරණය ලද කුරුඳු නිෂ්පාදකයන් තිදෙනෙකු ද ඇතුළුව අපනයන සමාගම් 15ක සහභාගිත්වය අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සංවිධානය කරන ලදී. මෙම සමාගම් විසින් පොල්, නැවුම් පලතුරු, පිරිසැකසූ ආහාර, කුළුබඩු, සහ සාන්ද්‍රණ වැනි නිෂ්පාදන මෙම ප්‍රදර්ශනයේ දී ඉදිරිපත් කරන ලදී. මහා පරිමාණ සමාගම් හතරක් ඔවුන්ගේ සහභාගිත්වය සඳහා සිය මුදලින් වැය දරන ලද අතර, අපනයන සංවර්ධන මණ්ඩලය, ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය (ITC), ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාවේ (IFC) සහ ජර්මනියේ ආනයන ප්‍රවර්ධන කවුළුව විසින් සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා සහයෝගය දක්වන ලදී. ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය විසින් සහාය දක්වන ලද ඉවුම් පිහුම් ප්‍රදර්ශනයක දී ආරක්ෂිත භූගෝලීය දර්ශක සහතිකකරණය සහිත සිලෝන් සිනමන් නිෂ්පාදන ජාත්‍යන්තර වශයෙන් පළමුවරට එළි දක්වන ලදී. එසේ ඉදිරිපත් කරන ලද නව නිෂ්පාදනවලට කුරුඳු නිස්සාරකය, කුරුඳු රසය සහිත පානවර්ග, සහ රස ගන්වන ලද පොල් චිප්ස් ඇතුළත් විය.

### 2.1.3 බෝට්ටු සෑදීමේ ක්ෂේත්‍රය

- **ඩුබායි ජාත්‍යන්තර බෝට්ටු ප්‍රදර්ශනය 2024 (2024 පෙබරවාරි 28 – 2024 මාර්තු 04 දක්වා)**

  මෙම ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකාවේ සමාගම් 03 ක සහභාගිත්වය අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සංවිධානය කරන ලද අතර සහභාගී වූ සමාගම් වෙත නව විමසීම් 30ක් පමණ ලැබුණු අතර සාධනීය සම්බන්ධවීම් 05කට (ඩුබායි, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ඉන්දියාව) අදාළව එකඟතා ඇතිකර ගැනීම් දැනට සිදුවෙමින් පවතී. මෙම ඩුබායි ජාත්‍යන්තර බෝට්ටු ප්‍රදර්ශනයට සමගාමීව සංවිධානය කළ සම්මන්ත්‍රණයක දී, ශ්‍රී ලංකාවේ බෝට්ටු කර්මාන්ත ක්ෂේත්‍රයේ හැකියාවන් සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කිරීමේ අවස්ථාවක් ශ්‍රී ලංකාවේ සහභාගිකයන්ට ලැබුණි. ඒ අනුව, “බෝට්ටු කර්මාන්තයේ දී ශ්‍රී ලංකාවේ තරඟකාරී ස්ථානය” මැයෙන් ශ්‍රී ලංකාවේ හැකියාවන් 2024 මාර්තු 02 දිනැතිව ඩුබායි වරායේ දී ඉදිරිපත් කරන ලදී.

- **කප්පරතොට දියකඩනය ඉදිකිරීම සම්බන්ධයෙන් වන පාරිසරික බලපෑම් ඇගයීම් (EIA) වාර්තාව සහ ශක්‍යතා අධ්‍යයනය නිමා කිරීම**

  මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා 2024 අගෝස්තු මස 14 දිනැතිව අදාළ පාර්ශවකරුවන් සමඟ වූ රැස්වීමක් ධීවර අමාත්‍යාංශයේ දී සංවිධානය කරන ලදී. වැලිගම පිහිටි කප්පරතොට යන ස්ථානය වෙත ක්ෂේත්‍ර චාරිකාවක් 2024 අගෝස්තු 28 වැනි දිනැතිව සංවිධානය කරන ලද අතර ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA), මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය (CECB), සහ වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යන ආයතනවල නිලධාරීන් සහ පුද්ගලික අංශයේ නියෝජිතවරු මීට සහභාගී විය. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා නිෂ්කාශනයන් ලබාගැනීම සඳහා අදාළ ආයතන සමඟ පසුවිපරම් කටයුතු ඉටුකරමින් පවතී.

### 2.1.4 ආහාර සහ පානවර්ග සම්බන්ධිත ක්ෂේත්‍රය

- **Gulfood 2024 ප්‍රදර්ශනය (2024 පෙබරවාරි 19-23 වැනි දින දක්වා ලෝක වෙළඳ මධ්‍යස්ථානය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය)**

  ගෝලීය වශයෙන් පවත්වනු ලබන ආහාර හා පාන වර්ග සම්බන්ධිත විශාලතම ප්‍රදර්ශන අතුරින් එකක් වන ඩුබායිහි ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ දී පැවති Gulfood 2024 සඳහා සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය 10 ක් ඇතුළුව

ශ්‍රී ලාංකික සමාගම් 36ක සහභාගිත්වය අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සංවිධානය කරන ලදී. ඇමරිකානු ඩොලර් මිලියන 11ක වටිනාකමකින් යුතු තහවුරු කරන ලද ඇණවුම් සංඛ්‍යාවක් ශ්‍රී ලාංකික සමාගම් විසින් හිමිකර ගත් අතර, මෙයින් ඇ.ඩො. මිලියන 4.6ක ඇණවුම් දැනටමත් ක්‍රියාත්මක කර ඇති අතර, ඉතිරි ඇ.ඩො. මිලියන 7කට අදාළ ඇණවුම් සම්බන්ධයෙන් එකඟතා ඇතිකරගැනීම් සිදුකරමින් පවතී. අච්චාරු දැමූ පොළොස්, කෙසෙල් මුව, කෙසෙල් ගෙඩි පවුඩර් සීරියල්, පොල් සීනි, අඩු මේදය සහිත ඩෙසිකේට් පොල්, සහ මඤ්ඤොක්ක පිටි/ පිෂ්ටය වැනි ශ්‍රී ලංකාවේ ශාකමය සහ ස්වභාවික නිෂ්පාදන සම්බන්ධයෙන් ගැනුම්කරුවන් විසින් වැඩි උනන්දුවක් දක්වන ලදී. පෝලන්තය, සී-ෂෙල්ස්, සර්බියාව, තුර්කිය, ස්පාඤ්ඤය, ජර්මනිය, පලස්තීනය ඇතුළුව නව වෙළඳපොළවල් වෙත බොහෝ සාමාජිකයන් සාර්ථක අන්දමින් ඇතුළත් විය. Alpex Ceylon's Fusion 4U, Tropikal Life's Life, F&V Association's GreenLife, SmartCrisp, සහ Rancrisp's Grill Master වැනි නව සන්නාම ජාත්‍යන්තර වශයෙන් එළි දැක්වීම ද සමාගම් කිහිපයක් විසින් සිදුකරන ලදී.

- **යුරෝපා සංගමයේ රටවල් වෙත ෆෙයා ට්‍රේඩ් නිෂ්පාදන අපනයනයන් ඉහළ නැංවීම සඳහා වන සහයෝගීතා රාමුව (FoC)**

  ජාත්‍යන්තර වෙළඳපොළවල් කරා වෙළඳ සබඳතා වැඩිදියුණු කිරීමට සහ ශ්‍රී ලංකාවෙන් සිදුකරන ෆෙයා ට්‍රේඩ් නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම පිණිස අපනයන සංවර්ධන මණ්ඩලය සහ ෆෙයාට්‍රේඩ් ජාලයන් අතර සහයෝගිතා රාමුවක් 2024 ජනවාරි මාසයේ දී අත්සන් තබන ලදී. තවත් රජයේ ආයතන හතක් සහ බෙල්ජියමේ බ්‍රසල්ස්හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සමඟ එක්වී ෆෙයා ට්‍රේඩ් ආයතන සමඟ ඇති සහයෝගිතාවය සවිමත් කිරීම අපනයන සංවර්ධන මණ්ඩලය විසින් අපේක්ෂා කෙරේ. මෙම ප්‍රයත්නයේ එක් අංගයක් වශයෙන්, තානාපති කාර්යාලය විසින් යුරෝපා පාර්ලිමේන්තුවේ පැවති "Fair Trade Breakfast 2024" වැඩසටහන සඳහා සහභාගී වූ අතර, එහි දී සාධාරණ ශ්‍රමික පරිචයන්, සුරක්ෂිත සහ පරිසර හිතකාමී වැඩ පරිසරයන් සඳහා ලොව ඉහළතම ස්ථානයක් වශයෙන් ශ්‍රී ලංකාව ඉදිරිපත් කරන ලදී. ශ්‍රී ලංකාවේ ෆෙයා ට්‍රේඩ් නිෂ්පාදනවල විවිධත්වය අවධානයට ලක්කරන ලද අතර, යුරෝපා සංගමයේ ආයතනවල සහ ජාත්‍යන්තර ෆෙයා ට්‍රේඩ් සංවිධානවල සහාය ලබාගැනීමේ අවශ්‍යතාවය අවධාරණය කරමින් කර්මාන්තයේ අභියෝග සාකච්ඡා කරන ලදී.

  ෆෙයා ට්‍රේඩ්හි වර්තමාන තත්ත්වය සහ බලපෑම, අනාගත ව්‍යාපෘති අනාවරණය කරගැනීම සහ එක් එක් ක්ෂේත්‍රවලට අදාළ ගැටලු සඳහා විසඳුම් සෙවීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා ප්‍රධාන පාර්ශවකරුවන් එකමුතුකිරීම කේන්ද්‍රීය වශයෙන් සැලකිල්ලට ගෙන අපනයන සංවර්ධන මණ්ඩලය, ෆෙයා ට්‍රේඩ් ආසියා ශාන්තිකර නිෂ්පාදකයන්ගේ ජාලය (NAPP), ෆෙයා ට්‍රේඩ් ආසියා ශාන්තිකර නිෂ්පාදකයන්ගේ ජාලය - ශ්‍රී ලංකාව (FNSL) සහ ලෝක ෆෙයා ට්‍රේඩ් සංවිධානය (WFTO) විසින් පාර්ශවකරුවන්ගේ රැස්වීමක් 2024 දෙසැම්බර් මාසයේ දී කොළඹ මූව් ඇන්ඩ් පික් හෝටලයේ දී පවත්වන ලදී. ප්‍රබල රාජ්‍ය-පුද්ගලික සහයෝගය දක්වාලමින් විවිධ ෆෙයා ට්‍රේඩ් සංවිධාන සහ රජයේ ආයතන මේ සඳහා සහභාගී වූ පිරිසට අයත් විය. මෙම සාධාරණ වෙළඳපොළ කටයුතු තවදුරටත්

ප්‍රගමනය කිරීම සඳහා ඇති කැපවීම සමඟින් සහභාගිකරුවන් විසින් මෙහි කටයුතු අවසන් කළ අතර, බෙල්ජියමේ සහ ප්‍රංශයේ ෆෙයා ට්‍රේඩ් නගර සමඟ ශ්‍රී ලංකාවේ සමාගම් සම්බන්ධ කිරීම සඳහා වූ නව ප්‍රයත්නයක් ද ඔවුන්ගේ 2025 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් විය.

මීට අමතරව, සාධාරණ වෙළඳාම පිළිබඳ සංකල්පය පිළිබඳව දේශීය අපනයනකරුවන් දැනුවත් කිරීමේ අරමුණින් ෆෙයා ට්‍රේඩ් සහතිකකරණය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩමුළු දෙකක් ද පවත්වන ලදී. අපනයනකරුවන්, නිෂ්පාදකයන්, රජයේ නියෝජිතයන්, විශ්වවිද්‍යාල සිසුන් සහ අනෙකුත් පාර්ශවකරුවන් ඇතුළුව 100කට අධික සහභාගිකයන් සංඛ්‍යාවක් මේ සඳහා සහභාගී විණි.







- **සිංගප්පූරුව වෙත සහල් සහ බිත්තර, කුකුළු මස් නිෂ්පාදන අපනයනය කිරීමට වෙළඳපොළ ප්‍රවේශය සඳහා පහසුකම් සැලසීම**

  සිංගප්පූරුවට බිත්තර, කුකුළු මස් ආදි කුකුළු නිෂ්පාදන අපනයනය කිරීමට අදාළ බලපත්‍ර ලබාගැනීමේ අපේක්ෂාවෙන් පසුවන සතුන් මස් පිණිස මැරීමේ ස්ථාන සම්බන්ධයෙන් පූර්ව පරීක්ෂාවක් සිදුකිරීම සඳහා සිංගප්පූරුවේ ආහාර නියෝජිතායතනයේ (SFA) දූත පිරිසක් ශ්‍රී ලංකාවට පැමිණියහ. ස්ථාන හතක් අතුරින්, ස්ථාන තුනක් පරීක්ෂාවට ලක් කළ අතර, සිංගප්පූරු ආහාර නියෝජිතායතනය විසින් ශ්‍රී ලංකාවේ සත්ත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත සිය නිර්දේශ ලබාදෙන ලදී. එම නියෝජිතායතනය විසින් අදාළ ස්ථාන සම්බන්ධයෙන් සිදුකරන අවසාන විගණනය සිදුකිරීමට නියමිතව පවතී.

- **චීන වෙළඳපොළ වෙත අන්නාසි අපනයනය කිරීම සඳහා වෙළඳපොළ ප්‍රවේශයට පහසුකම් සැලසීම**

  මහජන චීන සමූහාණ්ඩුවේ රේගු පොදු පරිපාලනය (GACC, China) සහ ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව අතර අපනයන ක්‍රියාපටිපාටියක් අත්සන් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබේ. ශාක නිරෝධායන සේවය (NPQS), කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ අපනයන සංවර්ධන මණ්ඩලය යන ආයතනවල නිලධාරීන් සමඟ මහජන චීන සමූහාණ්ඩුවේ රේගු පොදු පරිපාලනය විසින් ඇසුරුම් කිරීමේ මධ්‍යස්ථාන දෙකක් සහ එක් අන්නාසි වගාවක් ආවරණය වන පරිදි වීඩියෝ පට ඔස්සේ පරීක්ෂා කිරීමක් සිදුකරන ලදී. ඇසුරුම් කිරීමේ මධ්‍යස්ථානයකට සහ අන්නාසි වගාවකට අදාළ පටිගත කළ වීඩියෝ පටි GACC වෙත ඉදිරිපත් කර තිබේ. චීනය වෙත අන්නාසි නිෂ්පාදන අපනයනය කිරීමට සමාගම් සඳහා වන කාර්ය පටිපාටිය GACC වෙතින් ලැබී ඇති අතර එය අපනයන සංවර්ධන මණ්ඩලයේ වෙබ් අඩවියේ පළකර තිබේ. මීට අමතරව, චීනය තුළ අන්නාසි නිෂ්පාදන සඳහා වෙළඳපොළ ප්‍රවේශය උදෙසා ප්‍රවර්ධන ක්‍රියාකාරකම් සිදුකරන ලෙස චීනයේ ශ්‍රී ලංකා

තානාපති කාර්යාලය විසින් ඉල්ලා තිබේ. Kunming Fair හිදී ප්‍රවර්ධන කටයුතු සඳහා අන්නාසි සාම්පල චීනයේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය වෙත යවා තිබේ.

- **පලතුරු සහ එළවළු සඳහා තිරසර ගොවි පර්ෂද සහ අපනයනකරුවන් සම්බන්ධකිරීමේ වැඩසටහන් සඳහා පහසුකම් සැලසීම**

  රන්ක්‍රිස්ප් මාකටින්ග් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් මඤ්ඤොක්කා අල සහ පත්‍ර ඇතුළුව, අපනයනය සඳහා සැකසුම් කිරීම සඳහා මඤ්ඤොක්කා (පේරාදෙණිය ප්‍රභේදය) වගා කිරීමට මහවැලි එච් කලාපය සමඟ එක්වී ගොවි පර්ෂදයක් සංවිධානය කරන ලදී. 2024 සහ 2025 වර්ෂ සඳහා නිෂ්පාදන සහ අලෙවි සැබඳුම් වැඩසටහන් ආරම්භ කිරීම පිණිස අපනයන කටයුතුවල නියැලෙන සමාගම් විස්සක් මහවැලි අධිකාරියේ වගකිවයුතු නිලධාරීන් (අධ්‍යක්ෂ ජනරාල්, ප්‍රාදේශීය ප්‍රධානීන් සහ කලාපීය ප්‍රධානීන්) සමඟ සම්බන්ධ කරන ලදී. කරපිංචා සහ සේර නිෂ්පාදනය සහ මිලදී ගැනීම සඳහා බුත්තල ප්‍රදේශයේ ගොවි කණ්ඩායමක් සීබීඑස් ප්‍රයිවට් ලිමිටඩ් සමඟ සම්බන්ධ කරන ලදී. අපනයන වෙළඳපොළවල් ඉලක්කකර මෙරට වගාකරන කොකෝවාවලින්ම කුඩා කාණ්ඩ වශයෙන් නිෂ්පාදනය කරන චොක්ලට් නිෂ්පාදනය කිරීමට අනොඩ් කොකෝවා සමාගම කුරුණෑගල වැවිලි සමාගම සමඟ සම්බන්ධ කරන ලදී. අපනයන සංවර්ධන මණ්ඩලයේ කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලය සමඟින් දඹුල්ලේ බණ්ඩක්කා නිෂ්පාදන පර්ෂදයක් අපනයනකරුවෙකු හා සම්බන්ධ කරන ලදී.

- **එතෙර පිහිටි ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාල සමඟ සහයෝගිතාවයෙන් මුහුදු ආහාර අපනයනකරුවන් සඳහා B2B ව්‍යාපාරික රැස්වීම්**

  **චීනය සහ දකුණු කොරියාව:** ශ්‍රී ලංකාවේ පොකිරිස්සන් අපනයනකරුවන් දෙදෙනෙකු චීන වෙළඳපොළ වෙත හඳුන්වා දුන් අතර, කකුළුවන් අපනයනකරුවන් පස් දෙනෙකු දකුණු කොරියානු ආනයනකරුවන් සමඟ සබඳතා ගොඩනංවා ගන්නා ලදී.

  **නෙදර්ලන්තය, ස්පාඤ්ඤය, සහ ජර්මනිය:** ටූනා (tuna) සහ මෝඩා (barramundi) යන මත්ස්‍ය විශේෂ අපනයනය කරන අපනයනකරුවන් දෙදෙනෙකු දැනට කෙරීගෙන යමින් පවතින එකඟතාවයන් සමඟින් නෙදර්ලන්තයේ ගැනුම්කරුවන් වෙත හඳුන්වා දෙන ලදී. මෝඩා (barramundi) අපනයනකරුවෙකු වෙත ස්පාඤ්ඤ ගැනුම්කරුවන් සිවුදෙනෙකු හඳුන්වා දෙන ලදී. B2B ව්‍යාපාරික රැස්වීම් සංවිධානය කිරීම සඳහා ජර්මන් තානාපති කාර්යාලය සමඟ මූලික සාකච්ඡා පවත්වන ලදී.

### 2.1.5 ඉලෙක්ට්‍රොනික් සහ ඉලෙක්ට්‍රිකල් සංරචක ක්ෂේත්‍රය

- **B2B සැසි, වෙබිනාර්. ඉලෙක්ට්‍රොනික් සහ ඉලෙක්ට්‍රික් සංරචක සඳහා ඉලක්කගත කලාප වනුයේ අප්‍රිකාව, යුරෝපා සංගමය, ආසියාව සහ ඇමරිකාව** - අප්‍රිකානු වෙළඳපොළ තුළට ශ්‍රී ලංකාවේ ඉදිරිපත්වීම පුළුල් කරමින් ටැන්සානියානු සමාගමක් සමග B2B සැසියක් පවත්වන ලදී. ශ්‍රී ලංකාවේ ඉලෙක්ට්‍රොනික් සහ ඉලෙක්ට්‍රික් සංරචක (EEC) සමාගම් 14ක සහභාගිත්වය සහිතව මෝටර් වාහන එකලස් කිරීමේ සමාගමක් වන මයික්‍රෝ කාර්ස් සමඟ වූ රැස්වීම 2024 ජූලි 05 වැනි දින පවත්වන ලදී. ව්‍යාපාරික සබඳතා සඳහා තනි තනි සමාගම්හි සංචාර පිළියෙල කරගැනීම පිණිස එක් එක් සමාගම

පිළිබඳ සටහන් සමාගම වෙත ලබාදෙන ලදී. අපනයන සංවර්ධන මණ්ඩලයේ ඉල්ලීම පරිදි, කේඅයිකේ ලංකා, වෙරොක්ස් ලැබ්ස් සහ රින්ස්ට්‍රම් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම් විසින් එක්සත් අරාබි එමීර් රාජ්‍යය, කටාර්, මාලදිවයින, ඇමරිකා එක්සත් ජනපදය, ස්පාඤ්ඤය සහ ඉතාලිය යන රටවල සිටින විභව්‍ය ගැනුම්කරුවන්ගේ ලැයිස්තු එවා ඇති අතර සබඳතා සඳහා පහසුකම් සැලසීම සඳහා එම ලැයිස්තු අදාළ රටවල විදේශ තානාපති කාර්යාල වෙත යොමුකර තිබේ. මීට අමතරව, දේශීය අපනයනකරුවන් සඳහා සුහුරු ජලජ වගාවේ සහ සුහුරු කෘෂිකර්මයේ වාසි පිළිබඳව දැනුවත්බව වැඩිදියුණු කිරීම උදෙසා 2024 ජුනි 26 වැනි දින වැඩසටහනක් පවත්වන ලදී. සමාගම් 45ක් මේ සඳහා සහභාගී වූ අතර, අස්වැන්නේ ගුණාත්මකබව සහ ප්‍රමාණය ඉහළ නැංවීම සඳහා කර්මාන්තය සඳහා වන ඉහළ තාක්ෂණික අවශ්‍යතාවයන් සම්පූර්ණ කරන ලදී. ඉලෙක්ට්‍රොනික් සහ ඉලෙක්ට්‍රික් නිෂ්පාදන ක්ෂේත්‍රය සඳහා පවතින දේශීය පරීක්ෂාව, ක්‍රමාංකනය සහ ප්‍රතීතණ සේවා පිළිබඳ දැනුවත්බව ඉහළ නැංවීම සඳහා අගෝස්තු 28 දිනැතිව වෙබිනාර් වැඩසටහනක් පවත්වන ලදී. ආසන්න වශයෙන් සමාගම් 50ක් පමණ මීට සහභාගී වූ අතර, ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය (SLINTEC), ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය (NERDC), ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI), කාර්මික තාක්ෂණ ආයතනය (ITI) සහ නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය (ACCIMT) යන ආයතනවල නියෝජිතවරු විසින් වටිනා අදහස් ලබාදෙන ලදී.

- **පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සහ පරීක්ෂා කිරීම් සමගින් නිෂ්පාදන වැඩිදියුණු කිරීම සඳහා සහාය** - ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය (SLINTEC), ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය (NERDC) සහ නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය (ACCIMT) යන ආයතනවල සහාය සමඟින් ඉලෙක්ට්‍රොනික් සහ ඉලෙක්ට්‍රික් සංරචක (EEC) සමාගම් 14කට ක්‍රමාංකනය, නිෂ්පාදන වැඩිදියුණු කිරීම සහ පරීක්ෂාව සඳහා සහාය ලැබුණි. ජපාන රජයේ ප්‍රදානයක් ඔස්සේ අරමුදල් සැපයීමෙන් වැඩිදියුණු කළ පරීක්ෂණ පහසුකමක් ශ්‍රී ලංකාවේ ස්ථාපනය කිරීම සඳහා කර්මාන්ත අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය (NERDC) සමඟ සාකච්ඡා සිදුකරමින් පවතී.
  ඉලෙක්ට්‍රොනික් සහ ඉලෙක්ට්‍රික් නිෂ්පාදනය කිරීම් සඳහා ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ ආයතනවලින් පිරිනමන පරීක්ෂාවන්, ක්‍රමාංකනය සහ ප්‍රතීතණ සේවා පැවතීම සම්බන්ධයෙන් දැනුවත් කිරීම සඳහා ආසන්න වශයෙන් සමාගම් 50ක පමණ සහභාගිත්වයෙන් යුක්තව අගෝස්තු 28 දිනැතිව මාර්ගගත සම්මන්ත්‍රණයක් පවත්වන ලදී.

- **අයිපීසී ඉන්දියා ශ්‍රී ලංකාවේ ඉලෙක්ට්‍රොනික් නිෂ්පාදකයන්ගේ සහ අපනයනකරුවන්ගේ සංගමයේ (SLEMEA) සහයෝගයෙන් 2024 පෙබරවාරි පැවති පෑස්සීම් සම්බන්ධිත ප්‍රායෝගික පුහුණු සැසිය සහ ස්ථිති විද්‍යුත් විසර්ජනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන**

ශ්‍රී ලංකාවේ ඉලෙක්ට්‍රිකල් සහ ඉලෙක්ට්‍රොනික් සමාගම්වල සහභාගිකයන් 60 දෙනෙකුගේ පමණ සහභාගිත්වයෙන් පුහුණු සැසියක් සංවිධානය කරන ලදී. අයිපීසී ප්‍රමිත අවශ්‍යතා, එකලස් කිරීමේ කෘත්‍යාත්මකබව, විධිමත් පෑස්සුම් තාක්ෂණික ක්‍රම, එකලස් කිරීමේ කාර්ය පටිපාටිවලට

අනුකූලතාවය, සහ නිෂ්පාදිතයේ සමස්ත ගුණාත්මක අවශ්‍යතාවය පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබාගැනීමට සහභාගිකයන්ට හැකි විය. මීට අමතරව, සිය කුසලතා තවදුරටත් වැඩිදියුණු කරගැනීම සඳහා නවීනතම මෙවලම් භාවිතයෙන් සිදුකරන ඉහළ මට්ටමේ පැස්සුම් ක්‍රමවේද පිළිබඳව ඉගෙන ගැනීමට ද සහභාගිකයන්ට අවස්ථාවක් ලැබුණි.

### 2.1.6 සැපයුම්දාම කළමනාකරණ ක්ෂේත්‍රය

- සැපයුම්දාම කළමනාකරණ ක්ෂේත්‍රය තුළ රැකියා සඳහා අවශ්‍ය කරන සුදුසුකම් හා නිපුණතා හඳුනාගැනීම සඳහා සමීක්ෂණයක් සිදුකරන ලදී. සමීක්ෂණය තුළින් අනාවරණය වූ කරුණු අනුව, කමිටුවේ ප්‍රධානියා විසින් සුදුසුකම් රාමුව පිළිබඳ කෙටුම්පතක් සකස් කළ අතර, එය සමාලෝචනය කිරීම සහ සාකච්ඡා කිරීම කමිටුව විසින් සිදුකරන ලදී. රාමුව ඔස්සේ කර්මාන්ත අංශයේ ප්‍රමිති සහ අවශ්‍යතා සපුරාලන බව සහතික කිරීම සඳහා පසු පෙවුම් අන්තර්ගත කරමින් මේ සඳහා ඇතුළත් කළ යුතු සියුම් වෙනස් කිරීම් දැනට සිදුකරමින් පවතී.

### 2.1.7 පොල් ආශ්‍රිත නිෂ්පාදන ක්ෂේත්‍රය

- **යුරෝපය/ චීනය සහ මැද පෙරදිග වෙළඳපොළ වෙත පොල් මදය ආශ්‍රිත නිෂ්පාදන (කිරි, පිටි කළ පොල්කිරි, පොල්/ තැඹිලි වතුර සහ පොල් චිප්ස්/ ඩෙසිකට් පොල්) ප්‍රවර්ධනය කිරීම පිණිස B2B වැඩසටහන් පැවැත්වීම** - යුරෝපය, චීනය, මැදපෙරදිග රටවල දී ශ්‍රී ලංකාවේ පෙනීසිටීම ශක්තිමත් කිරීම සඳහා, පොල් ආශ්‍රිත නිෂ්පාදන සම්බන්ධයෙන් අවධානය යොමුකර අපනයන සංවර්ධන මණ්ඩලය විසින් B2B ව්‍යාපාරික රැස්වීම් මාලාවක් සංවිධානය කරන ලදී. මධ්‍යම දාම ට්‍රයිග්ලිසරයිඩ් තෙල් සහ කොහුබත් සඳහා ජපානය සහ රුසියාව සමඟ රැස්වීම් තුනක් පවත්වන ලදී. ගැනුම්කරුවන් දෙදෙනෙකු සඳහා ශ්‍රී ලංකාවේ සමාගම් දහයක් හඳුන්වාදෙන ලදී. ජපාන ගැනුම්කරුවෙකු විසින්ශ්‍රී ලංකාවේ එක් සමාගමකට සංචාරය කළ අතර, ඇණවුම තහවුරු කරගැනීමේ අපේක්ෂාවෙන් පසුවේ. තව ද, ඉතාලියේ සහ නවසීලන්තයේ ගැනුම්කරුවන් සමඟ නැවුම් පොල්තෙල් (VCO) සහ පොල් මද නිෂ්පාදන (විනාකිරි, පැණි, සීනි, පොල්/ තැඹිලි වතුර ආදිය) සම්බන්ධයෙන් B2B රැස්වීම් දෙකක් පවත්වන ලදී.

### 2.1.8 ඇඟළුම් අංශය

- **චීනයෙන් පැමිණි ඇඟළුම් ගැනුම්කරුවන්ගේ දූත කණ්ඩායම -** චීනයේ ජාතික ඇඟළුම් සංවිධානයේ (CNGA) 30 දෙනෙකුගෙන් සමන්විත ප්‍රධාන දූත පිරිසක් 2024 මැයි මස 09 වැනි දින ශ්‍රී ලංකාවට පැමිණියහ. අපනයන සංවර්ධන මණ්ඩලය විසින් B2B රැස්වීම් සංවිධානය කළ අතර, චීන සමාගම් සමඟින් ශ්‍රී ලංකාවේ සමාගම් 12ක් සම්බන්ධ කරන ලදී.

- **CEMS - Global USA's Textile Series of Exhibition වශයෙන් හැඳින්වෙන රෙදිපිළි ඇතුළු ඇඟළුම් කර්මාන්ත ප්‍රදර්ශනයේ දී පැවති තොරතුරු ලබාදීමේ කුටිය - ශ්‍රී ලංකා ප්‍රදර්ශන සහ සම්මේලන මධ්‍යස්ථානය 2024 පෙබරවාරි 29 සිට මාර්තු 02 වැනි දින දක්වා**

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් මෙම ප්‍රදර්ශනයේ දී තොරතුරු කුටියක් පවත්වන ලදී. ඉන්දියාව, පකිස්තානය, තායිවානය සහ චීනය නියෝජනය කරමින් නූල්, රෙදි වර්ග සහ යන්ත්‍රසූත්‍ර නිෂ්පාදනය කිරීමේ නියැලි ප්‍රදර්ශකයන් 50ක් මෙම ප්‍රදර්ශනය සඳහා සහභාගී විය. ගෝලීය රෙදිපිළි වෙළඳපොළ තුළ ශ්‍රී ලංකාවේ ව්‍යාපාර සඳහා වටිනා දැනුම් සම්භාරයක් සහ ජාලගතවීමේ අවස්ථා ලබාදෙමින් මෙම ප්‍රදර්ශකයන් විසින් නූල්, රෙදි වර්ග සහ යන්ත්‍රසූත්‍ර ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කරන ලදී.

- **"Sourcing at Magic" ප්‍රදර්ශනය, ලාස්වේගාස් 2024 (පෙබරවාරි)** - ඇමරිකා එක්සත් ජනපදයේ ලාස් වේගාස්හි පැවති "Sourcing at Magic Exhibition" සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ශ්‍රී ලංකාවේ ඇඟළුම් සමාගම් 11ක සහභාගිත්වය සංවිධානය කරන ලදී. ඇමරිකා එක්සත් ජනපදයේ වෙළඳපොළට අනුකූල වන කාන්තා ගවුම් සහ බ්ලවුස් වර්ග, ව්‍යායාම ඇඳුම්, කාර්යාලීය ඇඳුම්, පිරිමි ෂර්ට්, යට ඇඳුම්, ළමා ඇඳුම්, වැසි කබා වැනි පුළුල් පරාසයක දිවෙන ඇඳුම් කාණ්ඩ එම ප්‍රදර්ශකයන් විසින් ඉදිරිපත් කර ප්‍රවර්ධනය කරන ලදී.

- **එක්සත් රාජධානිය විසින් පිරිනමන සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා වෙළඳ යෝජනා ක්‍රමය (UK DCTS) යටතේ ප්‍රතිලාභ උපරිම කරගැනීම - 2024 අප්‍රේල්/ මැයි පැවති ශ්‍රී ලංකා ඇඟළුම් සමුළුව ("Sourced Sri Lanka"– එක්සත් රාජධානියේ පැවති රෙදිපිළි සහ ඇඟළුම් ප්‍රදර්ශනය සහ ඇඟළුම් සඳහා B2B සැසිය)**

සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් 12ක් ද ඇතුළුව ප්‍රදර්ශකයන් 52 දෙදෙනකුගේ සහභාගිත්වය සහිතව අපනයන සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා ඇඟළුම් සංවිධානය (SLASA), එක්සත් රාජධානියේ පිහිටි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය සහ ඒකාබද්ධ ඇඟළුම් සංසදය (JAAF) යන ආයතනවල

සහයෝගිතාවයෙන් 2024 ජූනි 17 සහ 18 යන දිනවල දී එක්සත් රාජධානියේ ලන්ඩන් නුවර පිහිටි රෝයල් හෝටිකල්චරල් ශාලාවේ දී සුවිශේෂී අපනයන ප්‍රවර්ධන වැඩසටහනක් සංවිධානය කරන ලදී. මෙම සමුළුවේ පළමු දිනයේ දී, එනම් 2024 ජූනි 17 වැනි දින ශ්‍රී ලංකාවේ අපනයන ක්ෂේත්‍රයේ සුවිශේෂී සංධිස්ථානයක් සනිටුහන් කරමින් **"Your Vital Island"** නමින් වූ ශ්‍රී ලංකාවේ ජාතික අපනයන සන්නාමය සාඩම්බර අයුරින් එළි දක්වන ලදී. එක්සත් රාජධානියේ වෙළඳපොළ තුළ ශ්‍රී ලංකාවේ ඇඟළුම් පංගුව ඉහළ නැංවීමේ පරමාර්ථයෙන් එක්සත් රාජධානිය තුළ මෙවැනි ප්‍රදර්ශනයක් සංවිධානය කළ පළමු අවස්ථාව මෙය විය. මෙම අවස්ථාවේ දී ගැනුම්කරුවන් සමඟ සම්බන්ධතා 14ක් පමණ ඇතිකර ගන්නා ලදී. මෙම ප්‍රදර්ශනයේ දී ඇතිකරගත් සබඳතා අනුව, එක්සත් රාජධානියේ සන්නාම ප්‍රවර්ධකයෙකු ලෙස කටයුතු කරන ජීටා මෝනා මහත්මිය ශ්‍රී ලංකාවෙහි සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තශාලාවක් (රුවන්ති ගාමන්ට්ස් ප්‍රයිවට් ලිමිටඩ්) වෙත සංචාරයකට පැමිණෙන ලදී.

- **ශ්‍රී ලංකාවේ පිහිටි ස්විට්සර්ලන්ත තානාපති කාර්යාලය සමඟ සහයෝගිතාවයෙන් රෙදිපිළි සහ ඇඳුම් පැළඳුම් පිළිබඳ ගෝලීය වැඩසටහනෙහි (GTEX) II වැනි අදියර ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීම**

  ආයෝජන ප්‍රවර්ධන ගරු රාජ්‍ය අමාත්‍යවරයාගේ සහ ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානයේ උපදේශකවරයෙකුගේ සහභාගිත්වයෙන් රෙදිපිළි සහ ඇඳුම් පැළඳුම් පිළිබඳ ගෝලීය වැඩසටහනෙහි (GTEX) දෙවැනි අදියර 2024 ජූලි මස 03 දිනැතිව කොළඹ කිංගස්බෙරි හෝටලයේ දී ආරම්භ කරන ලදී. ශ්‍රී ලංකාවේ ඇඟළුම් ක්ෂේත්‍රය සඳහා ප්‍රතිලාභ අත්කර ගැනීම සඳහා 2024 සිට 2027 දක්වා කාලසීමාව තුළ GTEX වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ශ්‍රී ලංකාව සහ මාලදිවයින සඳහා වන ස්විට්සර්ලන්ත තානාපති කාර්යාලය සමඟ ව්‍යාපෘති ගිවිසුමක් අත්සන් කරන ලදී. තෝරාගත් සමාගම් ඇගයීම සඳහා කර්මාන්තශාලා පහක් වෙත සංචාරයන් සිදුකරන ලදී.

### 2.1.9 රබර් ආශ්‍රිත නිෂ්පාදන ක්ෂේත්‍රය

- **පොලිමර් කර්මාන්තය සඳහා නිෂ්පාදන නවෝත්පාදන, තාක්ෂණය, සහ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු පිළිබඳ වැඩමුළුව/ සම්මන්ත්‍රණයක් පැවැත්වීම - වන නාශනය පිළිබඳ යුරෝපා සංගමයේ රෙගුලාසි (EUDR)** සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ රබර් නිෂ්පාදන කර්මාන්ත අංශය දැනුවත් කිරීම පිණිස පීටර්සන් සොලියුෂන් සහ ප්‍රොජෙක්ට්ස් ආයතනය සමඟ සහයෝගිතාවයෙන් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ වැඩමුළුවක් පවත්වන ලද අතර, අදාළ රජයේ ආයතන සමඟ ගැටලු සම්බන්ධයෙන් පැහැදිලි කරගැනීම් සහිතව මෙම EUDR රෙගුලාසි සඳහා අනුකූලතාවය සම්බන්ධයෙන් දැනුම වැඩිදියුණු කරගැනීම සඳහා සමාගම් 30 ක නියෝජිතවරු මේ සඳහා සහභාගි විය.

- **වියළි රබර් සංයෝජනය කිරීමේ තාක්ෂණය සහ ශාක කළමනාකරණය පිළිබඳ දෙදින වැඩමුළුවක් පැවැත්වීම -** වියළි රබර් සංයෝජනය කිරීමේ තාක්ෂණය සහ ශාක කළමනාකරණය පිළිබඳ අවධානය යොමුකරමින් ශ්‍රී ලංකා මෝටර් රථ සංරචක නිෂ්පාදකයන්ගේ සංගමය (SLACMA) සහ ටෙක්නෝබිස් ලංකා සමාගම සමඟ සහයෝගිතාවයෙන් අපනයන සංවර්ධන මණ්ඩලය විසින් දෙසැම්බර් මාසයේ දී දෙදින වැඩමුළුවක් පවත්වන ලදී. අපනයන වෙළඳපොළ තුළ තරඟකාරිත්වය පවත්වා ගැනීම සඳහා අත්‍යවශ්‍ය වන රබර් නිෂ්පාදන කර්මාන්තයේ නියැලි තාක්ෂණික වෘත්තිකයන්ගේ කුසලතා වැඩිදියුණු කිරීම මෙම වැඩමුළුවේ අරමුණ විය. අමුද්‍රව්‍ය සංයෝජනය කිරීම, ස්වාභාවික සහ සංශ්ලේෂිත රබර්වල භාවිතයන්, සහ රබර් මිශ්‍ර කිරීම සඳහා පවතින මනා පරිචයන් ආදිය ආවරණය කරන ලද ප්‍රධාන මාතෘකා යටතට ඇතුළත් විය. ශ්‍රී ලංකාවේ රබර් නිෂ්පාදන කර්මාන්තයේ වර්ධනය සහ විවිධාංගීකරණය සඳහා මෙහි සුවිශේෂී වැදගත්කම අවධාරණය කරමින් කර්මාන්තයේ නියැලි ප්‍රධානීන් සහ නිලධාරීන් මීට සහභාගී විය.

## 2.2. අපනයන සංවර්ධන සහ ප්‍රවර්ධන කාර්යයන් සඳහා අනෙකුත් අංශ

### 2.2.1 මැණික් සහ ස්වර්ණාභරණ අංශය

- **FACETS Sri Lanka ජාත්‍යන්තර මැණික් සහ ස්වර්ණාභරණ ප්‍රදර්ශනය 2024**
  ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය සහ අපනයන සංවර්ධන මණ්ඩලය සමඟ සහයෝගිතාවයෙන් ශ්‍රී ලංකා මැණික් සහ ස්වර්ණාභරණ සංවිධානය විසින් 30 වැනි වරටත් සංවිධානය කළ **FACETS Sri Lanka ජාත්‍යන්තර මැණික් සහ ස්වර්ණාභරණ ප්‍රදර්ශනය** 2024 ජනවාරි 6-8 දක්වා කොළඹ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ දී පැවැත්විණි. වඩාත් පුළුල්ව දියත් කළ ප්‍රචාරණ කටයුතු හේතුවෙන් රටවල් විස්සකින් පමණ විභව්‍ය ගැනුම්කරුවන් ආසන්න වශයෙන් සියයක් පමණ මෙම ප්‍රදර්ශනයට එක්විය. ඇ.ඩො. මිලියන 10 කට වඩා වැඩි අලෙවියක් වාර්තා විය. දැඩි උනන්දුවක් දැක් වූ විදේශීය ගැනුම්කරුවන් 150ක් ද ඇතුළුව ගැනුම්කරුවන් 300ක් පමණ ප්‍රදර්ශනයට පැමිණෙන ලදී.

- ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය සහ ශ්‍රී ලංකා රේගුව සමඟ සහයෝගිතාවයෙන් මැණික් සහ ස්වර්ණාභරණ අංශය සඳහා වන අපනයන කාර්ය පටිපාටිය පිළිබඳ දැනුවත් කිරීමේ සැසියක් සහභාගිකයන් 50ක් සඳහා සංවිධානය කරන ලදී.

### 2.2.2 ඖෂධ නිෂ්පාදන

- සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ සහයෝගිතාවයෙන් ශ්‍රී ලංකාවේ ඖෂධ ක්ෂේත්‍රය සඳහා වන ක්‍රමෝපායික ඉදිරි දැක්ම සකස් කිරීම සඳහා පහසුකම් සලස්වන ලදී.

- **වියට්නාමයේ පැවති Medi Pharm Expo 2024 (2024 අගෝස්තු 01-03), හෝ චි මින්හ්, වියට්නාමය**

  මෙම ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකාවේ සමාගම් තුනක සහභාගීත්වය සංවිධානය කරන ලදී. සමාගම් දෙකකට සිය නිෂ්පාදන බෙදාහරින්නන් හමු වූ අතර, වැඩිදුර සාකච්ඡාවල නියැලෙමින් සිටී. එක් සමාගමක් විභව්‍ය බෙදාහරින්නන් සමඟ සාකච්ඡාවල නියැලෙමින් සිටී.

### 2.2.3 පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදන

- **පාවහන් සහ සම්භාණ්ඩ ප්‍රදර්ශනය - 2024 හි සම සංවිධානය -** පාවහන් සහ සම්භාණ්ඩ ප්‍රදර්ශනය 2024 පෙබරවාරි 8 -11 වැනි දින දක්වා බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්විණි. අපනයන සංවර්ධන මණ්ඩලය විසින් තොරතුරු කුටියක් සංවිධානය කළ අතර, එම අවස්ථාව සම්බන්ධයෙන් දේශීය සහ ජාත්‍යන්තර ප්‍රවර්ධන කටයුතු සිදුකරන ලදී.

### 2.2.4 ඉදිකිරීම් සහ විදුලිබල සහ බලශක්ති ක්ෂේත්‍රය

- **සිවිල් ඉදිකිරීම්/ යාන්ත්‍රික, විදුලි සහ ජලනල කටයුතු/ ඉංජිනේරු සහ විදුලිබල සහ බලශක්ති සේවා සඳහා අප්‍රිකානු සහ මැදපෙරදිග කලාපය තුළ ව්‍යාපාරික නියැලීම් ස්ථාපනය කිරීම**

  අප්‍රිකානු කලාපයේ රටවල්, යුරෝපා සංගමය (රොමේනියාව) සහ ආසියාව (ඉන්දුනීසියාව) තුළ ස්ථිර කළ ව්‍යාපෘති සඳහා සමාගම් පහක්: සියෙරා කන්ස්ට්‍රක්ෂන්ස් සහ මාස්ටර් හෙලිස්ප් ඉකෝ පවර් (ඇ.ඩො.මිලියන 170), චයිනා ස්ටේට් කන්ස්ට්‍රක්ෂන් ඉන්ජිනියරින්ග් කෝපරේෂන් (ඇ.ඩො.මිලියන 2) සහ සෝ එන්ජිනියරින්ග් (ඇ.ඩො.මිලියන 2) සම්බන්ධ කරන ලදී. ඉතියෝපියාව, දකුණු අප්‍රිකාව සහ ඉන්දුනීසියාව තුළ 60කට අධික ව්‍යාපෘති ලැයිස්තුවක් කර්මාන්ත ක්ෂේත්‍රය සමඟ හුවමාරු කරගන්නා ලදී.

- **තායිලන්ත සුහුරු නගර ප්‍රදර්ශනය 2024 (Thailand Smart City Expo 2024)**

තායිලන්තයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් අපනයන සංවර්ධන මණ්ඩලය සමඟින් බැංකොක් නගරයේ නොවැම්බර් 6-8 දක්වා පැවති තායිලන්ත සුහුරු නගර ප්‍රදර්ශනය -2024 සඳහා ශ්‍රී ලංකාවේ සහභාගිත්වය සංවිධානය කරන ලදී. ගිණිකොණ දිග ආසියාවේ විශාලතම සුහුරු නගර නවෝත්පාදනය වන මෙම සුවිශේෂී ඉසව්ව ඔස්සේ විදුලි සංදේශ සහ බලශක්ති ක්ෂේත්‍ර ඇතුළුව විවිධ ක්ෂේත්‍රවල ප්‍රගමනයන් අනාවරණය කරගැනීම පිණිස ජාත්‍යන්තර පාර්ශවකරුවන් සහ කර්මාන්ත අංශයේ නායකයන් ඒකරාශී කරන ලදී. සුහුරු බලශක්ති කළමනාකරණයේ නවීනතම තාක්ෂණික විසඳුම් ඉදිරිපත් කළ වෙනෝරා ලංකා පවර් පැනල්ස් සහ ඇසෙන්ඩ් ටෙක්නොලොජීස් ඇතුළුව ශ්‍රී ලාංකික ප්‍රදර්ශකයන් සඳහා නොමිලේ ලබාදෙන කුටි ලබාගැනීමට තානාපති කාර්යාලය විසින් සමත් වූ අතර, එමගින් ගෝලීය තාක්ෂණ සංදර්භය තුළ ශ්‍රී ලංකාවේ නැඟීඑන විශේෂඥතාවය සහ තරඟකාරිත්වය ප්‍රදර්ශනය කිරීමට හැකිවිය.







## 2.2.5 අධ්‍යාපන සේවා

- **දේශීය ආයතන/ වැඩසටහන් සමඟ අනුබද්ධවීමට ජාත්‍යන්තර සේවා සැපයුම්කරුවන් සම්බන්ධ කිරීම (අධ්‍යයන සහ සෞඛ්‍ය සත්කාරක සේවා)**

අධ්‍යයන සහයෝගිතාවය සඳහා සිනෙක් කැම්පස් සහ ඉන්දුනීසියාවේ යුනිවර්සිටාස් පාර්සාදා සම්බන්ධ කරන ලද අතර ගිවිසුම මාර්තු මාසයේ දී අත්සන් කරන ලදී. සහයෝගීතාවයන් අනාවරණය කරගැනීම සඳහා විවෘත විශ්වවිද්‍යාලය සහ යුනිවර්සිටාස් ඉන්දුනීසියාව අතර සාකච්ඡා සිදුකරමින් පවතී. සෞඛ්‍ය සත්කාරක සේවා වැඩසටහන්වල සහයෝගිතාවයන් ඇතිකර ගැනීම සඳහා යුනිවර්සිටාස් ඉන්දුනීසියාහි වෛද්‍ය පීඨය සහ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල (IIHS, CINEC, APIIT, SLIIT, සහ විවෘත විශ්වවිද්‍යාලය) අතර සාකච්ඡාවක් 2024 ජුනි මස 25 වැනි දින පවත්වන ලදී. සබරගමුව විශ්වවිද්‍යාලය සහ යුනිවර්සිටාස් ඉන්දුනීසියා අතර ද සහයෝගිතාවයන් සඳහා සාකච්ඡා සිදුකරමින් පවතී. ඉන්දුනීසියාවේ බෝධි ධර්ම විදුහල සහ ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යයනය සඳහා වන නාගානන්ද ජාත්‍යන්තර ආයතනය සම්බන්ධ කරන ලද අතර, දෙපාර්ශවය සමඟ මූලික රැස්වීම පවත්වන ලදී.

### 2.2.6 සමුද්‍රීය සහ අක්වෙරළ සේවා

- **"Voyage Sri Lanka 2024: 2024 නොවැම්බර් මාසයේ පැවති සමුද්‍රීය සමුළුව**

  රජයේ සහ පුද්ගලික අංශයේ පාර්ශවකරුවන්ගේ සහයෝගිතාවයෙන් අපනයන සංවර්ධන මණ්ඩලය විසින් පළමුවරට පැවැත්වෙන "Voyage Sri Lanka 2024" නැමති සමුද්‍රීය සමුළුව කොළඹ නගරයේ සංවිධානය කරන ලදී. ආයෝජකයන් ආකර්ෂණය කරගැනීම, ක්‍රමෝපායික සබඳතා ගොඩනංවාලීම, සහ නීල ආර්ථිකය තුළ ආයෝජන සඳහා කේන්ද්‍රස්ථානයක් ලෙස මෙරට විභවය විදහා දැක්වීම තුළින් ශ්‍රී ලංකාවේ සමුද්‍රිය සහ අක්වෙරළ සේවා සහ බෝට්ටු නිෂ්පාදනය කිරීමේ අංශය ප්‍රවර්ධනය කිරීම මෙම සමුළුව ඔස්සේ අපේක්ෂා කෙරේ. විදේශ දූත පිරිස් සහ ජ්‍යෙෂ්ඨ විධායකයින් ඇතුළුව සහභාගිකයන් 200කට අධික පිරිසක් මීට සහභාගී විය. මෙම මූලාරම්භයේ අංගයක් ලෙස, ඉන්දියාව, සවුදි අරාබිය සහ එක්සත් ජනපදය වැනි රටවලින් පැමිණි විදේශ ආයෝජකයන් 20 දෙනෙකු පමණ ශ්‍රී ලංකාවේ ප්‍රධාන වරාය - ත්‍රිකුණාමලය සහ හම්බන්තොට වෙත සංචාරයක නියැලුණු අතර ගෝලීය






  සමුද්‍රීය වෙළඳ කටයුතු සහ ආයෝජන අවස්ථාවන්හි දී මෙරට ක්‍රමෝපායික පිහිටීම එමඟින් අවධාරණය විය. ශ්‍රී ලංකා වරාය අධිකාරිය, විදේශ කටයුතු අමාත්‍යාංශය, ආයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකා නාවික හමුදාව, සහ අනෙකුත් මෙම ක්ෂේත්‍රයේ නියමුවන් ප්‍රධාන හවුල්කරුවන් යටතට ඇතුළත් විය.

  මීට අමතරව, අපනයන සංවර්ධන මණ්ඩලය විසින් "Voyage Sri Lanka 2024" සඳහා වන නිල වෙබ් අඩවිය ද ආරම්භ කරන ලදී.



## 2.3 නිදහස් වෙළඳ ගිවිසුම්/ වරණීය වෙළඳ ගිවිසුම්/ වෙළඳ සහ ආයෝජන රාමුගත ගිවිසුම් යටතේ පවතින සහන උපරිම කරගැනීම

- **ඇමරිකා එක්සත් ජනපදයේ පැවති Natural Product Expo West (NPEW) (2024 මාර්තු 12-16 )**

  2024 මාර්තු 12-16 වැනි දින දක්වා ඇමරිකා එක්සත් ජනපදයේ ඇනහයිම්හි පැවති ඉසව්වක් සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් අපනයන සමාගම් 08ක (සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය 05 සහ විශාල සමාගම් 03) සහභාගිත්වය සංවිධානය කරන ලදී . මෙහි දී සමස්තයක් වශයෙන් ඇණවුම් 110ක් ලැබී තිබුණු අතර, ඇ.ඩො. 39,000ක ස්ථිර වශයෙන් තහවුරු කළ ඇණවුම් ලැබී තිබුණි. ඇ.ඩො. 39,000ක වටිනාකමකින් යුතු පොල් කිරි කන්ටේනර් දෙකක් සහ ඇ.ඩො. 110,000ක වටිනාකමින් යුත් පොල් කිරි කන්ටේනරයක් මේ දක්වා ඇමරිකා එක්සත් ජනපදය වෙත නැව්ගත කර තිබේ. තව ද, පොල් කිරි, පොල් තෙල් සහ පිටි කළ පොල් කිරි (ඇ.ඩො. මිලියන 0.38) අඩංගු නැව් තුනක් ද යවා ඇත.

- **ආහාර සහ පාන වර්ග ඇතුළත් වූ International Food & Drink Event – 2024 මාර්තු 25-27, එක්සත් රාජධානිය**

  අපනයන සංවර්ධන මණ්ඩලය විසින් එක්සත් රාජධානියේ පවත්වන ලද ඉසව්වක් සඳහා අපනයන සමාගම් 14ක සහභාගිත්වය සංවිධානය කරන ලදී. මෙහිදී ස්ථිර වශයෙන් තහවුරු කළ ඇණවුම්වල වටිනාකම ඇ.ඩො.288,320 කි. සාකච්ඡා මට්ටමේ පවතින ඇණවුම්වල වටිනාකම ඇ.ඩො. මිලියන 1.05 කි. සාධනීය විමසීම් 250ක් පමණ ලැබී ඇත. මීට අමතරව, ෆින්ච් ට්‍රේඩින්ග් ප්‍රයිවට් ලිමිටඩ් සහ නිව් ලංකා සිනමන් ප්‍රයිවට් ලිමිටඩ් අතර හවුල් ව්‍යවසායක් සඳහා අවස්ථාවක් ලැබුණු අතර, ඒ අනුව නිව් ලංකා සිනමන් ප්‍රයිවට් ලිමිටඩ් විසින් ශාඛා සමාගමක් ලියාපදිංචි කරන ලදී. තව ද, නව සමාගම් තුනක් එක්සත් රාජධානියේ වෙළඳපොළ වෙත හඳුන්වා දෙනු ලැබීය (ට්‍රොපිකල් හෙල්ත් ෆුඩ් (ප්‍රයිවට්) ලිමිටඩ්, ෆින්ච් ට්‍රේඩින්ග් ප්‍රයිවට් ලිමිටඩ් සහ කේ ඇන්ඩ් ඩී ෆුඩ්ස් ඉන්ටර්නැෂල් (ප්‍රයිවට්) ලිමිටඩ්).

- **ඕස්ට්‍රේලියාව වෙත දූත පිරිසක් සංවිධානය කිරීම - 2024**

  අපනයන සංවර්ධන මණ්ඩලය විසින් මෙල්බන්හි ශ්‍රී ලංකා කොන්සියුලර් ජෙනරල් කාර්යාලය සහ ශ්‍රී ලංකා - ඕස්ට්‍රේලියා වාණිජ මණ්ඩලය සමඟ සහයෝගිතාවයෙන් 2024 සැප්තැම්බර් 2-6 වැනි දින දක්වා ඕස්ට්‍රේලියාවේ මෙල්බන් නුවර වෙත වෙළඳ දූත පිරිසකගේ සංචාරයක් සංවිධානය කරන ලදී. සිලෝන් ටී, කුළුබඩු, සැකසූ ආහාර, පොල් ආශ්‍රිත නිෂ්පාදන, සහ ආහාර ඇසුරුම් වැනි ක්ෂේත්‍රවල විශේෂඥතාවය සහිත ශ්‍රී ලංකාවේ සමාගම් 17 ක් මෙම දූත පිරිසට ඇතුළත් විය. 2023 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ දී ඇබෝරිජිනල් ආර්ථික සංවර්ධන කණ්ඩායම විසින් සිදුකළ සංචාරයෙන් අනතුරුව, මෙම සංචාරය සිදු වූ අතර, ශ්‍රී ලංකා - ඕස්ට්‍රේලියා වාණිජ මණ්ඩලය විසින් පහසුකම් සලස්වන ලද

මෙම සංචාරය ඔස්සේ දෙරට අතර වෙළඳ කටයුතු පුළුල් කිරීම සඳහා අඩිතාලමක් වැටුණි. මෙම සංචාරයේ අංගයක් ලෙස, ආහාර, ඇසුරුම් සහ සත්කාරක කර්මාන්ත ක්ෂේත්‍රයේ විශාලතම වෙළඳ ප්‍රදර්ශනය වන Fine Food Australia 2024 සඳහා සහභාගීවීමේ භාග්‍යය දූත පිරිසට හිමි විය. මෙම අතිප්‍රසිද්ධ ප්‍රදර්ශනයේ දී නව්‍ය නිෂ්පාදන සහ ප්‍රමුඛ සැපයුම්කරුවන් විදහැර දක්වන අතර, ජාත්‍යන්තර හවුල්කරුවන් සමඟ සම්බන්ධවීම, සුවිශේෂී ව්‍යාපාරික අවස්ථා අත්පත් කරගැනීම, සහ ආහාර අපනයන කර්මාන්තය තුළ නැඟී එන ප්‍රවණතා අනාවරණය කරගැනීමේ සුවිශේෂී වේදිකාවක් මෙම ප්‍රදර්ශනය ඔස්සේ ශ්‍රී ලංකාවේ සමාගම් වෙත පිරිනැමේ. දිනයක් පුරා පැවැත්වෙන මෙම ප්‍රදර්ශනයේ දී ඕස්ට්‍රේලියානු වෙළඳපොලේ තරඟකාරී සංදර්භය පිළිබඳ වටිනා අදහස් ලබාගත හැකි අතර, ශ්‍රී ලංකාවේ අපනයන අංශය සඳහා පවතින අවස්ථා පුළුල් කරගැනීමට උපකාරි වේ.

- **ජාතික අපනයන සන්නාම ප්‍රවර්ධන සැලසුම 2024-2027 ක්‍රියාත්මක කිරීම**

  ජාත්‍යන්තර ගැනුම්කරුවන් සහ ශ්‍රී ලංකාවේ පාර්ශවකරුවන් සම්බන්ධ කෙරෙන සංසක්ත අනන්‍ය සන්නාමයක් යටතේ මෙරට අපනයනයන් පුළුල් වශයෙන් ප්‍රවර්ධනය කරන ජාතික අපනයන සන්නාම ප්‍රයත්නය අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ආරම්භ කරන ලදී. අපනයන වෙළඳාම ආශ්‍රිත ප්‍රධාන පාර්ශවකරුවන්ගේ සහයෝගිතාවයෙන් මෙරට අපනයන ක්ෂේත්‍රයේ සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් 2022-2026 කාලසීමාව සඳහා ශ්‍රී ලංකාවේ ජාතික අපනයන සන්නාමයට අදාළව නිතර භාවිතා වන වැකිකඩ (taglines), ලාංඡන (logos) සහ ප්‍රවර්ධන සැලැස්ම සම්බන්ධිත කටයුතු අවසන් කර තිබේ. මෙම මූලාරම්භය, 2023 නොවැම්බර් 23 දිනැතිව අතිගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් පැවති ජනාධිපති අපනයන සම්මාන උළෙලේ දී නිල වශයෙන් ආරම්භ කරන ලදී. මෙම සන්නාමය ජාත්‍යන්තර වශයෙන් පළමු වරට ප්‍රසිද්ධියට පත්කිරීම සිදුකරන ලද්දේ 2024 ජූනි මාසයේ එක්සත් රාජධානියේ ලන්ඩන් නුවර පැවති ඇඟළුම් සහ රෙදිපිළි ප්‍රදර්ශනයකදී ය. රට පිළිබඳ වීඩියෝවක්, ප්‍රසාදාත්මක වීඩියෝ විස්සක් සහ ආංශික වීඩියෝ සම්පූර්ණ කර ඇති අතර, සන්නාමය ප්‍රවර්ධනය කිරීම පිණිස වන සියලු මුද්‍රිත සහ ඩිජිටල් ආකාරයේ නිමැවුම් ද සම්පූර්ණ කර තිබේ.

- **දකුණු ආසියානු වෙළඳ ප්‍රදර්ශනය, 2024 අගෝස්තු 2-4 දක්වා, කොළඹ**

  ශ්‍රී ලංකා වාණිජ සහ කර්මාන්ත මණ්ඩල සම්මේලනය (FCCISL) සමඟ සහයෝගිතාවයෙන් මෙම කාර්යය සංවිධානය කරන ලදී. මේ සඳහා ශ්‍රී ලංකාවේ සමාගම් 22ක් සහභාගී වූ අතර, ඇෆ්ගනිස්තානය, බංග්ලාදේශය, චීනය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය සහ පකිස්තානය යන රටවලින් ජාත්‍යන්තර සහභාගිකයන් 84 දෙනෙකු ද සහභාගී විනි. මෙම රටවල ජාත්‍යන්තර මණ්ඩලවල නායකයින් ද, විශේෂයෙන් ව්‍යාපාරික සැසිය සඳහා සහ මෙම ප්‍රදර්ශනය සඳහා සහභාගී විය.

- **Foodex Saudi-2024 ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකාවේ සහභාගිත්වය සංවිධානය කිරීම (සැප්තැම්බර් 16-19 දක්වා) සවුදි අරාබිය -** Foodex Saudi ප්‍රදර්ශනය සඳහා විමසීම් 105ක් සහ ඇ.ඩො. 25,000ක් වූ තහවුරු කළ ඇණවුම් සංඛ්‍යාවක් ප්‍රතිඵල විය. විශේෂයෙන් පොල් නිෂ්පාදන සහ බිස්කට් ආශ්‍රිතව

තවදුරටත් හවුල් ව්‍යවසායන් සඳහා ඇති විභවය සමඟින්, සාකච්ඡා මට්ටමේ ඇති ඇණවුම් සංඛ්‍යාව ඇ.ඩො. 1,025,000 දක්වා පැමිණ තිබේ.මෙම ඉසව්ව ඔස්සේ කුවේට් සහ බහරේන්වල ද නව වෙළඳපොළ ප්‍රවේශ විවෘත විය. විභව්‍ය ඇණවුම් 100කට අධික සංඛ්‍යාවක් පවතී- කොන්සොලිඩේටඩ් බිස්නස් සිස්ටම්ස් ලිමිටඩ් සඳහා පොල් රසය සහ ඩෙසිකේට් පොල්, මැලිබන් බිස්කට් මැනුෆැක්ටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ් සඳහා හවුල් ව්‍යවසායන් 02කි, නෝෆෝක් ෆුඩ්ස් ප්‍රයිවට් ලිමිටඩ් සහ ආරිය ෆුඩ්ස් සඳහා හවුල් ව්‍යවසාය 1කි. ට්‍රැඩ් ලංකා ඇග්‍රිකල්චරල් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත කුවේට් සහ බහරේන් වෙතින් විමසීම් ලැබී ඇත.

- **ශ්‍රී ලංකාවේ අපනයන දිරිගැන්වීම සඳහා හොංකොං ට්‍රේඩ් ඩෙවලොප්මන්ට් කවුන්සිල් සහ අපනයන සංවර්ධන මණ්ඩලය එක්ව බලගැන්වී සිටීම**

ශ්‍රී ලංකාව සහ හොංකොං අතර වෙළඳ සහ ආර්ථික සබඳතා සවිමත් කිරීම සඳහා හොංකොං ට්‍රේඩ් ඩෙවලොප්මන්ට් කවුන්සිල් සහ අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සුවිශේෂී අලෙවි ප්‍රවර්ධන කාර්යයක් 2024 ඔක්තෝබර් මාසයේ දී කොළඹ කින්ග්ස්බෙරි හෝටලයේ දී පවත්වන ලදී. නව වෙළඳපොළවල් අනාවරණය කරගැනීමට සහ ක්‍රමෝපායික හවුල්කාරිත්වයන් ස්ථාපනය කිරීමට






මෙමගින් ව්‍යාපාරවලට වේදිකාවක් ලබාදුනි. මෙම කාර්යයට පූර්වයෙන්, වෙළඳ කටයුතු වැඩිදියුණු කිරීම සහ අපනයනකරුවන්ගේ සංවර්ධනය කේන්ද්‍රීය වූ සහයෝගිතා අවස්ථා සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා හොංකොං ට්‍රේඩ් ඩෙවලොප්මන්ට් කවුන්සිල්හි නියෝජිතවරු අපනයන සංවර්ධන මණ්ඩලයේ නිලධාරීන් හමුවිය. සවිමත් ආර්ථික සබඳතා සහ හවුල්කාරිත්වයන් ගොඩ නංවමින් ඇඟළුම්, ආහාර සහ ඉලෙක්ට්‍රොනික් ඇතුළුව ශ්‍රී ලංකාවේ විවිධ ක්ෂේත්‍රවලින් නියෝජිතවරු 80ක් පමණ මීට සාර්ථකව එක් විය.

- **7 වැනි චීන ජාත්‍යන්තර ආනයන ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකාවේ සහභාගිත්වය සංවිධානය කිරීම (CIIE) - 2024 (නොවැම්බර් 5–10 දක්වා)**

7 වැනි චීන ජාත්‍යන්තර ආනයන ප්‍රදර්ශනය (CIIE) 2024 නොවැම්බර් මාසයේ දී ෂැන්ග්හයි හි දී පැවැත්විණි. සම්පූර්ණයෙන්ම ආනයන සම්බන්ධයෙන් වෙන් වූ ලොව පළමු ජාතික මට්ටමේ ප්‍රදර්ශනයක් වශයෙන් මෙය වඩාත් වැදගත් වේ. අඛණ්ඩව වසර හතක සක්‍රිය දායකත්වය සමඟින්, මෙහි සමාරම්භය සිදු වූ 2018 වර්ෂයේ සිට අපනයන සංවර්ධන මණ්ඩලය විසින් මෙම ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකාවේ සහභාගිත්වය සංවිධානය කරනු ලැබේ. 2024 වර්ෂයේ දී අපනයන සංවර්ධන

මණ්ඩලය විසින් තාවකාලික ශාලා තුනක් සංවිධානය කරන ලදී: ශ්‍රී ලංකාව සඳහා ජාත්‍යන්තර ශාලාව තුළ, ව්‍යවසායකත්ව අංශය තුළ තවත් අතිරේක ශාලා දෙකක් වශයෙනි. ශ්‍රී ලංකා තේ මණ්ඩලය, පොල් සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය, සහ ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය සමඟ සහයෝගිතාවයෙන් අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ශ්‍රී ලංකාව සඳහා වෙන් වූ ශාලාව තුළ පුළුල් පරාසයක නිෂ්පාදන ප්‍රදර්ශනය සඳහා එක් කරන ලදී. ශ්‍රී ලංකාව සඳහා වෙන් වූ ශාලාවේ අපනයන සංවර්ධන මණ්ඩල කුටියේ දී ඇඟළුම්, තේ, සෞඛ්‍ය සහ රබර් අංශ සමඟින් සිලෝන් සිනමන් ප්‍රමුඛව කැපී පෙනිනි. ශාලාවේ බාහිර පෙනුම වැඩිදියුණු කරමින් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සංවිධානය කළ තේ පැන්වලින් සංග්‍රහ කිරීමේ ස්ථානය සංචාරකයන් බොහෝ සංඛ්‍යාවක් ආකර්ෂණය කරගන්නා ලදී.

මීට අමතරව, අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ප්‍රදර්ශනයේ ආහාර සහ කෘෂිකර්ම අංශය තුළ සහ පාරිභෝගික අංශය තුළ තවත් ශාලා දෙකක් සංවිධානය කරන ලදී. තේ, පොල් නිෂ්පාදන, කුළුබඩු, සාන්ද්‍රණ, සහ අනෙකුත් ආහාර සහ පාන අයිතම වැනි අංශ ආවරණය කරමින් ආහාර සහ කෘෂිකර්ම අංශය තුළ සමාගම් 14 ක් විසින් භාණ්ඩ ප්‍රදර්ශන කර තිබුණි. පාරිභෝගික අංශය තුළ, ශ්‍රී ලංකාවේ ශාලාව තුළ මැණික් සහ ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ සමාගම් හතරක් නියෝජනය විය.
සහභාගී වූ සමාගම්වලට ඇ.ඩො.100,000 ඉක්මවා ගිය තහවුරු කළ ඇණවුම් ලබාගෙන තිබුණු අතර ඇ.ඩො. 300,000ක පමණ වටිනාකමින් යුතු ඇණවුම් සම්බන්ධයෙන් එකඟතා ඇතිකර ගෙන යමින් පවතී. පහකට අධික හවුල් ව්‍යවසාය අවස්ථා සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී. ව්‍යවසාය අංශය තුළ ප්‍රදර්ශනයට එක්වී තිබෙන සමාගම් වෙත විභව්‍ය ඇණවුම් 390කට වැඩි සංඛ්‍යාවක් ලැබී තිබුණි. ශ්‍රී ලංකාව සඳහා වෙන්කළ ශාලාවේ අපනයන සංවර්ධන මණ්ඩල කුටිය තුළ ප්‍රදර්ශනය කළ භාණ්ඩ සඳහා 50ක් පමණ වූ සාධනීය විමසීම් ලැබී තිබුණි. පසු විපරම් කටයුතු සඳහා මෙම විමසීම් අදාළ සමාගම් වෙත යොමුකිරීමට කටයුතු සූදානම් කර තිබේ.
චීනයේ වෙළඳපොළ හැසිරීම සහ ඒ වෙත ප්‍රවේශ වීමේ ක්‍රමෝපාය සම්බන්ධයෙන් වටිනා අදහස් සහභාගිකයන් විසින් ලබාගත් අතර, මෙවර චීන ජාත්‍යන්තර ආනයන ප්‍රදර්ශනයේ තේමාව "හවුල් අනාගතයක්" වශයෙන් දක්වා තිබූ අතර, තිරසර සංවර්ධනය සහ ජාත්‍යන්තර සහයෝගිතාවය සම්බන්ධයෙන් චීනයේ භූමිකාව එයින් අවධාරණය විය. චීන වෙළඳපොළ ගතිකත්වයන් සහ ගෝලීයකරණ ප්‍රයත්න සම්බන්ධයෙන් ශ්‍රී ලාංකික සහභාගිකයන්ගේ අවබෝධය ද මෙමගින් වැඩිදියුණු විය.

## 2.4. සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය

- **ශ්‍රී ලංකාවේ සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් අපනයන වෙළඳ කටයුතුවලට යොමුවීමට මඟ පෙන්වීම පිණිස යූ ටියුබ් වීඩියෝ පට මාලාවක් නිෂ්පාදනය කිරීම**

අපනයන වෙළඳ කටයුතු වෙත ප්‍රවේශය සහ එහි සාර්ථකභාවයට පත්වනුයේ කෙසේ ද යන්න සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් වෙත මඟ පෙන්වීමේ අරමුණැතිව

සකස්කළ යු ටියුබ් වීඩියෝ පට 16කට අදාළ පටිගත කිරීම් සම්පූර්ණ කර තිබේ. පටිගත කළ වීඩියෝ පටවල සංස්කරණ කටයුතු සිදුකරමින් පවතී. වෘතාන්ත 10ක් නිෂ්පාදනය කිරීම සම්පූර්ණ කර තිබේ.

- **නව අපනයනකරුවන් සංවර්ධනය කිරීමේ වැඩසටහන (NEDP)**

නව අපනයනකරුවන් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ, ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන සහ වෙළඳපොළ සබඳතා වැඩසටහන් සඳහා සහභාගීවීමට සමාලෝචිත වර්ෂය තුළ අපනයන සවර්ධන මණ්ඩලය විසින් සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් 30කට පහසුකම් සලස්වා තිබේ. ජර්මනියේ සිට පැමිණි දූත පිරිසක් සමඟ ආනයන ප්‍රවර්ධන කවුළු වැඩසටහනකට සහභාගීවීම සඳහා සමාගම් 18කට පහසුකම් සලස්වා තිබේ. නව සමාගම් 02ක් ආනයන ප්‍රවර්ධන කවුළුවට සම්බන්ධ කරන ලදී. මූල්‍ය සහාය ලබාගැනීම සඳහා තරුණ ව්‍යවසායකයන් 50 දෙනෙකු සුළු පරිමාණ කෘෂි ව්‍යාපාර හවුල්කාරිත්ව වැඩසටහන (SAPP) වෙත යොමුකර තිබේ. මෙහිදී අඩු පොලී අනුපාතිකයක් යටතේ ණය මුදලක් සහ ප්‍රදානයක් හිමි වේ.

- **කාන්තා අපනයනකරුවන් සංවර්ධනය කිරීමේ වැඩසටහන**

අපනයන සංවර්ධන මණ්ඩලය සහ ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය අතර “ITC She Trades Hub in Sri Lanka” සඳහා අදාළ අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. ආනයන ප්‍රවර්ධන කවුළුවේ සහාය සමඟින් “BIOFACH 2025” ප්‍රදර්ශනයට සමගාමීව තාක්ෂණික නිරාවරණය සහ ධාරිතා සංවර්ධන වැඩසටහන සඳහා කාන්තා ව්‍යවසායකයන් 05 දෙනෙකු තෝරාගෙන තිබේ. කාන්තා ව්‍යවසායකයන් 34 දෙනෙකු සඳහා ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳව ධාරිතා සංවර්ධන වැඩසටහන් 08ක් පවත්වා ඇත. ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානයේ අරමුදල්වලින් චීන ජාත්‍යන්තර ආනයන ප්‍රදර්ශනය සඳහා සහභාගී වීමට කාන්තා ව්‍යවසායිකාවක් තෝරාගෙන තිබේ.

මීට අමතරව, සීමිත ජාලගතවීමේ අවස්ථා ආශ්‍රිත තීරණාත්මක බාධකය විසඳීම සම්බන්ධයෙන් කාන්තා ව්‍යවසායිකාවන් සඳහා වූ පළමු ජාලගත සැසිය අපනයන සංවර්ධන මණ්ඩලය විසින් පවත්වන ලද අතර, සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සහ විද්වතුන් ඇතුළුව සහභාගිකයන් 50 දෙනෙකු මීට එක්විය. සහභාගිකයන් දිරිමත් කිරීම සහ දැනුවත් කිරීම මෙහි අරමුණ වූ අතර, කාන්තාවන්ට ජාත්‍යන්තර වෙළඳපොළවල් වෙත පිවිසීමට උපකාරීවීම පිණිස සබඳතා සහ සහයෝගිතාවයන් වැඩිදියුණු කිරීම ද අවධානිත කරුණක් විය. තිරසර අපනයන පරිචයන්, තරඟකාරී වෙළඳපොළවල් තුළ සමෘද්ධිමත්භාවයට පැමිණීම, ප්‍රවේශ වීමේ අභියෝග ජය ගැනීම, නෛතික



අවදානම් කළමනාකරණය, එකඟතාවයන්ට පත්වීමේ දී සංස්කෘතිකමය අසමානතා පිළිබඳ අවබෝධය, සහ තිරසර පරිචයන් සඳහා වර්ධනය වෙමින් පවතින ගෝලීය ඉල්ලුම වැනි අත්‍යවශ්‍ය මාතෘකාවලට අදාළව ප්‍රසිද්ධ දේශක මඩුල්ල විසින් සිය අදහස් හුවමාරු කරගන්නා ලදී.

- **තායිලන්තයේ පැවති Thaifex - Anuga Asia - 2024 (2024 මැයි 28 - ජූනි 1st දක්වා)**




2024 මැයි 28 වැනි දින සිට ජූනි 01 වැනි දින දක්වා තායිලන්තයේ බැංකොක් නුවර පැවති "THAIFEX–Anuga Asia-2024" ප්‍රදර්ශනයේ දී සිය නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම පිණිස සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායක නිෂ්පාදන සමාගම් 06 ක් සහ නව අංකුර සමාගමක් සහභාගි කරවීමට අපනයන සංවර්ධන මණ්ඩලය විසින් කටයුතු සූදානම් කරන ලද අතර කොළඹ රෝයල් තායි තානාපති කාර්යාලයේ සහයෝගිතාවයෙන් ශ්‍රී ලංකාවේ සමාගම් 11ක් නියෝජනය කරන 14 දෙනෙකුගෙන් සමන්විත දූත පිරිසකගේ සහභාගිත්වයෙන් ප්‍රදර්ශනයට සමගාමීව තාක්ෂණික නිරාවරණය සහ ධාරිතා සංවර්ධන වැඩසටහන ද සංවිධානය කරන ලදී.

- **2024 මැයි 13 -15 වැනි දින දක්වා මාලදිවයිනේ පැවති හොටෙල් ඒෂියා ප්‍රදර්ශනය සහ ජාත්‍යන්තර ඉවුම්පිහුම් අභියෝගය**

මාලදිවයිනේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය සහ ශ්‍රී ලංකා-මාලදිවයින් ව්‍යාපාරික කවුන්සිලයේ සහයෝගිතාවයෙන්, අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ප්‍රදර්ශනය සඳහා සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් 15 දෙනෙකු ද ඇතුළත්ව අපනයනකරුවන් 19 දෙනෙකුගේ සහභාගිත්වය සංවිධානය කරන ලදී. B2B ව්‍යාපාරික රැස්වීම් 27 ක් පැවැත්වූ අතර, ඇණවුම් 20 කට අදාළව එකඟතා ඇතිකර ගනිමින් පවතී.

- පහත සඳහන් කර ඇති පරිදි පරාසයක දිවෙන මාතෘකා ආවරණය කරමින්, අපනයන සංවර්ධන මණ්ඩලය විසින් දිවයින පුරා දැනුවත් කිරීමේ වැඩසටහන් 21ක් පවත්වන ලදී:
  - කුරුණෑගල පැවති කෘෂි නිෂ්පාදන සඳහා ශාක සනීපාරක්ෂක අවශ්‍යතා (සහභාගිකයන් 53)
  - මාතර පැවති අපනයන කාර්ය පටිපාටි, ඇසුරුම්කරණය සහ ලේබල් කිරීම (ප්‍රතිලාභීන් 51)
  - කොළඹ දී රජයේ නිලධාරීන් සඳහා පවත්වන ලද අපනයන කාර්යපටිපාටි (කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ නිලධාරින් 30)
  - මධ්‍යම පළාතේ සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා පැවති අපනයන වෙළඳපොළ ප්‍රවණතා සහ කාර්ය පටිපාටි (ප්‍රතිලාභීන් 98)
  - දකුණු පළාතේ සහ මොනරාගල දිස්ත්‍රික්කයේ සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා පැවති දේශීය සහ අපනයන වෙළඳපොළවල් සඳහා පිරිවැය සහ මිලකරණය සහ අපනයන කාර්ය පටිපාටි (සහභාගිකයන් 30)
  - ගාල්ල, මාතර සහ හම්බන්තොට කෘෂි ව්‍යවසායකයන් 70 දෙනෙකු සඳහා පැවති අපනයන සේවා සහ වෙළඳපොළ ප්‍රවණතා
  - යාපනය දිස්ත්‍රික්කයේ ගොවීන් 47 දෙනෙකු සඳහා පැවති අපනයන වෙළඳපොළවල් සඳහා ගොවීන් සූදානම් කරවීම (කෙසෙල්, අඹ, සහ ඵෑනු නිෂ්පාදකයෝ).
  - ජෑම්, සෝස් සහ කෝඩියල් සකස් කිරීම ද ඇතුළුව විශේෂිත පුහුණු වැඩසටහන (යාපනය දිස්ත්‍රික්කයේ ආහාර සහ පාන වර්ග නිෂ්පාදකයන් 41 දෙනෙකු), ධාන්‍ය ගබඩා කිරීම සහ කළමනාකරණය (වවුනියාවේ ගොවීන් 33), සහල් ආශ්‍රිත අයිස්ක්‍රීම් නිෂ්පාදනය (යාපනය දිස්ත්‍රික්කයේ නිෂ්පාදකයන් 39).
  - මහනුවර සහ කුරුණෑගල සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් 100 දෙනෙකු සඳහා ඩිජිටල් අලෙවිකරණ වැඩසටහන් දෙකකි
  - කිලිනොච්චියේ ගොවීන් 41 දෙනෙකු සඳහා අපනයන වෙළඳපොළ ප්‍රවේශය සහ යාපනය දිස්ත්‍රික්කයේ ගොවීන් 42 දෙනෙකු සඳහා විජලනය කිරීමේ තාක්ෂණයන්
  - ව්‍යවසායකයන් 150 දෙනෙකු සඳහා ගම්පහ පැවති ව්‍යාපාරික සායනය
  - අපනයන වෙළඳපොළ වෙත ප්‍රවේශ වීම සඳහා තනි පුද්ගලයන් සහ සමාගම් අවශ්‍ය දැනුමෙන් සහ නිපුණතාවලින් සවිබල ගැන්වීම සඳහා සැලසුම් කළ ආරම්භකයන් සඳහා වන අපනයන පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන
  - රූපලාවන්‍ය සහ පොල් ක්ෂේත්‍රවල විභව්‍ය අපනයනකරුවන් සඳහා අපනයන කාර්ය පටිපාටි පිළිබඳව කාර්මික සංවර්ධන මණ්ඩලය සමඟින් දැනුවත් කිරීමේ සැසි දෙකක් පවත්වන ලදී
  - අපනයන කාර්ය පටිපාටි සම්බන්ධයෙන් අවධානය යොමුකර ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයනාංශයේ සිසුන් 100ක් සඳහා දැනුවත් කිරීමේ සැසියක් පවත්වන ලදී.
  - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යවසායකත්ව අධ්‍යයනාංශයේ තෙවන වසර සිසුන් සඳහා අපනයන වෙළඳපොළ අවස්ථා, ප්‍රවණතා, සහ වෙළඳපොළ ප්‍රවේශ ක්‍රමෝපාය පිළිබඳ වැඩමුළුවක් 2024 අප්‍රේල් මස පවත්වන ලදී.

- ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂක සිසුන් 50 දෙනෙකු සඳහා අපනයන කාර්ය පටිපාටි සහ තොරතුරු රැස්කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ සැසියක් පවත්වන ලදී.
- සබරගමුව විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂක සිසුන් 60 දෙනෙකු සඳහා අපනයන කාර්ය පටිපාටි සහ තොරතුරු රැස්කිරීම, අපනයන සංදර්භයට සහ වෙළඳපොළ ප්‍රවණතා පිළිබඳ දැනුවත් කිරීමේ සැසියක් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පවත්වන ලදී.

## 2.5. අපනයනකරුවන් සඳහා පහසුකම් සැලසීම

- **අපනයනකරුවන්ගේ 24 වැනි සැසිය**

  - මෙම සැසිය 2024 ජූලි 25 වන දින පවත්වන ලද අතර, ආයෝජන ප්‍රවර්ධන ගරු රාජ්‍ය අමාත්‍යවරයා විසින් මුලසුන හොබවන ලදී. අදාළ රජයේ ආයතනවල සහභාගිත්වය සමඟින් මෙම සැසියේ දී ගැටලු 13ක් පිළිබඳව සාකච්ඡා කරන ලදී. එයින් ගැටලු 2ක් විසඳන ලද අතර අනෙකුත් ගැටලු විසඳීම සඳහා නියෝග ලබාදෙන ලදී.

- **වෙළඳ මූල්‍යයන කටයුතු සඳහා විභව්‍ය සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය අපනයනකරුවන් සම්බන්ධ කිරීම පිණිස බැංකු සමඟ හවුල්කාරිත්වයන් ගොඩ නංවාලීම** - අපනයන සංවර්ධන මණ්ඩලය සහ මහජන බැංකුව අතර අවබෝධතා ගිවිසුමක් 2024 මැයි 14 වැනි දින අත්සන් තබන ලදී. අවබෝධතා ගිවිසුම යටතේ කාර්යයන් ඉදිරියට කරගෙන යෑම සඳහා ක්‍රියාකාරි සැලැස්ම සැකසීම අවසන් කර තිබේ. 100කට අධික සහභාගිකයන් සංඛ්‍යාවක් සමඟින් මහජන බැංකුවේ පුහුණු විද්‍යාලයේ දී අපනයන සංවර්ධන මණ්ඩලයේ සහ මහජන බැංකුවේ කේන්ද්‍රීය කණ්ඩායම් වෙත 2024 ජූලි 8 දිනැතිව දැනුවත් කිරීමේ සැසියක් පවත්වන ලදී. එකඟ වූ ක්‍රියාකාරකම් දියත්කිරීම පිණිස දෙපාර්ශවයම කටයුතු කරනු ලැබේ. කළුතර කලාපයේ සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවාසායකයන් 50 කගේ සහභාගිත්වයෙන් අපනයන වෙළඳපොළ ප්‍රවේශය සඳහා අවශ්‍යතා මැයෙන් වූ පළමු දැනුවත් කිරීමේ සැසිය 2024 සැප්තැම්බර් 27 වැනි දින එම කලාපය තුළ දී පවත්වන ලදී.

- අනූදෙදෙනෙකුගේ සහභාගිත්වයෙන් 165 වැනි සහ 166 වැනි **ආනයන සහ අපනයන කාර්ය පටිපාටි පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව** නිමාකරන ලදී. මෙම වැඩසටහන ඔස්සේ උපයන ලද සමස්ත ආදායම රු.මිලියන 2.52 කි. ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ශ්‍රී ලංකා රේගු කටයුතු සඳහා පහසුකම් සැලසීමේ මධ්‍යස්ථානය සහ කටුනායක පිහිටි ගුවන් භාණ්ඩ ගම්මානය වෙත අප්‍රේල් 18 වැනි දින සහ අගෝස්තු 28 වැනි දින ක්ෂේත්‍ර චාරිකා සිදුකරන ලදී. පනස්හත් දෙදෙනෙකුගේ සහභාගිත්වයෙන් 167 වැනි

ආනයන සහ අපනයන කාර්ය පටිපාටි පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව සැප්තැම්බර් 28 වැනි දින ආරම්භ කරන ලදී. මෙම වැඩසටහන ඔස්සේ උපයන ලද සමස්ත ආදායම රු.මිලියන 1.59 කි.

- සිසුන් 37 දෙනෙකුගේ සහභාගිත්වයෙන් 95 වැනි වරට පවත්වන **ජාත්‍යන්තර වෙළඳාමේ මෙහෙයුම් පැතිකඩ සම්බන්ධ පාඨමාලාව** ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ශ්‍රී ලංකා රේගු කටයුතු සඳහා පහසුකම් සැලසීමේ මධ්‍යස්ථානය සහ කටුනායක පිහිටි ගුවන් භාණ්ඩ ගම්මානය වෙත සිදුකළ ක්ෂේත්‍ර චාරිකාව සමඟින් නිමා කරන ලද අතර මෙම පාඨමාලාවෙන් ලැබූ සමස්ත ආදායම රු. මිලියන 1.19කි.
- **අපනයන සංවර්ධන මණ්ඩලයේ උපකාරක කවුළුව සහ පාරිභෝගික සේවා කළමනාකරණ පද්ධතිය (CSM)** - අනෙකුත් අංශ සමඟ සහයෝගිතාවයෙන් පාරිභෝගික සේවා කළමනාකරණ පද්ධතිය ඔස්සේ වෙළඳ තොරතුරු ලබාදීම, පාරිභෝගික තොරතුරු ඇතුළත් කිරීම/ යාවත්කාලීන කිරීම සිදුකරන අතර, පද්ධති දෙකෙහිම ප්‍රගතිය අධීක්ෂණය කෙරේ - පාරිභෝගික සබඳතා කළමනාකරණ පද්ධතිය වෙත පිවිසීම් 154 කි.

- **නිදහස් වෙළඳ ගිවිසුම්/ ඒකාබද්ධ ප්‍රකාශනවලට අදාළ කාර්යයන්**

  2024 ජනවාරි 8-10 වැනි දින දක්වා නවදිල්ලියේ දී පැවති ශ්‍රී ලංකා-ඉන්දියා ආර්ථික සහ තාක්ෂණික සහයෝගිතා ගිවිසුමට (ETCA) අදාළව 13 වැනි වටයේ එකඟතාවයන්ට එළැඹීමේ සාකච්ඡා සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය ද සහභාගි විය. සනීපාරක්ෂක සහ ශාක සනීපාරක්ෂක (SPS) පියවර සහ වෙළඳාම සඳහා තාක්ෂණික බාධා (TBT) මෙම වටයේ දී අවධානය යොමු වූ මාතෘකා අතර විය. ETCA ගිවිසුමට අදාළව ශ්‍රී ලංකාවේ ඉල්ලීම් ලැයිස්තුව සහ පිරිනැමීම් ලැයිස්තුව සඳහා සහ ප්‍රභවස්ථාන රීති සඳහා අදහස් ලබාදෙන ලදී. 2024 මැයි මස 8 වැනි දින පැවති ශ්‍රී ලංකා-ඕස්ට්‍රේලියා වෙළඳ සහ ආයෝජන ගිවිසුමෙහි (TIFA) කාර්තුමය සමාලෝචනය සඳහා වූ සූදානම් වීමේ රැස්වීමට සහභාගී විය. අප්‍රේල් සහ ජූලි මාසවල පැවති ඉන්දුනීසියා - ශ්‍රී ලංකා වරණීය වෙළඳ ගිවිසුමේ භාණ්ඩ වෙළඳාම සහ ප්‍රභවස්ථාන රීති සම්බන්ධයෙන් එකඟතාවයට එළැඹීමේ කමිටුවේ 1 වැනි සහ 2 වැනි රැස්වීම් සඳහා ද සහභාගි විය. 2024 ජූනි 23 වැනි පැවති ECTA ගිවිසුමේ එකඟතාවයට එළැඹීමේ සාකච්ඡා වටය සඳහා සහභාගි විය. ශ්‍රී ලංකාව සහ ඉන්දුනීසියාව අතර යෝජිත වරණීය වෙළඳ ගිවිසුමේ ශ්‍රී ලංකාවේ ඉල්ලීම් ලැයිස්තුව සහ පිරිනැමීම් ලැයිස්තුව සම්බන්ධ කටයුතු නිමා කිරීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය ද සහභාගි වේ.

- **ඉන්දියානු සාගරය ආශ්‍රිත රටවල සංගමයේ (IORA) ව්‍යාපාරික හමුව සඳහා සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ/ කාන්තා ව්‍යවසායිකාවන්ගේ සහභාගිත්වය සංවිධානය කිරීම - 2024 මැයි 28 සහ 29, කොළඹ දී ය -**

  ව්‍යාපාරික හමුව සහ B2B ව්‍යාපාරික රැස්වීම් සඳහා සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් 20 දෙනෙකුගේ සහභාගිත්වය සංවිධානය කරන ලදී. කාන්තා ව්‍යවසායිකාවන්, තොරතුරු සන්නිවේදන තාක්ෂණ සහ කෘෂිකර්ම සමාගම් මීට ඇතුළත් විය. අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ලියාපදිංචි වීමේ ගාස්තුවෙන් 75%ක් දරන ලද අතර, ඉතිරි 25% අදාළ සමාගම් විසින් දරන ලදී. ඒ අනුව අපනයන

සංවර්ධන මණ්ඩලයට රු.450,000ක් වැය වූ අතර, සමාගම් 20 විසින් රු.150,000ක දායකත්වයක් දරන ලදී. සහභාගිකයන් ඔවුන්ගේ විදේශ සමස්ථයන් සමඟ සන්නිවේදනයන් සිදුකළ අතර, සමාගම් තොරතුරු ද හුවමාරු කරගන්නා ලදී.

## 2.6. ජාතික ඇසුරුම්කරණ මධ්‍යස්ථානය (NPC)

ශ්‍රී ලංකාවේ නිෂ්පාදන කර්මාන්තයේ වර්ධනය සඳහා රුකුලක් සැපයීම සඳහා ජාතික ඇසුරුම්කරණ මධ්‍යස්ථානය, අපනයන සංවර්ධන මණ්ඩල පරිශ්‍රය තුළම ස්ථාවර වශයෙන් ස්ථාපනය කර තිබේ. ඇසුරුම්කරණ සංවර්ධන ව්‍යාපෘති සඳහා කේන්ද්‍රීය ආයතනය වශයෙන් මෙම මධ්‍යස්ථානය කටයුතු කරනු ලැබේ. සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සහ විභව්‍ය අපනයකරුවන් ආසන්න වශයෙන් 104 දෙනෙකු සඳහා ඇසුරුම්කරණය සම්බන්ධිත උපදේශක සේවා ලබාදී ඇත. අපනයන සංවර්ධන මණ්ඩලයේ ජාතික ඇසුරුම්කරණ මධ්‍යස්ථාන ඒකකය විසින් සමාලෝචිත වර්ෂය තුළ අපනයනකරුවන්, විභව්‍ය අපනයනකරුවන්, සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සහ කාන්තා ව්‍යවසායකයන් සඳහා ඇසුරුම්කරණය පිළිබඳ මාර්ගගත වෙබිනාර් වැඩසටහනක්, දැනුවත් කිරීමේ වැඩසටහන් දෙකක් සහ පුහුණු වැඩසටහන් දෙකක් පවත්වන ලදී.

බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී 2024 ඔක්තෝබර් 25 සිට 27 වැනි දින දක්වා පැවති ලංකා ඇසුරුම් ප්‍රදර්ශනයේ දී ශ්‍රී ලංකා ඇසුරුම්කරණ ආයතනයේ සභාපතිවරයාගේ ආරාධනයෙන් ජාතික ඇසුරුම්කරණ මධ්‍යස්ථානය විසින් සිය විශේෂඥතාවය ප්‍රදර්ශනය කරන ලදී. මෙම ප්‍රදර්ශනයේ දී, ප්‍රදර්ශකයන් 150කට වැඩි සංඛ්‍යාවක් සිය නව්‍ය යන්ත්‍රෝපකරණ සහ තිරසර ඇසුරුම් විසඳුම් ඉදිරිපත් කරන ලදී. ජාතික ඇසුරුම්කරණ මධ්‍යස්ථානයේ තොරතුරු කුටිය මගින් එහි පැමිණි 75ක් පමණ පිරිසට අපනයන කාර්ය පටිපාටි, තත්ත්ව සහතික, ගැනුම්කරුවන් සමඟ සබඳතා, අපනයන සැකසුම් සඳහා තාවකාලික ආනයන (TIEP) පිළිබඳ විස්තර, අපනයනය කළ හැකි නිෂ්පාදන සඳහා ඇසුරුම් මාර්ගෝපදේශ, ඇසුරුම් ක්ෂේත්‍රය තුළ සාර්ථකවීම සඳහා ඔවුන් සවිබල ගැන්වීම වැනි අත්‍යවශ්‍ය මාතෘකා ආවරණය වන පරිදි වටිනා අදහස් ලබාදෙන ලදි.

## 2.7. ජාතික කාබනික පාලන ඒකකය (NOCU)

අපනයන සංවර්ධන මණ්ඩලය යටතේ ස්ථාපිත කර ඇති ජාතික කාබනික පාලන ඒකකය විසින් සමාලෝචිත කාල සීමාව තුළ දිවයින පුරා කාබනික කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම සඳහා සිය

ප්‍රයත්නයන් දියත් කරන ලදී. එම ප්‍රයත්නයන්ගේ එක් පියවරක් වශයෙන්, පළමු දැනුවත් කිරීමේ වැඩසටහන සහභාගිකයන් 80ක් සඳහා 2024 ජූලි25 දිනැතිව කෑගල්ලේ දී පවත්වනු ලැබීය.






විශ්වාසනීය කාබනික කෘෂිකාර්මික අගය දාමයක් ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම ඒකකය සතු භූමිකාව සහ දායකත්වය  එම වැඩසටහටනේ දී අවධානයට ලක්විය. කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ විවිධ අංශ නියෝජනය කළ සහභාගිකයන් සඳහා කාබනික කෘෂිකර්ම ශිල්පීය ක්‍රම, සහතිකකරණ ක්‍රියාවලි, කාබනික ප්‍රමිතීන්, සහ වෙළඳපොළ අවස්ථා පිළිබඳ වටිනා අදහස් ලබාගැනීමට හැකිවිය.

ප්‍රතිපත්ති සහ ක්‍රමෝපාය සැලසුම් අංශය

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ කාර්යසාධනය වැඩිදියුණු කිරීම සඳහා මධ්‍ය කාලීන වශයෙන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත පියවර**

අපනයන ආදායම ඉහළ නැංවීම සහ රටෙහි ආර්ථික වර්ධනය සඳහා දායකවීමේ අරමුණු ඇතිව ශ්‍රී ලංකාවේ අපනයන සංවර්ධනය සහ ප්‍රවර්ධනය සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් කටයුතු කරනු ලැබේ. නෛතික වශයෙන් බලය පැවරී ඇති ප්‍රමුඛතම වෙළඳ ප්‍රවර්ධන ආයතනය වශයෙන් (Trade Promotion Organization - TPO), ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ජාත්‍යන්තර වෙළඳ කටයුතුවලට අදාළ සියලු කාර්යයන් සඳහා කේන්ද්‍රීය ආයතනය වශයෙන් කටයුතු ඉටු කරනු ලැබේ. "පොහොසත් රටක් – ලස්සන ජීවිතයක්" යන රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් කර ඇති පරිදි 2030 වර්ෂය වනවිට ඇ.ඩො.බිලියන 36ක ජාතික අපනයන ඉලක්කය සාක්ෂාත් කරගැනීම සඳහා ක්‍රමෝපායික මූලාරම්භයන් දියත් කරමින් අපනයන-හිතකාමී පරිසරයක් ගොඩනැංවීම සහතික කරමින් ප්‍රතිපත්ති උපදේශක, අධීක්ෂක, ප්‍රවර්ධක, පහසුකම් සපයන්නා සහ දැනුම් සම්පාදකයා වශයෙන් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ප්‍රමුඛ භූමිකාවක් ඉටු කරනු ලැබේ.

එම ඉලක්කය සපුරාගැනීම සඳහා, අපනයන සංවර්ධන මණ්ඩලය විසින් පහත දැක්වෙන උපායමාර්ගික ආධාරක යටතේ සිය කටයුතු ක්‍රියාත්මක කරනු ලැබේ.

1. **ශ්‍රී ලංකාවේ නිෂ්පාදන සහ සේවා සඳහා ගෝලීය වශයෙන් වෙළඳපොළ ප්‍රවේශයක් ඇති කිරීම**

- ප්‍රමුඛතාවය ලබාදෙන සහ නැඟී එන වෙළඳපොළවල දී සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් කෙරෙහි විශේෂ අවධානය යොමුකරමින් ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනවල දී ශ්‍රී ලංකාවේ සහභාගිත්වය ලබාදීමට කටයුතු සංවිධානය කිරීම
- තෝරාගත් වෙළඳපොළවල් වෙත සහ එම වෙළඳපොළවලින් ශ්‍රී ලංකාව වෙත වශයෙන් වෙළඳ දූත ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැලසීම
- වෙළඳපොළ පිළිබඳ වාණිජමය වැදගත්කමකින් යුතු තොරතුරු සහ වෙළඳපොළ සූක්ෂම තොරතුරු ලබාදීම
- අපනයනකරුවන් සමඟ ගෝලීය ගැනුම්කරුවන් සම්බන්ධ කිරීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශය සහ එතෙර පිහිටි ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාල සමඟ සහයෝගීතාවයන් ශක්තිමත් කිරීම
- ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා මාර්ගගත සම්මන්ත්‍රණ සහ මාර්ගගත ක්‍රමවේද ඔස්සේ ව්‍යාපාරික හමු පැවැත්වීම
- ද්විපාර්ශවික වෙළඳ සහයෝගිතාවයන් වැඩිදියුණු කිරීම සඳහා එතෙර ශ්‍රී ලංකා තානාපති කාර්යාල සහ මෙරට පිහිටි විදේශ රටවල තානාපති කාර්යාල සමඟ අඛණ්ඩව අවශ්‍ය සංවාදවල නිරතවීම

2. **නව අපනයනකරුවන් සංවර්ධනය කිරීම**

- රට තුළ විවිධ ප්‍රදේශවල සිටින විභව්‍ය අපනයනකරුවන් සහ ව්‍යවසායකයන් හඳුනාගැනීම සහ ඔවුන්ට සහාය ලබාදීම

- ඉලක්කගත ධාරිතා සංවර්ධන වැඩසටහන් හරහා ඔවුන්ගේ හැකියාවන් ශක්තිමත් කිරීම
- නව නිෂ්පාදන බිහිවීම සඳහා පහසුකම් සැලසීම සහ එකී නිෂ්පාදන ජාත්‍යන්තර තත්ත්ව පාලන ප්‍රමිති හා වෙළඳපොළ අවශ්‍යතා සමඟ අනුකූලවීම සහතික කිරීම
- ගෝලීය අපනයන අවස්ථාවන් සඳහා ඔවුන්ව සම්බන්ධ කිරීම

**3. ශ්‍රී ලංකා සන්නාමය ප්‍රචලිත කිරීම සහ ගෝලීය වශයෙන් ශ්‍රී ලංකාවේ නිෂ්පාදන ස්ථානගත කිරීම**

- ශ්‍රී ලංකාවේ ජාතික අපනයන සන්නාමය වන “Your Vital Island” සඳහා වන ප්‍රවර්ධන සැලැස්ම 2024 - 2027
- ශ්‍රී ලංකාවේ කුළුබඩු සඳහා “Ceylon Spice” සන්නාමය සහ “Pure Ceylon Cinnamon” වෙළඳ ලකුණ ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන
- ආරක්ෂිත භූගෝලීය දර්ශකයක (Protected Geographical Indication- PGI) තත්ත්වය යන සහතිකකරණය සහිතව ශ්‍රී ලංකාවේ කුරුඳු (Ceylon Cinnamon) ලියාපදිංචි කිරීම
- කාබනික සහ ස්වභාවික නිෂ්පාදන සඳහා මැදපෙරදිග පැවැත්වෙන 'Organic & Natural Product Dubai 2025' වෙළඳ ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකාවේ කාබනික නිෂ්පාදන සහ ලාංඡනය
- ශ්‍රී ලංකාවේ හස්ත කර්මාන්ත නඟා සිටුවීම සඳහා 'Creative Sri Lanka 2030' වැඩසටහන
- ඇඟළුම්, මෝටර් වාහන සහ සමුද්‍ර සහ අක්වෙරළ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් එම ක්ෂේත්‍රවලට අදාළව වීඩියෝ පට නිර්මාණය කිරීම
- ශ්‍රී ලංකාවේ අධ්‍යාපනික සන්නාම මෙහෙයුම 2025 (3 වසරක සැලැස්ම)
- ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය පිළිබඳ ආයතනික වීඩියෝව

**4. වෙළඳ තොරතුරු සහ වෙළඳපොළ පිළිබඳ වාණිජමය වැදගත්කමකින් යුතු තොරතුරු**

- වෙළඳ තොරතුරු, වෙළඳපොළ පිළිබඳ වාණිජමය වැදගත්කමකින් යුතු තොරතුරු, ඊ-වාණිජ්‍යය සේවා සහ අපනයන සම්බන්ධිත ප්‍රකාශන
- අපනයන කාර්යසාධන දර්ශක
- Business Lanka සඟරාව
- අපනයන ප්‍රවෘත්ති (Expo News)
- ශ්‍රී ලංකාවේ අපනයනකරුවන්ගේ නාමාවලිය

**5. මාර්ගගත ක්‍රමවේද ඔස්සේ පෙනී සිටීම වැඩිදියුණු කිරීම සඳහා ව්‍යාපාරවලට සහාය ලබාදීම**

- ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වෙබ් අඩවිය ඔස්සේ ශ්‍රී ලංකාවේ නිෂ්පාදන සහ සේවා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ප්‍රවර්ධනය කිරීම
- ගෝලීය වෙළඳ කටයුතුවල වෙනස්වීම් සංදර්භයන් සම්බන්ධයෙන් වෙළඳපොළ දැනුවත් කිරීම් ප්‍රකාශයට පත් කිරීම

## 6. අපනයනකරුවන් සඳහා පහසුකම් සැලසීම

- අපනයනකරුවන්ට සහාය ලබාදීමේ කාර්යය සඳහා වූ "HELP DESK" ක්‍රියාත්මක කිරීම හරහා ඔවුන් වෙනුවෙන්ම වූ සහාය ලබාදීම
- අපනයන සංවර්ධන අමාත්‍ය සභාව (EDCM) හරහා අපනයනකරුවන්ගේ ප්‍රතිපත්තිමය මට්ටමේ ගැටලු විසඳීම
- අපනයනකරුවන් විසින් මුහුණ දෙන ගැටලු විසඳීම (අපනයනකරුවන්ගේ සංසද)
- අපනයනකරුවන් විසින්ම වෙළඳ කටයුතු සඳහා සිය ප්‍රයත්නයන් දැරීමට සහාය පිණිස වූ Own Marketing Efforts Development Assistance යෝජනා ක්‍රමය
- "ජනාධිපති අපනයන සම්මාන" ඔස්සේ විශිෂ්ට අපනයනකරුවන් පිළිගැනීමට ලක්කිරීම
- එක් එක් ක්ෂේත්‍රවලට නිශ්චිත අපනයන අභියෝග විසඳීම සඳහා උපදේශක කමිටු පිහිටුවීම සහ අධීක්ෂණය කිරීම
- ආනයන/අපනයන කාර්ය පටිපාටි, ජාත්‍යන්තර වෙළඳාම සහ අපනයන ඇසුරුම්කරණයේ මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන් පැවැත්වීම
- අපනයන කටයුතුවලට අදාළ විෂයන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්, නිපුණතා සංවර්ධන වැඩසටහන් සහ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.

## 7. සැපයුම් වැඩිදියුණු කිරීම සහ ගුණාත්මකබව වැඩිදියුණු කිරීම

- ශ්‍රී ලංකාවේ කාබනික කෘෂිකර්ම අගය දාමයේ ප්‍රතිරූපය විශ්වාසනීයත්වය ආරක්ෂා කිරීම හා සුරක්ෂිත කිරීම
- ජාතික කාබනික පාලන ඒකකය (NOCU) ක්‍රියාත්මකවීම සඳහා පහසුකම් සැලසීම
- එක ගමකින් එක් නිෂ්පාදනයක් වැඩසටහන (One Village One Product Programme) ඔස්සේ අපනයන සැපයුම් පදනම සංවර්ධනය කිරීම
- කාන්තා ව්‍යවසායකයන් සංවර්ධනය කිරීම

## 8. අපනයන නිෂ්පාදන ගම්මාන (EPV)

- අපනයන නිෂ්පාදන ගම්මාන සඳහා නිෂ්පාදන හඳුනාගැනීම
- හඳුනාගත් නිෂ්පාදන සඳහා සුදුසු භූගෝලීය ස්ථාන හඳුනාගැනීම
- මෙම ගම්මාන පොකුරු වශයෙන් සංවිධානය කිරීම සහ අපනයන නිෂ්පාදන ගම්මාන සමාගම් ස්ථාපනය කිරීම
- ඔවුන් අපනයනකරුවන් ලෙස මනාව හැඩගැස්සවීම සඳහා ධාරිතා සංවර්ධන කිරීම
- ජාත්‍යන්තර ප්‍රමිති සහ රටවල්/ වෙළඳපොළ වශයෙන් පවතින අනෙකුත් අවශ්‍යතාවලට අනුව නිෂ්පාදන සකස් කිරීම සහ අනුකූලතාවය.
- අපනයන වෙළඳපොළට මෙම ගම්මාන හඳුන්වාදීම සහ අපනයන සමාගම් සමඟ සම්බන්ධ කිරීම

ප්‍රතිපත්ති සහ ක්‍රමෝපාය සැලසුම් අංශය

## 2025 වර්ෂය සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ අනාගත සැලසුම්

රජයේ අරමුණු සහ 2030 වර්ෂය වනවිට වාර්ෂික ජාතික අපනයන ඉලක්කය වූ ඇ.ඩො.බිලියන 36 ක මට්ටමට ළඟාවීම සඳහා අනුගත වීම පිණිස, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සවිස්තරාත්මක ආයතනික සැලැස්ම 2025-2030 සකස් කරමින් සිටී. ක්‍රමෝපායික අරමුණු මාලාවක් ඔස්සේ ශ්‍රී ලංකාවේ අපනයනයන් ඉදිරියට රැගෙන යැමට මෙම සැලැස්ම මගින් අවධානය යොමු කෙරේ.

- ශ්‍රී ලංකාවේ අපනයන නිෂ්පාදන සහ සේවා සඳහා විශිෂ්ට ප්‍රතිරූපයක් ගොඩනැංවීම.
- ඉහළ අගය එකතු කිරීමක් සහ සන්නාමකරණයක් සමඟ නිෂ්පාදන සහ සේවාවල අපනයන අගය ඉහළ නැංවීම.
- දැනට පවතින ඉහළ ගුණාත්මකබවකින් හා වටිනාකමකින් යුතු භාණ්ඩ අපනයන කෙරෙන වෙළඳපොළවල් (premium markets) ස්ථාවර කරගනිමින්, විභවතාවයක් සහිත සුවිශේෂී කාණ්ඩගත වෙළඳපොළවල් (niche markets) වෙත සිදුකරන අපනයන ඉහළ නැංවීම.
- මනා වෙළඳපොළ ප්‍රවේශයක් සමඟින් කලාපීය අගය දාම ජාලයන් සමඟ ඒකාබද්ධ වීම.
- අපනයන ක්ෂේත්‍රය සඳහා අගය දාම ක්‍රියාකාරකම්වල දායකත්වය වැඩිදියුණු කිරීම.
- රට තුළ පුළුල් පදනමකින් යුතු අපනයන භාණ්ඩ සංයුතිය සහ අපනයනකරුවන්ගේ ප්‍රජාව.
- කාර්යක්ෂම, පාරදෘශ්‍ය සහ පිරිවැය ඵලදායි ආකාරයෙන් රටවල් හරහා වෙළඳ කටයුතු සිදුකිරීම සහතික කරලීම පිණිස වෙළඳාම සඳහා පහසුකම් සැලසීම.
- ජාත්‍යන්තර රෙගුලාසි සහ ප්‍රමිත සමඟ අනුකූලවීම සඳහා අපනයනකරුවන් දිරිගැන්වීම සහ පාරිසරික, සමාජ සහ පාලන (ESG) මූලධර්මවල සාමූහික වාසි අත්පත් කරගැනීම.
- සේවක ඵලදායිතාවය සහ කැපවීම සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකරමින් හරයාත්මක අගයන් මත පදනම් වූ විශිෂ්ට සේවක කණ්ඩායමක් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය තුළ ගොඩනැංවීම.

මීට අමතරව, අපනයනකරුවන් සඳහා රුකුලක් වන, ගෝලීය වෙළඳපොළ තුළ ශ්‍රී ලංකාවේ නියෝජනය ශක්තිමත් කිරීමට, සහ දිගු කාලීන ආර්ථික වර්ධනය වැඩි දියුණු කිරීමට උපකාරී වන බලගැන්වූ පරිසරයක් නිර්මාණය කිරීම උදෙසා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය කැපවී සිටී. යථෝක්තව සඳහන් කළ ක්‍රමෝපායික මූලාරම්භයන් ඔස්සේ, ජාත්‍යන්තර වෙළඳ ක්ෂේත්‍රය තුළ උද්‍යෝගී සහ ඔරොත්තු දීමේ හැකියාවැති බලවේගයක් ලෙස ශ්‍රී ලංකාවේ අපනයන අංශය ස්ථානගත කිරීම සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය අපේක්ෂා කරයි.

# මූල්‍ය ප්‍රකාශන 2024

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**
**2024 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය කාර්යසාධනය සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය**

| | සටහන | ශ්‍රී.ලං.ගි.ප්‍ර 2024.12.31 රු. | ශ්‍රී.ලං.ගි.ප්‍ර 2023.12.31 රු. |
|---|---|---|---|
| **ආදායම්** | | | |
| ආදායම | (3) | 819,152,485 | 628,648,002 |
| අනෙකුත් ආදායම් | (4) | 62,386,120 | 85,718,546 |
| මුළු ආදායම | | 881,538,605 | 714,366,548 |
| **වියදම්** | | | |
| අපනයන සංවර්ධන වියදම් | (5) | 471,613,457 | 317,891,972 |
| පරිපාලන වියදම් | (6) | 405,688,100 | 400,232,173 |
| ආයෝජන හා අනෙකුත් ලැබීම් සඳහා හානිකරණ වෙන්කිරීම් | (7) | 22,771 | 2,550,431 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද වියදම් ඉක්මවූ ආදායම | | 4,214,277 | (6,308,028) |
| මූල්‍ය පිරිවැය | (8) | 181,277 | 115,321 |
| වියදම් ඉක්මවූ ආදායම් අතිරික්තය - සාමාන්‍ය ක්‍රියාකාරකම්වලින් | | 4,033,000 | (6,423,349) |
| ආශ්‍රිත සමාගමේ ලාභය/(අලාභය) පංගුව | | 71,643,925 | 90,189,877 |
| | | 75,676,925 | 83,766,528 |
| **අනෙකුත් විස්තීර්ණ ආදායම්** | | | |
| ආයුගණක තක්සේරු ලාභය /අලාභය | | (6,342,464) | (6,108,802) |
| කොටස් අගයේ වැඩිවීම | (12.1) | 2,376,937 | |
| වර්ෂය සඳහා අනෙකුත් විස්තීර්ණ ආදායම් | | (3,965,527) | (6,108,802) |
| **වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය** | | **71,711,399** | **77,657,726** |

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**
**2024 දෙසැම්බර් 31 වැනි දිනට**
**මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

| | සටහන | ශ්‍රී.ලං.ගි.ප්‍ර 2024.12.31 රු. | ශ්‍රී.ලං.ගි.ප්‍ර 2023.12.31 රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | (9) | 70,860,906 | 87,928,377 |
| අස්පෘශ්‍ය වත්කම් | (10) | 2,740,262 | 3,853,703 |
| ආශ්‍රිත සමාගම්වල ආයෝජන - ලැයිස්තුගත නොකළ | (11) | 1,413,097,405 | 1,341,453,480 |
| | | 1,486,698,573 | 1,433,235,560 |
| අනෙකුත් ජංගම නොවන මූල්‍ය වත්කම් | (12) | 200,031,835 | 201,322,635 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | 1,686,730,408 | 1,634,558,195 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | (13) | 3,443,376 | 3,508,758 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | (14) | 13,221,489 | 9,675,963 |
| අත්තිකාරම් හා පූර්ව ගෙවීම් | (15) | 91,983,286 | 78,489,048 |
| මුදල් හා මුදල් සමාන දෑ | (16) | 96,710,468 | 183,450,373 |
| | | 205,358,619 | 275,124,142 |
| **මුළු වත්කම්** | | **1,892,089,027** | **1,909,682,337** |
| **හිමිකම් හා වගකීම්** | | | |
| **ප්‍රාග්ධනය හා සංචිත** | | | |
| ලැබූ ප්‍රදානයන් - හිමිකම් දායකත්වය | (17) | 10,014,284 | 10,014,284 |
| වියදම් ඉක්ම වූ උපචිත ආදායම | | 1,645,431,282 | 1,632,017,200 |
| **මුළු හිමිකම්** | | 1,655,445,566 | 1,642,031,484 |
| **ප්‍රදානයන්** | | | |
| ලැබූ ප්‍රදානයන් - අනෙකුත් | (18) | 41,633,010 | 22,264,655 |
| | | 41,633,010 | 22,264,655 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| වෙන් කිරීම් හා අනෙකුත් වගකීම් | (19) | 135,373,521 | 175,431,634 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැදීම් | (20) | 25,251,680 | 33,998,835 |
| | | 160,625,201 | 209,430,469 |
| **ජංගම වගකීම්** | | | |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | (21) | 34,385,250 | 35,955,729 |
| | | 34,385,250 | 35,955,729 |
| **මුළු හිමිකම් හා වගකීම්** | | **1,892,089,027** | **1,909,682,337** |

පිටු අංක 11 සිට 23 දක්වා වූ ගිණුම්කරණ ප්‍රමිත හා පිටු අංක 24 සිට 40 දක්වා වන සටහන් , ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව සැකසූ මෙම මූල්‍ය ප්‍රකාශවලම ඒකාබද්ධ කොටසකි . මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා කළමනාකාරිත්වය හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වගකීම දරනු ලැබේ. මෙම මූල්‍ය ප්‍රකාශ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ අතර ඒ වෙනුවෙන් අත්සන් තබනුයේ ,

| | | | |
|---|---|---|---|
| ................... | ................... | ................... | ................... |
| මංගල විජේසිංහ | තුෂාර වමින්ද | චමිල් උඩවත්ත | කේ.ඩී.පෙරේරා |
| **සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී** | **අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික** | **අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික** | **අධ්‍යක්ෂ මුදල්** |

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**
**2024 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය**

| | හිමිකම් දායකත්වය | උපචිත පොළිය | ප්‍රත්‍යාගණනිත සංචිතය | එකතුව |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| **2021 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 10,014,284 | 1,241,833,712 | - | 1,251,847,996 |
| වියදම් ඉක්ම වූ ආදායම | - | 228,332,313 | 85,996,927 | 314,329,240 |
| පූර්ව වර්ෂ ගැලපුම් | - | (1,803,478) | | (1,803,478) |
| **2022 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **10,014,284** | **1,468,362,547** | **85,996,927** | **1,564,373,758** |
| වියදම් ඉක්ම වූ අතිරික්ත ආදායම | - | 77,657,726 | - | 77,657,726 |
| පූර්ව වර්ෂ ගැලපුම් | - | - | | - |
| **2023 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **10,014,284** | **1,546,020,273** | **85,996,927** | **1,642,031,484** |
| වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය | - | 71,711,399 | | 71,711,399 |
| ස්ථාවර වත්කම් අලෙවියෙහි ප්‍රත්‍යාගණනය | | 1,100,000 | (1,100,000) | - |
| භාණ්ඩාගාරය වෙත ගෙවීම් | | (58,297,317) | | (58,297,317) |
| පූර්ව වර්ෂ ගැලපුම් | | | | - |
| **2024 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **10,014,284** | **1,560,534,355** | **84,896,927** | **1,655,445,566** |

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**
**2024 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | සටහන් | 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| බදුවලට පෙර වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය | | 71,711,399 | 77,657,727 |
| *ගැලපුම් කළා* | | | |
| ස්ථාවර වත්කම් ක්ෂය කිරීම | | 19,323,775 | 21,732,900 |
| අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය | | 1,113,440 | 475,357 |
| ආයෝජනවලින් ලද ආදායම | | (119,463,921) | (160,734,162) |
| ආයුගණක තක්සේරු ලාභය / පාඩුව | | 6,342,464 | 6,108,802 |
| පූර්ව වර්ෂය සඳහා ගැලපුම් | | - | - |
| රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය | | (7,709,492) | (6,371,198) |
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම් | | 3,625,418 | 7,029,764 |
| කාර්ය මණ්ඩල ණය ක්‍රමක්ෂය | | 5,271,105 | 4,427,352 |
| අඩුකළ පොලිය | | (6,453,830) | (8,167,658) |
| විවිධ වත්කම් මිල දී ගැනුම් | | - | - |
| ස්ථාවර වත්කම් අලෙවිය | | (886,000) | - |
| වටිනාකමක් වශයෙන් හානිකරණය සඳහා වෙන්කිරීම් | | (2,354,166) | 2,550,431 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම්** | | **(29,479,808)** | **(55,290,685)** |
| තොග (වැඩිවීම)/ අඩුවීම | | 65,382 | (283,394) |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම | | (3,755,719) | 1,110,603 |
| අත්තිකාරම් හා පූර්ව ගෙවීම්වල (වැඩිවීම)/අඩුවීම | | (13,494,238) | (40,373,036) |
| වෙන්කිරීම් හා අනෙකුත් වගකීම් වැඩිවීම /(අඩුවීම) | | (40,058,113) | 117,058,563 |
| අනෙකුත් ගෙවිය යුතු දෑ වැඩිවීම /(අඩුවීම) | | (1,570,478) | (29,429,493) |
| **මෙහෙයුම්වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රමාණය** | | **(88,292,974)** | **(7,207,442)** |
| ගෙවන ලද මූල්‍ය පිරිවැය | | | - |
| ගෙවන ලද නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය | | (18,715,037) | (6,911,545) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වල උපයෝගී වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(107,008,011)** | **(14,118,987)** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| අපනයනකරුවන්ගේ ණය ආපසු අය කර ගැනීම | | 43,000 | 146,492 |
| ණය ආපසු අය කර ගැනීම | | 4,994,885 | 3,804,595 |
| ස්ථාවර වත්කම් අලෙවිය | (3) | 1,786,000 | - |
| දේපළ, පිරියත හා උපකරණ අත්පත් කරගැනීම | (9) | (3,156,304) | (8,253,368) |
| පරිගණක මෘදුකාංග අත්පත් කරගැනීම | (9) | - | (4,183,761) |
| ලාභාංශ ලැබීම් | (4) | 43,194,741 | 58,193,884 |
| ලැබූ පොලී ආදායම | (4) | 4,625,255 | 12,350,401 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ** | | **51,487,577** | **62,058,243** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| 2023 ලාභයෙන් භාණ්ඩාගාර දායකත්වය | | (58,297,317) | |
| රජයේ ප්‍රදාන /ලද GIZ අරමුදල් | | 27,077,846 | 13,702,128 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වල උපයෝගී වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | | **(31,219,471)** | **13,702,128** |
| **මුදල් සහ මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම /(අඩුවීම)** | | **(86,739,905)** | **61,641,383** |
| වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ | | **183,450,373** | **121,808,990** |
| වර්ෂය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දෑ | | **96,710,468** | **183,450,373** |
| ***මුදල් හා මුදල් සමාන දෑ වල විශ්ලේෂණය*** | | | |
| අතැති මුදල් | (16) | 2,628 | 1,864 |
| බැංකුවේ ඇති මුදල් - වාසිදායක | (16) | 96,707,840 | 183,448,509 |
| | | **96,710,468** | **183,450,373** |

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**
**2024 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**පොදු තොරතුරු සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**මූල්‍ය වාර්තාකරණය සඳහා අධිකාරියේ කළමනාකාරිත්වයේ වගකීම පිළිබඳ ප්‍රකාශය**

1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩල පනතේ 16 වැනි වගන්තිය (රාජ්‍ය සංස්ථා සඳහා (මුදල් පාලන) පනතේ විධිවිධාන අදාළ කරගැනීම) ප්‍රකාරව, මණ්ඩලයේ කළමනාකාරිත්වය පහත කරුණු සම්බන්ධයෙන් වගකීම දරනු ලැබේ.

i. අධිකාරියේ ආදායම් හා වියදම්, වත්කම් හා වගකීම් සහ අනෙකුත් සියලුම මූල්‍ය ගනුදෙනු පිළිබඳ විධිමත් ගිණුම් පොත් පවත්වාගෙන යෑම.

ii. මණ්ඩලයේ මූල්‍ය කාර්යසාධනය සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් ඉදිරිපත් කිරීමේ අරමුණ සඳහා 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත යටතේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් සම්මත කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතීන්වලට අනුකූලව ගිණුම් පිළියෙල කිරීම.

iii. මණ්ඩලයේ වත්කම්වල සුරක්ෂිතභාවය ආරක්ෂා කිරීමට මෙන්ම වංචාවන් හා අනෙකුත් අක්‍රමවත් ක්‍රියා වැළැක්වීම සඳහා යෝග්‍ය අභ්‍යන්තර පාලනයක් ස්ථාපිත කිරීම සඳහා යෝග්‍ය පියවර ගැනීම.

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**
**2024 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**පොදු තොරතුරු සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති**

## 1. පොදු තොරතුරු

### 1.1 නිත්‍ය වශයෙන් ප්‍රතිෂ්ඨාපිත ස්ථානය සහ නෛතික ආකාරය

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය 1979 අංක 40 දරන පනත යටතේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාපනය කර ප්‍රතිෂ්ඨාපිත කර තිබේ. මණ්ඩලයේ ලියාපදිංචි කාර්යාලය කොළඹ 02, නවම් මාවතේ අංක 42 දරන ස්ථානයේ පිහිටා ඇත.

### 1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම් ස්වභාවය

ශ්‍රී ලංකාවේ අපනයන සංවර්ධනය හා ප්‍රවර්ධනය කිරීමට සහ ඊට සම්බන්ධ හා ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීමේ කාර්යෙහි  අපනයන සංවර්ධන මණ්ඩලය මූලික වශයෙන් නිරත වේ .

### 1.3 නිකුත් කිරීම සඳහා බලය පවරන ලද දිනය

2024 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025 පෙබරවාරි මස 27 වැනි දින අනුමත කර තිබේ.

### 1.4 අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් මණ්ඩලය විසින් නිකුත් කළ මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතින් (IFRS) නියෝජනය වන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLFRS සහ LKASs) වලට අනුකූලව  2024 දෙසැම්බර් 31 වන දිනට මණ්ඩලයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා සටහන් සමඟ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන්වල සාරාංශයක් (“මූල්‍ය ප්‍රකාශ”) පිළියෙල කර ඇත.

### 1.5 මූල්‍ය ප්‍රකාශ සඳහා වගකීම

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ කළමනාකාරිත්වය මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වගකීම දරනු ලැබේ.

### 1.6 මිනුම්කරණයේ පදනම

අදාළ සටහන් යටතේ සාධාරණ අගයට නියමිත අනාවරණය කිරීම් සිදුකර ඇත්නම් හැර, මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර තිබේ. වත්කම් හා බැරකම් ඒවායේ ස්වභාවය අනුව සහ ඒවයේ සාපේක්ෂ ද්‍රවශීලතාවය පිළිබිඹු කිරීම අනුව පෙළගස්සවා කාණ්ඩ ගතකර තිබේ.

## 1.7 අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී, කළමනාකාරිත්වය විසින් මණ්ඩලයට සිය කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑමේ හැකියාව තක්සේරු කර ඇත. අපේක්ෂිත අනාගතය සඳහා මෙහෙයුම් කටයුතුවල පවත්වාගෙන යෑම සඳහා මණ්ඩලය සතුව ප්‍රමාණවත් සම්පත් ඇති බවට කළමනාකාරිත්වයට සාධාරණ අපේක්ෂාවක් පවතී. අනාගතය සම්බන්ධයෙන් පවතින සියලු තොරතුරු අවධානයට යොමුකළ විට, ඈවර කිරීමට හෝ මෙහෙයුම් කටයුතු නැවත්වීම සඳහා අවශ්‍යතාවයක් මණ්ඩලයට කලින් දැනගත නොහැකි ය. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී මණ්ඩලය විසින් අඛණ්ඩ පැවැත්ම සංකල්පය දිගටම යොදාගනු ලැබේ.

## 1.8 වැදගත් ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පනයන්

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් එහි වාර්තාකරණ දිනයට වාර්තාවන ආදායම්, වියදම්, වත්කම් හා වගකීම්වල වාර්තාවන අගයන් හා අවිනිශ්චිත වගකීම් මත බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන ගැනීම අවශ්‍ය කෙරේ. එසේ වුව ද, මෙම උපකල්පන හා ඇස්තමේන්තු පිළිබඳ අවිනිශ්චිතතාවය හේතුවෙන් අනාගතයේ දී බලපාන වත්කම් හෝ වගකීම්වල ධාරණ අගයන් වෙත ප්‍රමාණාත්මක ගැලපුමක් සිදුකිරීමට අවශ්‍ය ප්‍රතිඵල ඇතිකරවයි. මෙම සාධකවලට විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන ඇතුළත් වේ.

## 1.9 ඇස්තමේන්තු සහ උපකල්පන

ඉදිරි මූල්‍ය වර්ෂය ඇතුළත වත්කම් හා වගකීම්වල ධාරණ අගයට ප්‍රමාණාත්මක ගැලපුමක් හටගන්නා සුවිශේෂී අවදානමක් සහිත අනාගතයට අදාළ ප්‍රධාන උපකල්පන හා අවිනිශ්චිතතාවය ඇස්තමේන්තු කිරීමේ අනෙකුත් ප්‍රධාන මූලාශ්‍ර පහත විස්තර කෙරේ.

### (අ) *<u>සාධාරණ අගය මත මූල්‍ය උපකරණ</u>*

ශේෂ පත්‍රයේ වාර්තා වන මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වගකීම්වල සාධාරණ අගය, සක්‍රිය වෙළඳපොලවල් වලින් ව්‍යුත්පන්න කළ නොහැකි විටක දී, තක්සේරු කිරීමේ විවිධ ශිල්පීය න්‍යාය භාවිතා එය නිර්ණය කරන අතර මීට වට්ටම් කරන ලද මුදල් ප්‍රවාහ ආකෘතිය සහ/හෝ ගණිතමය තක්සේරු ක්‍රම ආදිය ඇතුළත් ය. හැකි අවස්ථාවලදී නිරීක්ෂණය කළහැකි වෙළඳපොළ දත්තවලින් මෙම ආකෘති සඳහා යෙදවුම් ව්‍යුත්පන්න කරගන්නා නමුදු, නිරීක්ෂණය කළහැකි වෙළඳපොළ දත්ත නොමැති විටක දී, සාධාරණ අගය තහවුරු කිරිම සඳහා විනිශ්චයන් අවශ්‍ය කෙරේ.

මෙම සාධක සම්බන්ධයෙන් සිදුකරන උපකල්පනවල වෙනස්වීම් මූල්‍ය උපකරණවල වාර්තාකළ සාධාරණ අගය මත බලපෑ හැකි ය.

**(ආ) <u>නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් තක්සේරු කිරීම</u>**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත LKAS 19 යටතේ දී උපචිත වගකීම් හා විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම්වල ප්‍රවර්තන සේවා වියදම නිර්ණය කිරීම සඳහා ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය යොදා ගැනීම අවශ්‍ය කෙරේ. මෙම ක්‍රමයේ අරමුණ වනුයේ, විවිධ ආයුගණක උපකල්පන ද සැලකිල්ලට ගෙන, සැලසුම යටතේ වන සෑම සේවකයෙකුගේම ප්‍රතිලාභ ඔවුන් විසින් උපචිත කරගනු ලබන විට දී වියදම් දැරීම යි. මෙහි දී යොදාගන්නා ප්‍රවේශය වනුයේ විශ්‍රාම යෑම, සේවයෙන් ඉල්ලා අස්වීම, මරණය සහ පූර්ණ දුබලතාවයක් හේතුවෙන් සෑම තනි සාමාජිකයෙකු වෙත ගෙවිය යුතු උපචිත අගය ප්‍රතිලාභය ඇස්තමේන්තු කිරීම යි. සෑම සාමාජිකයෙකු සඳහාම වූ ඇස්තමේන්තුගත උපචිත ප්‍රතිලාභ ඉන් අනතුරුව තක්සේරුකරණ දිනයට නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල ආයුගණක වර්තමාන අගය ගණනය සඳහා එකතු කරනු ලැබේ. වෙනත් වචනවලින් කියහොත්, නිශ්චිත ප්‍රතිලාභ බැඳීමක වර්තමාන අගය යනු සේවකයෙකුගේ වර්තමාන හා පූර්ව කාල පරිච්ඡේද සේවා කාලය හේතුවෙන් ප්‍රතිඵල වන බැඳීමක් පියවීම සඳහා අවශ්‍ය කරන අපේක්ෂිත අනාගත ගෙවීම්වල ආයුගණක වර්තමාන අගය යි.

2024.12.31 දිනැතිව සිදුකළ ආයුගණක තක්සේරුව මත පදනම්ව නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම සැලසුම්වල පිරිවැය නිර්ණය කරනු ලැබී ය. නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් සඳහා ශේෂ පත්‍ර දිනට ධාරණ අගය රු.25,251,680 කි.

**(ඇ) <u>සාධාරණ අගය</u>**

සාධාරණ අගය යනු දන්නා, කැමැත්තක් දක්වන පාර්ශව අතර එකී පාර්ශව සඳහා එසේ කිරීම සඳහා කිසිදු බලකිරීමක් සිදුනොවූ ආසන්න නුදුරු කාලයක ගනුදෙනුවක දී එකඟවන ලද ප්‍රතිෂ්ඨාවක අගය යි. යම් මූල්‍ය උපකරණයක් මුලින් හඳුනාගැනීමේ දී, එහි සාධාරණ අගය යනු ගෙවනු ලබන හෝ ලැබෙන ප්‍රතිෂ්ඨාවේ වටිනාකම යි. මුල් අවස්ථාවේ හඳුනාගැනීමෙන් අනතුරුව, සක්‍රිය වෙළඳපොලකදී මූල්‍ය වත්කමක සාධාරණ අගය වශයෙන් සාමාන්‍යයෙන් දැක්වෙනුයේ ලංසු අගය වන අතර, සක්‍රිය වෙළඳපොලකදී මූල්‍ය වගකීමක් සඳහා සාධාරණ අගය වශයෙන් සාමාන්‍යයෙන් දැක්වෙනුයේ ඒ සම්බන්ධයෙන් ඉල්ලා සිටින මිල යි. කෙටි කාල සීමාවක් සහිත මුදල් හා සමාන දෑ සහ කෙටි කාලීන ආයෝජන වැනි මූල්‍ය උපකරණ සඳහා, මෙවැනි උපකරණවල ධාරණ අගය ආසන්න වශයෙන් සාධාරණ අගය වේ.

## 2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 2.1 වත්කම් හා ඒවා තක්සේරු කිරිමේ පදනම

ජංගම වත්කම් වශයෙන් ශේෂ පත්‍රයේ වර්ගීකරණය වන වත්කම් වනුයේ මුදල් හා බැංකු ශේෂ සහ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයක දී හෝ ශේෂ පත්‍ර දිනයේ සිට වසරක් ඇතුළත යන දෙකින් කෙටි කාල සීමාව තුළ මුදල් බවට පත්කළ හැකි දෑ ය.

### 2.2 මූල්‍ය උපකරණ

#### 2.2.1 මූල්‍ය වත්කම් (ව්‍යුත්පන්න නොවන)

පසුව ක්‍රමක්ෂය පිරිවැයට, වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගය හෝ ලාභ හෝ අලාභ අනුව සාධාරණ අගයට මිනුම්කරණය වන මූල්‍ය වත්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත SLFRS 09 අනුව පහත කාණ්ඩවලට වර්ග කෙරේ.

(අ) මූල්‍ය වත්කම් කළමනාකරණය සඳහා වන අස්තිත්වයේ ව්‍යාපාරික ආකෘතිය සහ

(ආ) මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණ අනුව

වර්ගීකරණය කිරීම මුල් හඳුනාගැනීමේ අවස්ථාවේ දී කළමනාකාරිත්වය විසින් තීරණය කරන අතර ආයෝජන අත්පත් කරගනු ලැබුවේ කුමන කාර්යයකට ද යන්න මත එය රඳා පවතී.

#### 2.2.2 වර්ගීකරණය, හඳුනාගැනීම සහ මිණුම්කරණය

(i) පහත කොන්දේසි දෙකම සම්පූර්ණ කෙරේ නම්, මූල්‍ය වත්කමක් ***ක්‍රමක්ෂය පිරිවැයට*** මිනුම්කරණය කළ හැකි ය:

(අ) ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ රැස් කිරීම සඳහා මූල්‍ය වත්කම් පවත්වාගැනීම අරමුණුගතව ව්‍යාපාරික ආකෘතිය තුළ මූල්‍ය වත්කම් දරා සිටීම, සහ

(ආ) මූල්‍ය වත්කම මගින් විශේෂ කොට දක්වන ලද දිනයන්හි දී, හුදෙක් ප්‍රාග්ධනය සහ ප්‍රාග්ධන හිඟ මුදල මත පොලී ගෙවීම ආකාරයේ මුදල් ප්‍රවාහයන් පැන නැගීමට හේතුවන ගිවිසුම්ගත කොන්දේසි සහිත වන විට.

(ii) පහත කොන්දේසි දෙකම සම්පූර්ණ කෙරේ නම්, මූල්‍ය *වත්කමක් අනෙකුත්* ***විස්තීරණ ආදායම් හරහා සාධාරණ අගයට*** මිනුම්කරණය කළ හැකි ය:

(අ) මූල්‍ය වත්කම් රඳවාගැනීම අරමුණු වූ ව්‍යාපාරික ආකෘතියක් තුළ දී ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ රැස්කිරීම සහ මූල්‍ය වත්කම් අලෙවිය යන දෙකම ඔස්සේ සිය ව්‍යාපාරික අරමුණු ඉටු කර ගැනීම, සහ

(ආ) හුදෙක් ප්‍රාග්ධනය වෙනුවෙන් හා හිඟ ප්‍රාග්ධන මුදල මත පොලී ගෙවීම් නියෝජනය කරන ආකාරයේ නිශ්චිතව දක්වන දිනවලදී මුදල් ප්‍රවාහ ඉහළ යෑමට හේතුවන මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත කොන්දේසි සහිත වීම

(iii) ක්‍රමක්ෂය පිරිවැයට හෝ අනෙකුත් විස්තීරණ ආදායම් හරහා සාධාරණ අගයට දක්වා නොමැති මූල්‍ය වත්කමක් *ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයට* දැක්විය යුතු ය.

**2.2.3 සාධාරණ අගය නිර්ණය කිරීම**

ණය ගුණාත්මකතාවය, ද්‍රවශීලතාවය හා පිරිවැය සැලකිල්ලට ගෙන ගිවිසුම්ගතව එකඟ වූ මුදල් ප්‍රවාහ පදනම මත වර්තමාන අගය ආකෘතිය භාවිතා කරමින් ණය හා අත්තිකාරම් මෙන්ම වගකීම්වල සාධාරණ අගය නිර්ණය කෙරේ.

ධාරණ අගය අඩු කළ වෙළඳ ලැබිය යුතු හා ගෙවිය යුතු දෑවල ක්‍රමක්ෂය වෙන්කිරීම් ඒවායේ ආසන්නතම සාධාරණ අගයට උපකල්පනය කෙරේ.

**2.2.4 ප්‍රතිවර්ගීකරණය**

වත්කම් කළමනාකරණය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ව්‍යාපාරික ආකෘතිය වෙනස් කරන අවස්ථාවේ සහ එම අවස්ථාවේ දී පමණක් සියලු බලපෑමට ලක්වන මූල්‍ය වත්කම්, යථෝක්ත මූල්‍ය වත්කම් කාණ්ඩවලට අනුව නැවත වර්ගීකරණය කිරීම අවශ්‍ය කෙරේ.

**2.2.5 හානිකරණය**

(අ) ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම්වල ධාරණ අගය

සෑම වාර්තාකරණ කාල පරිච්ඡේදයක් අවසානයේම මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක් හානිකරණය වී ඇත්දැයි සම්බන්ධයෙන් විෂය මූලික සාක්ෂි තිබේද යන්න අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තක්සේරු කරනු ලැබේ. මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක් හානිකරණය වීම හෝ හානිකරණ පාඩුව වනුයේ වත්කමක මූලික හඳුනාගැනීමෙන් අනතුරුව සිදුවීමක් හෝ සිදුවීම් වැඩි ගණනක් ('හානි සිදුවීමක්') සිදු වූ බවට හා එකී හානි සිදුවීම (සිදුවීම්) ඔස්සේ මූල්‍ය වත්කමේ හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයේ ඇස්තමේන්තුගත ඉදිරි මුදල් ප්‍රවාහවලට බලපෑමක් වන බවට විශ්වසනීය අයුරින් ඇස්තමේන්තු කළ හැකි විෂය මූලික සාක්ෂි තිබේ නම් පමණි. මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක් හානිකරණය වූ බවට සැලකෙන විෂය මූලික සාක්ෂි යටතට පහත සිද්ධි සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයට ගැනෙන නිරීක්ෂණය කළ හැකි දත්ත ඇතුළත් වේ:

- නිකුත් කරන්නා හෝ ණයකරු සම්බන්ධිත සුවිශේෂී මූල්‍ය අසීරුතාවයක්;
- ගෙවීම් පැහැර හැරීම හෝ කල්ඉක්මවා තිබීම වැනි කොන්ත්‍රාත් ගිවිසුම් කඩකිරීම්;
- නිකුත් කරන්නා හෝ ණයකරු බංකලොත්බවට හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයකට ඇතුළත් විය හැකි බවට වන සම්භාවිතාවය;
- මූල්‍ය අසීරුතා හේතුවෙන් සලකනු ලබන මූල්‍ය වත්කම සඳහා පවතින සක්‍රිය වෙළඳපොළ ඉවත්වීම; හෝ
- මූල්‍ය වත්කම් කාණ්ඩයක මුල් හඳුනාගැනීමේ සිට ඇස්තමේන්තුගත ඉදිරි මුදල් ප්‍රවාහවල මිනුම්කරණය කළ හැකි අඩුවීමක් දැක්වෙන නිරීක්ෂණය කළ හැකි දත්ත.

වෙන් වෙන් වශයෙන් සුවිශේෂී වන මූල්‍ය වත්කම් සඳහා හානිකරණ වෙන් වෙන් වශයෙන් පවතීද යන්න පිළිබඳ විෂය මූලික සාක්ෂි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පළමුව තක්සේරු කරනු ලැබේ. වෙන් වෙන් වශයෙන් තක්සේරු කළ මූල්‍ය වත්කමක් සඳහා සැලකිය යුතු හෝ නොවන හානිකරණ පවතී ද යන්න පිළිබඳ විෂය මූලික සාක්ෂි නොමැති බවට මණ්ඩලය විසින් තීරණය කළහොත්, එකී වත්කම සමාන ණය අවදානම් ලක්ෂණ සහිත මූල්‍ය වත්කම් කාණ්ඩයක් තුළ එය අන්තර්ගත කිරීම සහ සාමූහික හානිකරණ සඳහා තක්සේරු කිරීම සිදුකරනු ලැබේ. හානිකරණය සඳහා වෙන් වෙන් වශයෙන් තක්සේරු කළ වත්කම් සඳහා හානිකරණ අඛණ්ඩව හඳුනාගත හැකි නම් එකී වත්කම් සාමූහික හානිකරණ සඳහා තක්සේරු කිරීම තුළ අන්තර්ගත නොකෙරේ.

හානිකරණ අලාභ ණය හෝ ලැබිය යුතු දෑ ක්‍රමක්ෂය පිරිවැයෙහි ධාරණ අගයට වැය දරා ඇති බවට විෂය මූලික සාක්ෂි තිබේ නම්, මූල්‍ය වත්කමෙහි මුල් බලාත්මක පොලී අනුපාතිකයට වට්ටම් කළ වත්කමෙහි ධාරණ අගය සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන අගය (දරා ඇති අනාගත හානි ණය හැර) අතර වෙනස වශයෙන් හානියේ වටිනාකම මිනුම්කරණය කෙරේ. දීමනා ගිණුමක් භාවිතයෙන් වත්කමක ධාරණ අගය අඩු කෙරෙන අතර, හානි වන අගය ආදායම් ප්‍රකාශයේ හඳුනාගැනේ. සාමූහික හානිකරණ ඇගයීමේ කාර්යය සඳහා මූල්‍ය වත්කම් සමාන ණය අවදානම් සහිත යන පදනමින් කාණ්ඩ කෙරේ.

ඉන් අනතුරුව කාල පරිච්ඡේදයක දී, හානිකරණ අලාභ අඩුවී එකී අඩුවීම විෂයනිශ්‍රිත වශයෙන් හානිකරණය හඳුනාගත් දිනය පසු සිද්ධියකට සම්බන්ධ කළහැකි නම් (වැඩිදියුණු වූ ණය ශ්‍රේණි කිරීම වැනි), පූර්ව වශයෙන් හඳුනාගත් හානිකරණ අලාභය, දීමනා ගිණුම ගැලපුම් කිරීමෙන් ප්‍රතිවර්තනය කෙරේ. එසේ ප්‍රතිවර්තනය කළ අගය ආදායම් ප්‍රකාශයේ හඳුනාගනී.

(ආ) අනෙකුත් මූල්‍ය නොවන වත්කම්වල හානිකරණය

අනිශ්චිත ජීව කාලයක් සහිත වත්කම් ක්‍රමක්ෂය සඳහා බඳුන් නොවන අතර එකී වත්කම් වාර්ෂිකව හානිකරණය සඳහා පරීක්ෂා කෙරේ. ධාරණ අගය ආපසු ලබාගත නොහැකිබවට හැඟෙවෙන සිද්ධි හෝ වාතාවරණයන්ගේ වෙනස්වීමක් සිදුවන ඕනෑම අවස්ථාවක දී ක්‍රමක්ෂය සඳහා බඳුන්වෙන වත්කම් හානිකරණය සඳහා සමාලෝචනය කෙරේ. වත්කමක ධාරණ අගය එහි ආපසු අයකරගත හැකි අගය ඉක්මවා යන අගයේ වටිනාකමට හානිකරණ පාඩුව හඳුනාගැනේ. ආපසු අයකරගත හැකි අගය යනු වත්කමක සාධාරණ අගයෙන් විකිණීම සහ භාවිතා අගය සඳහා පිරිවැය අඩුකළ පසු වැඩි අගය යි. හානිකරණය තක්සේරු කිරීම සඳහා, වත්කම් ඒවායේ වෙන් වෙන් වශයෙන් හඳුනාගත හැකි මුදල් ප්‍රවාහ ඇති මට්ටම දක්වා අවම මට්ටමට කාණ්ඩ කෙරේ (මුදල් උත්පාදන ඒකක).

**2.2.6 හඳුනාගැනීම අත්හැරීම**

මූල්‍ය වත්කමක් (හෝ අදාළ වන පරිද්දෙන් මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් කාණ්ඩයක කොටසක්) පහත සඳහන් අවස්ථාවන්හි දී හඳුනාගැනීම අත්හැරේ:

- වත්කම් මගින් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය ඉකුත් වී තිබීම.
- වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය මණ්ඩලය විසින් පවරා ඇති විටෙක හෝ සමනය කරගැනීමේ ආකාරයක් වශයෙන් ලැබෙන මුදල් ප්‍රවාහ මුළුමනින්ම තෙවන පාර්ශවයකට ගෙවීමට බැඳීමක් ඇති කරගෙන අවස්ථාවක දී; හෝ නැතහොත්

(අ) වත්කම්වල සියලුම අවදානම් හෝ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙසින් මණ්ඩලය විසින් පවරා ඇති විටක, හෝ
(ආ) වත්කම්වලට අදාළ සියලුම අවදානම් හෝ ප්‍රතිලාභ සැලකිය යුතු මට්ටමකට මණ්ඩලය විසින් පැවරීම හෝ රඳවාගැනීම සිදු නොකර, නමුත් වත්කම්හි පාලනය පවරා ඇති විටක.

මණ්ඩලය විසින් වත්කමක් මගින් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය වෙනත් පාර්ශවයකට පවරා ඇතිවිට හෝ මුදල් ප්‍රවාහ මුළුමනින්ම තෙවන පාර්ශවයකට ගෙවීම සඳහා බැඳීමක් ඇතිකරගත් විට, සහ වත්කම්වලට අදාළ සියලුම අවදානම් හෝ ප්‍රතිලාභ සැලකිය යුතු මට්ටමකට මණ්ඩලය විසින් පැවරීම හෝ රඳවාගැනීම සිදු නොකර, නමුත් වත්කම්හි පාලනය පවරා ඇති විටක, වත්කමෙහි කටයුතු සම්බන්ධයෙන් මණ්ඩලයේ අඛණ්ඩ සහභාගිත්වයේ ප්‍රමාණය අනුව අදාළ වත්කම හඳුනාගනු ලැබේ. එවැනි අවස්ථාවක දී, මණ්ඩලය විසින් ආශ්‍රිත වගකීමක් ද හඳුනාගනු ලබයි. මණ්ඩලය විසින් රඳවා ගනු ලැබූ අයිතීන් හා වගකීම් පිළිබිඹු වන ආකාරයක පදනමකින් පවරනු ලැබූ වත්කම් හා ආශ්‍රිත වගකීම් මනිනු ලැබේ. පවරනු ලැබූ වත්කමක් සඳහා ඇපයක ආකාරයෙන් පවත්නා අඛණ්ඩ සහභාගිත්වයක් වත්කමෙහි මුල් ධාරණ අගයේ අවමය හා මණ්ඩලය විසින් ආපසු ගෙවීම අවශ්‍ය විය හැකි ප්‍රතිෂ්ඨාවේ උපරිම අගය අනුව මනිනු ලැබේ.

**2.2.7** මූල්‍ය වත්කම් හා වගකීම් හිලව් කර ශුද්ධ අගය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි වාර්තා කෙරනුයේ, එසේ එම අගයන් හිලව් කිරීම සඳහා මණ්ඩලයට නීතිමය අයිතියක් පවතී නම් හා ශුද්ධ පදනමක් මත පියවීම හෝ එක්වර වත්කම් උපලබ්ධිවීම හා වගකීම් පියවීම සඳහා අපේක්ෂා කරන්නේ නම් පමණි.

## 2.3 දේපළ, පිරියත හා උපකරණ

**2.3.1 හඳුනාගැනීම හා මිනුම්කරණය**

දේපළ, පිරියත හා උපකරණ අයිතම සමුච්චිත ක්ෂයකිරීම් සහ හානිකරණයන් අඩුකර පිරිවැය හෝ තක්සේරු අගයට ගිණුම්ගත කෙරේ. මෙම පිරිවැයට වත්කම අත්පත් කරගැනීම සඳහා ඍජුවම අදාළ වන වියදම් ද ඇතුළත් වේ. ස්වයං- නිර්මිත වත්කමක පිරිවැයට එය සෑදීම සඳහා යොදාගත්ද්‍රව්‍යවල පිරිවැය හා ඍජු ශ්‍රමය, එහි අපේක්ෂිත භාවිතය සඳහා වන ක්‍රියාකාරි තත්ත්වයට රැගෙන ඒම සඳහා ඍජුවම අදාළ වන වෙනත් පිරිවැය ඇතුළත් වේ. දේපළ, පිරියත හා උපකරණවල ප්‍රතිසංස්කරණය හෝ වත්කම්වලින් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ සඳහා අලුත්වැඩියා හෝ නඩත්තු කිරීම සඳහා වන වැය දැරීම් වියදම් වශයෙන් ඒවා වැය කරන අවස්ථාවේ දී හඳුනාගැනේ.

### 2.3.2 පසුකාලීන පිරිවැය

ප්‍රධාන පරීක්ෂා කිරීම් හා කොටස් කර පිරික්සුම් ද ඇතුළුව දේපළ, පිරියත හෝ උපකරණ අයිතමයක සංරචකයක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දරන වියදම් වෙන්ව ගිණුම්ගත කරන අතර, කල්බදු කාල සීමාව තුළ දී ප්‍රාග්ධනීකරණය කර කපා හැරේ. අනෙකුත් පසුකාලීන පිරිවැය ප්‍රාග්ධනීකරණය කරනුයේ එම කොටස තුළ අන්තර්ගත වී ඇති අනාගත ආර්ථික වාසි මණ්ඩලය වෙත ගලා ඒමේ සම්භාවිතාවයක් ඇතිවිට හා එය විශ්වාසනීය අයුරින් මිනුම්කරණය කළහැකි නම් පමණි. දේපළ, පිරියත හෝ උපකරණවල දෛනික සේවා කිරීම් වැය දැරූ වියදමක් ලෙස ආදායම් ප්‍රකාශයේ හඳුනාගැනේ.

### 2.3.3 ක්ෂය කිරීම්

දේපළ, පිරියත හා උපකරණවල වැය/ තක්සේරුව මත සරල රේඛීය ක්‍රමවේදය ඔස්සේ ක්ෂයකිරීම් සඳහා වෙන්කිරීම් ගණනය කෙරේ. ඉඩම් හැර සියලුම දේපළ, පිරියත හා උපකරණ ඒවායේ ඵලදායි ජීව කාලය මුළුල්ලේ පහත දැක්වෙන ප්‍රතිශතවලට අදාළ වන අගයවල් වලින් කපා හැරීම සඳහා වාර්ෂිකව ක්ෂය කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| අවුරුදු 10ට වඩා නොපැරණි මෝටර් වාහන | 10% | අවුරුදු 10ට වඩා පැරණි මෝටර් වාහන | 20% |
| පරිගණක | 20% | | |
| පරිගණක උපකරණ | 25% | ටෙලිවිෂන් උපකරණ | 10% |
| දුරකතන ස්ථාපනය කිරීම් | 20% | ගෘහභාණ්ඩ හා සවි කිරීම් | 10% |
| නේවාසික දුරකතන | 10% | කාර්යාලීය උපකරණ | 10% |
| PABX පද්ධතිය | 10% | KIOSK පද්ධතිය | 20% |
| අනෙකුත් උපකරණ | 33 1/3% | | |

මිලදී ගනු ලැබූ දිනයේ සිට ආරම්භ වන පරිද්දෙන් සරල රේඛීය ක්‍රමවේදය ඔස්සේ ක්ෂය කිරීම් සිදුකරනු ලැබේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - LKAS 16 හි දක්වා ඇති පරිදි සමාලෝචිත වර්ෂයේ දී ලබාගත හැකි ප්‍රශස්තතම තොරතුරු මත පාදකව දේපළ, පිරියත හා උපකරණවල ආර්ථික ජීව කාලය යළි තක්සේරු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ඇතැම් දේපළ, පිරියත හා උපකරණ සඳහා ක්ෂය කිරීමේ අනුපාතය වෙනස්විය. වත්කම්වල ඵලදායි ජීවකාලය වෙනස්වීමේ මගින් ඇති වූ ප්‍රතිඵලය 2012 වර්ෂයේ සිට ඉදිරියට වන පරිද්දෙන් මූල්‍ය ප්‍රකාශවල ගැලපුම් කරන ලදී.

**2.3.4 හඳුනාගැනීම අත්හැරීම**

දේපල, පිරියත සහ උපකරණ අයිතම බැහැර කිරීම හෝ එහි භාවිතය තුළින් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරක අවස්ථාවේ දී ඒවා හඳුනා ගැනීම අත්හරිනු ලැබේ. දේපළ, පිරියත සහ උපකරණයක් බැහැර කිරීමේ දී ඇතිවන ලාභය හෝ අලාභය තීරණය කරනු ලබන්නේ එහි විකුණුම් ආදායම හා වත්කමේ ධාරණ අගය අතර වෙනස වශයෙන් වන අතර, එය ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ.

**2.3.5 ස්පෘශ්‍ය වත්කම් හානිකරණය**

සෑම වාර්තාකරණ කාල සීමාවක් අවසානයේදී ම, එහි ස්පෘශ්‍ය වත්කම්වලට හානිකරණ පාඩුවක් සිදුවී ඇති බවට ඇඟවීමක් තිබේ ද යන්න නිර්ණය කරගැනීම සඳහා මණ්ඩලය විසින් එහි ස්පෘශ්‍ය වත්කම්වල ධාරණ අගය සමාලෝචනය කරනු ලැබේ. එවැනි ඇඟවීමක් පවතී නම්, හානිකරණ පාඩුවේ ප්‍රමාණය (එසේ පවතී නම්) නිර්ණය කිරීම සඳහා වත්කමේ ආපසු අය කරගත හැකි වටිනාකම ඇස්තමේන්තු කෙරේ. තනි වත්කමක ආපසු කරගත හැකි වටිනාකම ඇස්තමේන්තු කිරීම සිදුකළ නොහැකි නම්, එකී වත්කම අයත්වන මුදල්-උත්පාදන ඒකකය සඳහා කරගත හැකි වටිනාකම නිර්ණය කෙරේ.

සාධාරණීය හා සංගත පදනමකින් වෙන්කිරීම් හඳුනාගත හැකි නම්, වත්කම් තනි මුදල්-උත්පාදන ඒකකවලට ද වෙන්කළ හැකි ය. එසේ නැත්නම් එකී වත්කම් කුඩාතම මුදල්-උත්පාදන ඒකක සමූහයකට වෙන්කරන අතර එහිදී සාධාරණීය හා සංගත පදනමකින් වෙන්කිරීම් හඳුනාගත හැකි ය.

ආපසු අයකර ගත හැකි අගය යනු විකුණුම් පිරිවැය හෝ භාවිත අගය අඩුකළ සාධාරණ අගය යන දෙකෙන් වඩාත් වැඩි අගය යි. භාවිත අගය තක්සේරු කිරීමේ දී මුදලේ කාල අගය හා වත්කමට සුවිශේෂී වූ අවදානම්වල ප්‍රවර්තන වෙළඳපොළ තක්සේරු පිළිබිඹු කරන බදුවලට පෙර වට්ටම් අනුපාතියක් භාවිතා කරමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ ඒවායේ වර්තමාන අගයට වට්ටම් කරනු ලැබේ.

වත්කමක (හෝ මුදල් ජනන ඒකකයක) ආපසු අයකර ගත හැකි වටිනාකම එහි ධාරණ අගයට වඩා අඩු බවට ඇස්තමේන්තු ගත කරයි නම්, වත්කමේ (හෝ මුදල් ජනන ඒකකයේ) ධාරණ අගය එහි ආපසු අයකර ගත හැකි වටිනාකමට අඩු කරනු ලැබේ. හානිකරණ පාඩුව ප්‍රත්‍යාගණනිත අඩු වීමක් ලෙස සැලකෙන අවස්ථාවක් වන අදාළ වත්කම ප්‍රත්‍යාගණනිත වටිනාකමට දක්වන්නේ නැතහොත්, හානිකරණ පාඩුව වහාම ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගනු ලැබේ.

**2.3.6 පුනරාවර්තන වියදම් ලෙස වාර්තා කෙරෙන ප්‍රමාණාත්මක නොවන ජංගම නොවන වත්කම්වල පිරිවැය (විවිධ වත්කම්)**

දේපළ, පිරියත හා උපකරණ සම්බන්ධ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS 16) ඔස්සේ "අමතර කොටස් හා සේවා කිරීමේ උපකරණ තොග ලෙස දැක්වෙන අතර භාවිතයට ගන්නා විට ලාභ හෝ අලාභවල දී හඳුනාගනී " ලෙසින් මඟ පෙන්වයි.

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් නඩත්තු පිරිවැය/ තොරතුරු තාක්ෂණයට අදාළ අමතර කොටස් ආදිය ඇතුළුව සියලු කුඩා වටිනාකම්වල වැය අයිතමයන් විවිධ වත්කම්වල පිරිවැය ලෙස එම පිරිවැය දරන අවස්ථාවේ ගිණුම් ගත කිරීම සිදුකරනු මිස, ස්ථිර වත්කම්වල අගය සමඟ සංසන්දනය කිරීමේ දී ප්‍රමාණවත් නොවන හෙයින් ස්ථිර වත්කම්වල පිරිවැය කොටසක් ලෙස ගිණුම්ගත නොකෙරේ.

## 2.4 ආශ්‍රිත සමාගම්වල ආයෝජන - ඩෙවලොප්මන්ට් හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

ආශ්‍රිත සමාගමක ආයෝජනය මුලින් පිරිවැයට හඳුනාගන්නා අතර අත්පත් කරගත් දිනයෙන් පසු ආයෝජිතයාගේ ලාභයෙන් හෝ අලාභයෙන් මණ්ඩලයේ පංගුව හඳුනාගැනීම සඳහා ධාරණ අගය ඉහළ හෝ පහළ දැමීම සිදුවේ (හිමිකම් ක්‍රමය). ධාරණ අගයට සිදුකරන ගැලපුම් (දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමෙන් හෝ විදේශ විනිමය හුවමාරු වෙනස්කම් හේතුවෙන් ඇතිවන වෙනස්වීම්) ආයෝජිතයා වෙත මණ්ඩලයේ සමානුපාතික අයිතිය යටතේ 2013 වර්ෂයේ සිට ඉදිරියට හඳුනාගනු ලබන අතර මෙය පැනනඟිනුයේ ආයෝජිතයාගේ අනෙකුත් විස්තීර්ණ ආදායම්වල වෙනස්වීම් හේතුවෙනි.

## 2.5 අස්පෘශ්‍ය වත්කම්

(අ) වත්කමට අදාළ සේවා විභවයෙන් අපේක්ෂිත ඉදිරි ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා ඒමේ සම්භාවිතාවයක් තිබේ නම්; සහ

(ආ) වත්කමෙහි පිරිවැය හෝ සාධාරණ අගය විශ්වාසනීය අයුරින් මැනිය හැකි නම්

අස්පෘශ්‍ය වත්කමක් හඳුනාගනී.

LKAS 38ට අනුකූලව අස්පෘශ්‍ය වත්කම් හඳුනාගැනීම සඳහා මණ්ඩලය විසින් පිරිවැය ආකෘතිය යොදා ගනී. පරිගණක මෘදුකාංග අස්පෘශ්‍ය වත්කම් යටතේ වර්ගීකරණය කර ඇති අතර එහි ඵලදායි ජීව කාලය මුළුල්ලේ ක්‍රමානුකූල පදනමකින් ක්ෂය ප්‍රමාණ වෙන් කෙරේ. අදාළ වන ක්‍රමක්ෂය අනුපාතිකය 25% කි.

## 2.6 තොග

පිරිවැය හෝ ශුද්ධ ආපසු ලබාගත හැකි අගයෙන් අඩු අගයට සියලුම තොග අගය කෙරේ. පළමුව ලැබී ඇති තොග පළමුව නිකුත් කළ යුතුය (FIFO) මත පදනම්ව පිරිවැය නිර්ණය කෙරේ.

## 2.7 අනෙකුත් වත්කම්

අනෙකුත් ණයකරුවන් හා ලැබිය යුතු දෑ, අත්තිකාරම්, තැන්පතු, පූර්ව ගෙවීම්, ලැබිය යුතු බදු අනෙකුත් වත්කම් යටතට ඇතුළත් වේ.

(අ) <u>අත්තිකාරම්, තැන්පතු, කලින් ගෙවූ වියදම්</u>

එක් මූල්‍ය වර්ෂයකට වඩා වැඩි සංඛ්‍යාවක් සඳහා වාසි හා සබඳතාවයක් සහිත යැයි සැලකෙන වියදම් අත්තිකාරම්, තැන්පතු හා කලින් ගෙවූ වියදම් ලෙස වර්ගීකරණය කෙරේ. කාලයට සමානුරූපී පදනමින් එයට අදාළ වන කාල සීමාව මුළුල්ලේ එවැනි වියදම් කපා හැරේ.

(ආ) අනෙකුත් ණයකරුවෝ
පිරිවැයෙන් හානිකරණ අලාභය අඩුකර අනෙකුත් ණයකරුවන් හඳුනාගනී.

## 2.8 මුදල් හා මුදල් සමාන දෑ

අතැති මුදල් සහ පහසුවෙන් දන්නා මුදල් ප්‍රමාණ බවට පරිවර්තනය කළ හැකි හා වටිනාකමේ වෙනස්වීම් සම්බන්ධයෙන් නොසැලකිය යුතු අවදානමකට යටත්වන කෙටි කාලීන ඉහළ ද්‍රවශීලතා ආයෝජනවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ. කෙටි කාලීන මුදල් බැඳීම් සපුරා ගැනීම සඳහා මේවා පවත්වා ගනී.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වනුයේ අතැති මුදල් හා ගෙවීමට ඇති බැංකු අයිරා හැර බැංකුවල ඇති ශුද්ධ තැන්පතු ප්‍රමාණය වේ. කෙටිකාලීන කල්පිරීම් සහිත ආයෝජන එනම්, අත්පත් කරගත් දිනයේ සිට මාස තුන හෝ ඊට අඩු ආයෝජන ද මුදල් සමාන දෑ වශයෙන් සැලකේ. ඒකාබද්ධ ශේෂ පත්‍රයේ දී, බැංකු අයිරා දැක්වෙනුයේ ණය ගැනුම් ඇතුළත ජංගම වගකීම් යටතේ ය.

## 2.9 මූල්‍ය වගකීම්

### 2.9.1 මූල්‍ය වගකීම් වර්ගීකරණය

පහත සඳහන් මූල්‍ය වගකීම් හැර අනෙකුත් සියලුම මූල්‍ය වගකීම් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් පසු අවස්ථාවේ දී ක්‍රමක්ෂය පිරිවැයට මිනුම්කළ වශයෙන් හඳුනාගැනේ:

(අ) වගකීම් වන ව්‍යුත්පන්නයන් ද ඇතුළුව ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මිනුම්කරණය කළ මූල්‍ය වගකීම් පසු අවස්ථාවේ දී සාධාරණ අගයට මිනුම්කරණය කළ යුතු ය.
(ආ) මූල්‍ය වත්කමක් පවරනු ලබන අවස්ථාවේ දි හඳුනාගැනීම බැහැර කිරීම සඳහා සුදුසුකම් නොලබනවිට හෝ අඛණ්ඩ සහභාගී ප්‍රවේශය අදාළ වීමෙන් හට ගන්නා මූල්‍ය වගකීම්.
(ඇ) මූල්‍ය ඇපකරු කොන්ත්‍රාත්.
(ඈ) වෙළඳ පොළ පොලී අනුපාතිකයට වඩා අඩු පොලී අනුපාතිකයක් යටතේ ණයක් සැපයීම සඳහා වන බැඳීම්.

ඒ අනුව, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත SLFRS 09 විෂය පථය තුළ වන මූල්‍ය බැරකම් අදාළ වන පරිද්දෙන් ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මිනුම්කරණය කළ මූල්‍ය වගකීම් හෝ ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වගකීම් ලෙස වර්ගීකරණය කෙරේ. මුල් හඳුනාගැනීමේ අවස්ථාවේ දී මණ්ඩලය විසින් එහි මූල්‍ය වගකීම්වල වර්ගීකරණය නිර්ණය කරනු ලැබේ.

මණ්ඩලයේ මූල්‍ය වගකිම්වලට වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ ඇතුළත් වේ.

### 2.9.2 අනෙකුත් වගකීම්

අනෙකුත් වගකීම්වලට උපචිත වියදම් ඇතුළත් වේ. මෙම වගකීම් ඒවායේ ඓතිහාසික අගයට සඳහන් කරන අතර එය ඒවායේ සාධාරණ අගය වශයෙන් සැලකේ.

## 2.10 රජයේ ප්‍රදාන

ප්‍රදාන ඒවායේ සාධාරණ අගයට මුලා ප්‍රකාශනවල හඳුනාගනී. යම් ප්‍රදානයක් වියදමකට අදාළ වේ නම්, එහි වියදම මඟ අනුරූපීවීමට අවශ්‍ය කාල සීමවා මුළුල්ලේ ආදායමක් ලෙස හඳුනාගන්නා අතර, මෙය ක්‍රමානුකූල පදනමකින් හානිපූරණය සඳහා අපේක්ෂිත ය.

වත්කම්වලට අදාළ ප්‍රදාන මුලා තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ විලම්බිත වශයෙන් හඳුනාගන්නා අතර වත්කමෙහි ප්‍රයෝජ්‍ය කාලය තුළ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට බැර කෙරේ.

2016 වර්ෂයේ සිට ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත LKAS 20 - රජයේ ප්‍රදාන ගිණුම්ගත කිරීම හා රජයේ සහාය අනාවරණය කිරීම ප්‍රකාරව, රජයේ අරමුදල් භාවිතාකරමින් මණ්ඩලයේ සංවර්ධන අයවැය යටතේ මිලදී ගත් ස්ථාවර වත්කම්වල පිරිවැය, රජයේ ප්‍රදාන ගිණුමට මාරු කරන අතර ඒවයේ ඵලදායි ජීවකාලය තුළ ක්‍රමක්ෂය කරනු ලැබේ (ක්ෂය අනුපාතිකයට සමානව).

මණ්ඩලය ස්ථාපනය කරන අවස්ථාවේ පහත ආයතනවලින් මණ්ඩලයට පැවරුනු වත්කම් සහ මණ්ඩලය වෙත ඉන් අනතුරුව මිලදී ගත් වත්කම් රජයේ ප්‍රදානවල වටිනාකමින් පිළිබිඹු වේ.

| | |
|---|---:|
| රජයේ දායකත්වය - මෝටර් වාහන | 38,826,450 |
| රජයේ දායකත්වය - අනෙකුත් | 26,924,743 |
| ප්‍රදාන - අනෙකුත් | 38,836,874 |
| තොරතුරු තාක්ෂණ සන්නිවේදන දායකත්වය | 12,716 |
| අපනයන ප්‍රවර්ධන ලේකම් කාර්යාලය | 202,677 |
| ප්‍රදාන - වෙළඳපොළ ප්‍රවේශ වැඩසටහන | 939,000 |

## 2.11 සේවක ප්‍රතිලාභ

### නිශ්චිත දායකත්ව සැලසුම්

අදාළ ආඥා පනත් හා රෙගුලාසිවලට අනුකූලව සේවකයන් සේවක අර්ථසාධක අරමුදලේ (EPF) සහ සේවක භාරකාර අරමුදලේ (ETF) දායකත්වයන්ට සුදුසුකම් ලබයි. මණ්ඩලය විසින් සේවකයන්ගේ දළ වැටුපෙන් නිශ්චිත දායකත්වයන් සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවක භාරකාර අරමුදල (ETF) වෙත ගෙවනු ලබන අතර ඊට වැඩි වටිනාකමකින් ගෙවීම සඳහා නීතිමය හෝ ගිවිසුම්ගත බැඳීමක් නොමැත.

### නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් යනු නිශ්චිත දායකත්ව සැලසුම් හැරුන විට පශ්චාත් රැකියා සැලසුම් වේ. අපනයන සංවර්ධන මණ්ඩලය විසින් 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත ප්‍රකාරව, පාරිතෝෂික ගෙවීම සඳහා බැඳී සිටී. බැඳීම් හා වියදම් මිනුම්කරණය සඳහා ආයුගණක උපකල්පන අවශ්‍ය කරන හෙයින් නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා ගිණුම්කරණය සංකීර්ණ වන අතර, ආයුගණක ලාභ හෝ පාඩු සඳහා භව්‍යතාවයක් පවතී. තවද, බැඳීම් වට්ටම් ගත පදනමින් මිනුම් කරනු ලබන අතර මීට හේතුව වනුයේ සේවකයා විසින් අදාළ සේවය ලබා දීමෙන් වසර ගණනාවක් ගෙවී යාමෙන් අනතුරුව ඒවා පියවීම සිදුවීම යි.

වෘත්තීය උපදේශක සමාගමක් වන Moore Consulting (Pvt) Ltd විසින් ආයුගණක තක්සේරුකරණය සිදුකරනු ලැබේ. වට්ටම් අනුපාතිකය 10.73% ක්, වැටුප් උද්ධමන අනුපාතිකය 1.68% ක්, මරණ අනුපාතිකය A67/70 Ult tables, ආපසු ගැනීමේ අනුපාතිකය 7.98% ක් වශයෙන් මෙම සමාගම විසින් උපකල්පන සිදුකර තිබේ.

## 2.12 ආදායම් බදු

1979 අංක 18 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 18 වැනි වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ ලාභ සහ ආදායම ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

## 2.13 ආදායම් හඳුනාගැනීම

### අ. රජයේ ප්‍රදාන

රජයේ භාණ්ඩාගාරයෙන් ලැබෙන අරමුදල් මෙමගින් නියෝජනය වේ. පුරෝකතනය කළ මුදල් ප්‍රවාහ අවශ්‍යතා මත පදනම්ව, මහා භාණ්ඩාගාරයෙන් මණ්ඩලය වෙත අවශ්‍ය අරමුදල් සපයනු ලැබේ. එබැවින්, මෙමගින් මණ්ඩලය මගින් ලැබූ ප්‍රදානයකට අදාළ වියදම් නියෝජනය වන අතර මෙය සාධාරණ අගයට හඳුනාගැනේ.

### ආ. අනෙකුත් ආදායම්

අදාළ සේවා ඉටුකළ කාල සීමාව තුළ පැනනගින ඉන්වොයිස් ප්‍රකාරව සේවා හා තොරතුරු ලබාදීමෙන් ලැබෙන ආදායම ලැබූ ප්‍රතිෂ්ඨාවේ හෝ ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගයට මිනුම්කරණය කෙරේ.

### ඇ. පොලී ආදායම

පොලී දරන සියලුම මූල්‍ය වත්කම් සඳහා පොලී ආදායම සඵල පොලී අනුපාතික ක්‍රමවේදය භාවිතා කරමින් වාරිකය නැවත ගෙවනු ලබන අවස්ථාවේ දී ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගනී.

### ඈ. ලාභාංශ ආදායම

ගෙවීම ලැබීමට මණ්ඩලයට ඇති අයිතිය තහවුරු වූ විට ලාභාංශ ආදායම හඳුනාගනු ලැබේ.

## 2.14 වියදම් හඳුනාගැනීම

සියලු වියදම් ලබාදුන් ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගයට මිනුම්කරණය කරන අතර එකී වියදම් අදාළ වන කාල පරිච්ඡේදය තුළ හඳුනාගනී. ක්ෂයවීම් කාලය වෙනස් කිරීමෙන් අපේක්ෂිත ප්‍රයෝජනවත් ජීව කාලයේ වෙනස්වීම් හෝ වත්කම් තුළ ගැබ් වී ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභ පාරිභෝජනය සඳහා අපේක්ෂිත රටාව සැලකිල්ලට ගනු ලබන අතර ගිණුම්කරණ ඇස්තමේන්තුවේ වෙනසක් ලෙස එය සලකනු ලැබේ.

## 2.15 ණය ගැනීම් පිරිවැය

ණය ගැනීම් පිරිවැය යනු අරමුදල් ණයට ගැනීමේ දී මණ්ඩලය විසින් දරන පොළිය සහ අනෙකුත් පිරිවැය යි. ණය ගැනීම් පිරිවැය එකී පිරිවැය දරන කාලසීමාව තුළ පිරිවැයක් වශයෙන් හඳුනාගනී.

## 2.16 විදේශීය මුදල් පරිවර්තනය කිරීම/ ගනුදෙනු

ගනුදෙනු සිදුකරන අවස්ථාවේ දී පැවති විනිමය අනුපාතිකය මත, ක්‍රියාකාරී මුදල් ඒකකය හැර වෙනත් මුදල් ඒකකවලින් සිදුකරන සියලු ගනුදෙනු ශ්‍රී ලංකා රුපියල්වලින් වාර්තාකරනු ලැබේ. සෑම මූල්‍ය තත්ත්ව ප්‍රකාශ දිනයකට විදේශ ව්‍යවහාර මුදලින් පවතින මුදල් වත්කම් හා වගකීම් ශේෂ පත්‍ර දිනයට බලාත්මක විනිමය අනුපාතික යොදා ගනිමින් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරනු ලැබේ. විදේශ ව්‍යවහාර මුදලින් පවතින මූල්‍ය නොවන වත්කම් හා වගකීම් එකී ගනුදෙනු සිදුවූ දිනයේ පවතින විනිමය අනුපාතිකය භාවිතාකරමින් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරනු ලැබේ. මුදල් අයිතම පියවන අවස්ථාවේ දී සහ මුදල් අයිතම නැවත පරිවර්තනය කිරීමේදී හටගන්නා විනිමය අනුපාතික වෙනස්කම් එකී වෙනස්කම් පැනනඟින වර්ෂයේදී ම ආදායම් ප්‍රකාශයේ හඳුනාගනී.

## 2.17 ආශ්‍රිත පාර්ශව ගනුදෙනු

මණ්ඩලයට එහි ආශ්‍රිත සමාගම වන ඩෙවලොප්මන්ට් හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමග ආශ්‍රිත පාර්ශව සබඳතාවයක් ඇත. මණ්ඩලය විසින් සිය භාවිතා කරන ඉඩකඩ සඳහා මාසික කුලියක් ලබාදෙන අතර රජයේ තක්සේරුකරු විසින් සිදුකරන තක්සේරුව අනුව ආශ්‍රිත සමාගම වෙත ශ්‍රවණාගාරය කුලියට ගැනීමේ ගාස්තු ද ගෙවනු ලැබේ.

ඩෙවලොප්මන්ට් හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් හිටපු සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී වන ආචාර්ය කිංග්ස්ලි බර්නාඩ් මහතා 2024.09.19 වන දින දක්වා කටයුතු කළ අතර නව සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී වන මංගල විජේසිංහ මහතා 2024.10.11 වැනි දින සිට එහි අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා අලුතින් පත්කරන ලදී.

මණ්ඩලයේ නීති නිලධාරිනි - ඩී.ටී.විජේරත්න මිය සහ මූල්‍ය අධ්‍යක්ෂ - කේ.ඩී.පෙරේරා මහතා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ඩෙවලොප්මන්ට් හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා නම්කරන ලද අධ්‍යක්ෂවරු ලෙස කටයුතු කරනු ලැබේ.

2024 වර්ෂයේ දී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් හතරක් පැවැත්වුණු අතර එක් රැස්වීම් වාරයක් සඳහා රු.10,000ක් බැගින් සහභාගිත්ව දීමනාවක් ගෙවා තිබුණි.

**ප්‍රධාන කළමනාකාරිත්ව පිරිස සමඟ ගනුදෙනු**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24 (LKAS- 14) හි ආශ්‍රිත පාර්ශව අනාවරණය කිරීම් ප්‍රකාරව, ප්‍රධාන කළමනාකාරිත්ව පිරිස යනු මණ්ඩලයේ සැලසුම්, මෙහෙයැවීම හා ක්‍රියාකාරකම් පාලනය සඳහා අධිකාරි බලය හා වගකීම දරන පිරිස් ය.

අධ්‍යක්ෂ (මුදල්) - කේ.ඩී.පෙරේරා මහතා කළමනාකරණ අධ්‍යක්ෂ වශයෙන් සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ (අපකයන කෘෂිකර්ම සංවර්ධන) - ගයනි විජේතිලක මහත්මිය හතු සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථානයේ (MDTC) අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සිය සේවය අඛණ්ඩව ලබාදෙන ලදී. රු.4,000/- මාසික දීමනාවක් කළමනාකරණ අධ්‍යක්ෂ වෙත ගෙවන ලදී.

රජය විසින් සිය අතුරු අයවැය -2022 යටතේ (අයවැය යෝජනා අංක 32) ඇසුරුම් කර්මාන්තයේ ප්‍රවර්ධනය හා සංවර්ධනය සඳහා අපනයන සංවර්ධන මණ්ඩලයේ ජාතික ඇසුරුම් මධ්‍යස්ථානය (NPC) යළි සක්‍රිය කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන තිබේ. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB), ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI), කාර්මික තාක්ෂණ ආයතනය (ITI), ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය (NERD), ශ්‍රී ලංකා කොයිරුගේටඩ් කාටන් මැනියුෆැක්චරස් සංගමය (LCCMA) හා ශ්‍රී ලංකා ඇසුරුම් ආයතනය (SLIP) යන ආයතනවලින් ජාතික ඇසුරුම් මධ්‍යස්ථානයෙහි අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය වේ.

## 2.18 ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවීම්

අධ්‍යක්ෂවරු විසින් සිද්ධි සමීපව අධීක්ෂණය කර යෝග්‍ය පරිද්දෙන් ශේෂ පත්‍ර දිනයෙන් පසු ප්‍රමාණාත්මක සිද්ධිවලට අදාළව ප්‍රවර්තන මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍යතානුකූලව ගැලපුම් හෝ අනාවරණය කිරීම් සිදුකරනු ලැබේ.

## 2.19 අසම්භව්‍ය බැරකම්

අ) අතීත සිද්ධියක ප්‍රතිඵලයක් වශයෙන් විභව්‍ය අනාගත බැදීමක් හෝ අතීත සිද්ධියක ප්‍රතිඵලයක් වශයෙන් විභව්‍ය වර්තමාන බැදීමක් පැවතිය ද, මෙම ගෙවීම් ද්විත්වයම සිදුකළ හැකි දැයි අවිනිශ්චිත හෝ වටිනාකම සාධාරණ අයුරින් ඇස්තමේන්තු කළ නොහැකි විට දී අසම්භව්‍ය බැරකම් අනාවරණය කෙරේ.

ආ) මණ්ඩලය සමග සිදුකළ විවිධ ගනුදෙනුවලට අදාළව මණ්ඩලය වෙත ලැබිය යුතු මුදල් යළි ලබාගැනීම සඳහා මණ්ඩලය විසින් පාර්ශව 17 කට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත. මෙම ගනුදෙනුවල විස්තර මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්වල **සටහන් අංක 25 යටතේ** සඳහන් කර තිබේ.

## 2.20 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශ සම්බන්ධයෙන් වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 7 ට අනුකූලව මුදල් ප්‍රවාහ පිළියෙල කිරීමේ වක්‍ර ක්‍රමය භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කරනු ලැබේ.

මුදල් නොවන ස්වභාවයේ ගනුදෙනු, පූර්ව හෝ අනාගත මෙහෙයුම් මුදල් ලැබීම් හෝ ගෙවීම් විලම්භනය හෝ උපචිත වීම් හෝ මුදල් ප්‍රවාහ මත ආයෝජන හෝ මූල්‍යයන ආශ්‍රිත ආදායම් හෝ වැය අයිතමවල බලපෑම් මගින් ගැලපුම් කළ ලාභය හෝ අලාභය වක්‍ර ක්‍රමය ඔස්සේ අනාවරණය වේ.

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**
**2024 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ**
**මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**

| | සටහන | ශ්‍රී.ලං.ගි.ප්‍ර 2024.12.31 රු. | ශ්‍රී.ලං.ගි.ප්‍ර 2023.12.31 රු. |
|---|---|---|---|
| **(3)** ආදායම | | | |
| ලැබූ භාණ්ඩාගාර අරමුදල් | | 459,742,154 | 363,754,900 |
| GIZ අරමුදල | | - | 8,122,959 |
| IFC අරමුදල | | 21,215,947 | |
| ITC දායකත්වය | | 4,785,000 | |
| සංවර්ධන කාර්යයන් වෙනුවෙන් අපනයනකරුවන්ගේ දායකත්වය | | 311,469,817 | 233,474,824 |
| ඉ-සේවා ආදායම | | 436,178 | 691,846 |
| අපනයන සංවර්ධන මණ්ඩලයේ ඉ -වෙළඳපොළ අවකාශය | | 81,974 | 60,711 |
| සම්මන්ත්‍රණ හා පාඨමාලා ගාස්තු | | 15,201,792 | 7,337,143 |
| පොත් අලෙවිය | | 83,025 | 139,275 |
| ස්ථාවර වත්කම් විකිණීම | | 886,000 | - |
| ජනාධිපති අපනයන සම්මාන | | - | 13,878,278 |
| අපනයනකරුවන්ගේ සේවා ආදායම | | 4,543,622 | 792,780 |
| Pure Ceylon Cinnamon ලෙස හැඳින්වෙන දේශීය කුරුඳු සඳහා වූ සන්නාමය ලියාපදිංචි කිරීම | | 169,500 | 114,000 |
| නැවත ආපසු නොගෙවන තැන්පතු | | 276,500 | 217,500 |
| විවිධ ආදායම් | | 62,594 | 63,786 |
| ණය මුදල් මුදා හැරීමේ දී විනිමය අනුපාතිකය අනුව ලැබීම් | | 198,381 | |
| | | **819,152,485** | **628,648,002** |

| | සටහන | 2024.12.31 | 2023.12.31 |
|---|---|---|---|
| **(4)** අනෙකුත් ආදායම් | | | |
| පොලී ආදායම - කාර්ය මණ්ඩල ණය | | 1,604,716 | 1,793,597 |
| (අඩුකළා)/එකතු කළා: කාර්ය මණ්ඩල පිරිවැය - ( IFRS ගැලපුම්) | | 6,453,830 | 8,167,658 |
| කාර්ය මණ්ඩල ණය මත ශුද්ධ පොලී ආදායම | | 8,058,546 | 9,961,255 |
| ලාභාංශ ආදායම | **(4.1)** | 43,194,741 | 58,193,884 |
| ආයෝජන මත පොලී ආදායම | **(4.1)** | 3,020,539 | 10,556,804 |
| අනෙකුත් විවිධ ආදායම් | | 402,802 | 635,405 |
| රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය | | 7,709,492 | 6,371,198 |
| | | **62,386,120** | **85,718,546** |

**(4.1)** 2024 වර්ෂයේ රඳවා ගත් බදු අඩු කළ පසු ලාභාංශ ආදායම සහ පොලී ආදායම

| | ලාභාංශ ආදායම | පොලී ආදායම |
|---|---|---|
| දළ වටිනාකම | 50,817,342 | 3,179,515 |
| අඩුකළා: රඳවාගත් බදු | 7,622,601 | 158,976 |
| **ශුද්ධ ආදායම** | **43,194,741** | **3,020,539** |

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
**2024 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ**
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

| | සටහන | ශ්‍රී.ලං.ගි.ප්‍ර 2024.12.31 රු. | ශ්‍රී.ලං.ගි.ප්‍ර 2023.12.31 රු. |
|---|---|---|---|
| **(5)** අපනයන සංවර්ධන වියදම් | | | |
| නිෂ්පාදිත/ වෙළඳපොළ සංවර්ධන වැඩසටහන් | | 22,870,281 | 6,402,941 |
| වෙළඳ ප්‍රදර්ශනය - විදේශීය | | 414,624,229 | 265,332,061 |
| B2B ව්‍යාපාරික රැස්වීම් සහ අනෙකුත් - විදේශීය | | 11,863,193 | 1,596,080 |
| අපනයන වෙළඳපොළ ප්‍රවර්ධනය - දේශීය | | 662,672 | 128,662 |
| ප්‍රතිපත්ති හා සැලසුම් වියදම් | | 79,464 | 232,772 |
| ප්‍රාදේශීය සංවර්ධන වියදම් | | 4,561,511 | 1,295,866 |
| වෙළඳ තොරතුරු සහ සේවා වියදම් | | 16,932,213 | 10,995,691 |
| GIZ වියදම් | | 435 | 662,950 |
| Ceylon Cinnamon සන්නාමය | | 19,459 | 678,797 |
| වෙළඳපොළ ප්‍රවේශය සඳහා සහාය යෝජනා ක්‍රමය | | - | 18,717,021 |
| ජනාධිපති අපනයන සම්මාන | | - | 11,849,131 |
| | | **471,613,457** | **317,891,972** |
| **(6)** පරිපාලන වියදම් | | | |
| වැටුප් හා වේතන | | 135,663,584 | 125,040,742 |
| අතිකාල සහ නිවාඩු දින සඳහා ගෙවීම් | | 7,590,234 | 8,372,384 |
| ප්‍රසාද දීමනා | | 2,457,469 | 2,905,333 |
| සේවක අර්ථසාධක අරමුදල | | 17,716,797 | 16,255,881 |
| සේවක භාරකාර අරමුදල | | 3,487,741 | 3,251,176 |
| පාරිතෝෂික | | 3,625,418 | 7,029,764 |
| විශේෂ ජීවන වියදම් දීමනාවෙහි නොගෙවූ හිඟ මුදල් | | 1,564,347 | - |
| සේවක සුභසාධන කටයුතු | | 13,472,470 | 13,718,796 |
| භාවිතා නොකළ වෛද්‍ය හා විවේක නිවාඩු සඳහා මුදල් ගෙවීම | | 10,497,790 | 7,676,371 |
| බඳවාගැනීම් සඳහා ගාස්තු | | 1,400,704 | 387,314 |
| විදුලිය | | 28,341,481 | 29,469,545 |
| ජලය | | 1,054,556 | 1,135,845 |
| නීති සහ අනෙකුත් වෘත්තීය ගාස්තු | | 504,545 | 1,231,501 |
| වෙළඳ ප්‍රචාරණය | | 571,853 | 534,976 |
| ආරක්ෂක සේවා | | 2,553,495 | 2,234,869 |
| විගණන ගාස්තු | | 1,501,350 | 1,854,630 |
| මුද්‍රණ ගාස්තු | | 1,549,069 | 251,984 |
| ප්‍රවාහන සහ ගමන් වියදම් ගාස්තු | | 18,412,280 | 17,816,581 |
| රැස්වීම් වියදම් | | 62,774 | 318,070 |
| අනෙකුත් පොදු වියදම් | | 378,037 | 192,642 |
| කාර්ය මණ්ඩල පිරිවැය ක්‍රමක්ෂය | | 5,271,105 | 4,427,352 |
| අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ ගාස්තු හා වියදම් | | 872,002 | 860,078 |
| කාර්යාල උපකරණ නඩත්තුව | | 2,541,809 | 2,169,583 |
| කුලී | | 85,538,014 | 97,887,575 |

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**
**2024 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ**
**මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**

| | සටහන | ශ්‍රී.ලං.ගි.ප්‍ර 2024.12.31 රු. | ශ්‍රී.ලං.ගි.ප්‍ර 2023.12.31 රු. |
|---|---|---|---|
| ඉන්ධන සහ ස්නේහක | | 11,507,272 | 10,237,478 |
| වාහන අලුත්වැඩියාව හා නඩත්තුව | | 10,315,906 | 5,290,587 |
| කුලියට ගැනීමේ ගාස්තු | | 23,964 | 12,800 |
| සන්නිවේදන හා දායකත්ව මුදල් | | 7,858,715 | 7,998,125 |
| ස්ථාවර වත්කම් ක්ෂයවීම් | | 19,323,775 | 21,732,900 |
| අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය | | 1,113,440 | 475,357 |
| කාර්යාල ගොඩනැගිලිවලින් මාරුවීමේ වියදම් | | 469,857 | 2,519,326 |
| දේශීය පුහුණු | | 636,616 | 437,989 |
| විදේශීය පුහුණු | | 3,480,017 | 1,935,472 |
| සැපයුම් අවශ්‍යතා | | 3,122,719 | 3,330,889 |
| රක්ෂණ හා බලපත්‍ර අලුත් කිරීම් | | 490,747 | 201,540 |
| විවිධ වත්කම් මිලදී ගැනීම | | 668,179 | 232,000 |
| මුද්දර ගාස්තු | | 47,970 | 804,718 |
| | | **405,688,100** | **400,232,173** |

**(7) ආයෝජන හා අනෙකුත් ලැබිය යුතු දෑ හානිකරණය සඳහා වෙන්කිරීම්**

| | සටහන | 2024.12.31 | 2023.12.31 |
|---|---|---|---|
| හවුල් ආයෝජනයට අදාළ වෙන් කිරීම් | (12.1) | (2,376,937) | 1,267,160 |
| වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ සඳහා අදාළ හානිකරණ වෙන් කිරීම් (සටහන 14 යටතේ දක්වා ඇත්තේ වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ සඳහා අදාළව දිගු කාලයක් මුළුල්ලේ පැවතෙන හානිකරණ වෙන්කිරීම් වේ ). | | 65,771 | 1,429,763 |
| වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ යටතේ දිගු කාලයක් පැවතෙන හිඟහිටි මුදල් | | | |
| සේවා සඳහා ලබාදී ඇති තැන්පතු සඳහා හානිකරණ වෙන්කිරීම් (සටහන 15 යටතේ දක්වා ඇත) | | - | - |
| එවැනි හිඟහිටි මුදල් | | | |
| අපනයන ණයවලට අදාළ වෙන් කිරීම් ප්‍රතිවර්තනය කිරීම (සටහන 14 යටතේ දක්වා ඇත) | | (43,000) | (146,492) |
| | | **(2,354,166)** | **2,550,431** |

**(8) මූල්‍ය පිරිවැය**

| | | 2024.12.31 | 2023.12.31 |
|---|---|---|---|
| මූල්‍ය ගාස්තු | | 181,277 | 115,321 |
| | | **181,277** | **115,321** |

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**
**2024 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ**
**මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**

**(9) දේපළ, පිරියත හා උපකරණ**

**(9.1) පිරිවැය**

| 2023/01/01 දිනට ශේෂය | වත්කම් | 2024/01/01 දිනට ශේෂය | එකතු කිරීම් | ප්‍රත්‍යාගණනය | ඉවත්කිරීම් | 2024/12/31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| 93,000,000 | මෝටර් වාහන | 93,000,000 | - | - | 1,500,000 | 91,500,000 |
| 26,992,824 | පරිගණක | 32,791,866 | 1,287,776 | - | 382,336 | 33,697,306 |
| 1,312,152 | පරිගණක උපකරණ | 2,666,153 | | - | 18,230 | 2,647,923 |
| 735,930 | Kiosk පද්ධතිය | 735,930 | | - | - | 735,930 |
| 4,196,296 | රූපවාහිනී උපකරණ | 4,196,296 | | - | - | 4,196,296 |
| 143,174 | PABX උපකරණ | 143,174 | | - | - | 143,174 |
| 1,903,827 | දුරකතන ස්ථාපිත කිරීම් | 1,958,727 | 898,034 | - | 1,379,757 | 1,477,004 |
| 15,522,317 | ගෘහභාණ්ඩ හා සවිකිරීම් | 15,553,516 | 243,615 | - | 1,175,721 | 14,621,410 |
| 13,176,074 | කාර්යාල උපකරණ | 14,190,300 | 726,880 | - | 1,141,313 | 13,775,866 |
| 34,740 | අනෙකුත් උපකරණ | 34,740 | | - | - | 34,740 |
| 69,240 | ගෘහස්ත දුරකතන | 69,240 | | - | - | 69,240 |
| **157,086,574** | | **165,339,942** | **3,156,304.26** | **-** | **5,597,356.95** | **162,898,889** |

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**
**2024 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ**
**මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**

**(9.2) ක්ෂය කිරීම්**

| 2023/01/01 දිනට ශේෂය | ක්ෂය කිරීම් | 2024/01/01 දිනට ශේෂය | පූර්ව කාලසීමා සඳහා ගැලපුම් | වර්ෂය සඳහා අයකිරීම් | ඉවත් කිරීම් සඳහා ක්ෂය කිරීම් | 2024/12/31 දිනට ශේෂය |
|---:|---|---:|---:|---:|---:|---:|
| 4,820,000 | මෝටර් වාහන | 20,380,000 | - | 15,460,000 | 600,000 | 35,240,000 |
| 22,388,895 | පරිගණක | 24,572,247 | - | 2,447,066 | 382,336 | 26,636,977 |
| 954,964 | පරිගණක උපකරණ | 1,210,411 | - | 461,921 | 18,230 | 1,654,101 |
| 735,930 | Kiosk පද්ධතිය | 735,930 | - | - | - | 735,930 |
| 2,421,709 | රූපවාහිනී උපකරණ | 2,490,399 | - | 208,670 | - | 2,699,069 |
| 82,324 | PABX උපකරණ | 101,774 | - | 7,763 | - | 109,536 |
| 1,773,393 | දුරකතන ස්ථාපිත කිරීම් | 1,865,753 | - | 79,623 | 1,379,757 | 565,618 |
| 10,654,314 | ගෘහභාණ්ඩ හා සවිකිරීම් | 14,886,783 | - | 24,361 | 1,175,721 | 13,735,424 |
| 11,743,156 | කාර්යාල උපකරණ | 11,064,288 | - | 634,372 | 1,141,313 | 10,557,347 |
| 34,740 | අනෙකුත් උපකරණ | 34,740 | - | - | - | 34,740 |
| 69,240 | ගෘහස්ත දුරකතන | 69,240 | - | - | - | 69,240 |
| **55,678,665** | | **77,411,565** | **-** | **19,323,775** | **4,697,356.95** | **92,037,983** |

| | *ලියා හරින ලද අගය* | *2024* | *2023* |
|---:|---|---:|---:|
| 157,086,574 | පිරිවැය | 162,898,889 | 165,339,942 |
| (55,678,665) | උපචිත: ක්ෂය කිරීම් | (92,037,983) | (77,411,565) |
| **101,407,909** | ලියා හරින ලද අගය | **70,860,906** | **87,928,377** |

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**
**2024 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ**
**මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**

**(10) අස්පෘශ්‍ය වත්කම්**

**(10.1) පිරිවැය**

| 2023/01/01 දිනට ශේෂය | වත්කම් | 2023/01/01 දිනට ශේෂය | එකතු කිරීම් | ප්‍රත්‍යාගණනය | ඉවත්කිරීම් | 2024/12/31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| 3,809,599 | පරිගණක මෘදුකාංග | 7,993,360 | - | | 30,400 | 7,962,960 |
| **3,809,599** | | **7,993,360** | **-** | **-** | **30,400** | **7,962,960** |

**(10.2) ක්ෂය කිරීම්**

| 2023/01/01 දිනට ශේෂය | ක්ෂය කිරීම් | 2024/01/01 දිනට ශේෂය | පූර්ව කාල පරිච්ඡේද සඳහා ගැලපුම් | වර්ෂය සඳහා අයකිරීම් | ඉවත්කිරීම් සඳහා ක්ෂය කිරීම් | 2024/12/31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| 3,664,301 | පරිගණක මෘදුකාංග | 4,139,658 | - | 1,113,440 | 30,400 | 5,222,698 |
| **3,664,301** | | **4,139,658** | **-** | **1,113,440** | **30,400** | **5,222,698** |

| | *ලියා හරින ලද අගය* | *2024* | *2023* | *2022* |
|---|---|---|---|---|
| 3,809,599 | පිරිවැය | 7,962,960 | 7,993,360 | 3,809,599 |
| (3,664,301) | උපචිත: ක්ෂය කිරීම් | (5,222,698) | (4,139,657) | (3,664,301) |
| **145,298** | ලියා හරින ලද අගය | **2,740,262** | **3,853,703** | **145,298** |

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
2024 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

| | සටහන | ශ්‍රී.ලං.ගි.ප්‍ර 2024.12.31 රු. | ශ්‍රී.ලං.ගි.ප්‍ර 2023.12.31 රු. |
|---|---|---|---|
| **(11) ආශ්‍රිත සමාගම්වල ආයෝජන - ලැයිස්තු ගත නොකළ** | | | |
| ආශ්‍රිත සමාගම්වල ආයෝජන - DHPL | | 1,413,097,405 | 1,341,453,480 |
| | | **1,413,097,405** | **1,341,453,480** |
| **(12) අනෙකුත් ජංගම නොවන මූල්‍ය වත්කම්** | | | |
| කොටස්වල ආයෝජනය කිරීම් | (12.1) | 170,407,420 | 168,030,485 |
| කාර්ය මණ්ඩල ණය - ජංගම නොවන | (14.1) | 29,624,415 | 33,292,150 |
| | | **200,031,835** | **201,322,635** |
| **(12.1) කොටස්වල ආයෝජන** | | | |
| කොටස්වල ආයෝජනය කිරීම් | | 111,800,231 | 112,199,832 |
| ගැලපුම් සඳහා වෙන් කිරීම් | | | |
| (-) හානිකරණ අගය සඳහා වෙන්කිරීම් | | (58,607,189) | 55,830,652 |
| | | **170,407,420** | **168,030,484** |

| නම | 2023/12/31 දිනට ආයෝජිත මුදල | 2023/12/31 දිනට වෙන් කිරීම් | 2023/12/31 දිනට අගය |
|---|---|---|---|
| කළම්බු ඩොක්යාඩ් පීඑල්සී | 1,258,600 | (6,099,149) | 7,357,749 |
| ලංකා කැනරීස් ලිමිටඩ් | 399,600 | 399,600 | - |
| ලංකා ටයිල්ස් පීඑල්සී | 9,950 | (365,234) | 375,184 |
| එස් ඒ සිල්වා ඇන්ඩ් සන්ස් ලංකා ලිමිටඩ් | 13,150,000 | (145,489,356) | 158,639,356 |
| දඹදෙණිය ඊපීවී | 15,000 | | 15,000 |
| ලුම්බිණි ඇක්වේරියා (ප්‍රයිවට්) ලිමිටඩ් | 2,200,000 | 2,200,000 | - |
| සීඩබ්ජී හම්බන්තොට (ප්‍රයිවට්) ලිමිටඩ් | 8,000,000 | 8,000,000 | - |
| ලක් ලේටෙක්ස් සෙන්ට්‍රිෆියුජ් (ප්‍රයිවට්) ලිමිටඩ් | 285,000 | - | 285,000 |
| ලේටෙක්ස්එම් ග්ලවුස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 158,195 | - | 158,195 |
| කැළණි වැලි කැනරීස් ලිමිටඩ් | 1,200,000 | - | 1,200,000 |
| අනෙකුත් කොටස් | 85,523,487 | 85,523,487 | - |
| එකතුව | **112,199,832** | **(55,830,652)** | **168,030,484** |

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**
**2024 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ**
**මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**

| නම | 2024/12/31 දිනට ආයෝජිත මුදල | 2024/12/31 දිනට වෙන් කිරීම් | 2024/12/31 දිනට අගය |
|---|---|---|---|
| කළම්බු ඩොක්යාඩ් පීඑල්සී | 1,258,600 | (8,342,898) | 9,601,498 |
| ලංකා ටයිල්ස් පීඑල්සී | 9,950 | (498,422) | 508,372 |
| එස් ඒ සිල්වා ඇන්ඩ් සන්ස් ලංකා ලිමිටඩ් | 13,150,000 | (145,489,356) | 158,639,356 |
| දඹදෙණිය ඊපීවී | 15,000 | | 15,000 |
| ලුම්බිණි ඇක්වේරියා (ප්‍රයිවට්) ලිමිටඩ් | 2,200,000 | 2,200,000 | - |
| සීඩබ්ජී හම්බන්තොට (ප්‍රයිවට්) ලිමිටඩ් | 8,000,000 | 8,000,000 | - |
| ලක් ලේටෙක්ස් සෙන්ට්‍රිෆියුජ් (ප්‍රයිවට්) ලිමිටඩ් | 285,000 | | 285,000 |
| ලේටෙක්ස්එම් ග්ලවුස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 158,195 | | 158,195 |
| කැළණි වැලි කැනරීස් ලිමිටඩ් | 1,200,000 | | 1,200,000 |
| අනෙකුත් කොටස් | 85,523,487 | 85,523,487 | - |
| **එකතුව** | **111,800,231** | **(58,607,189)** | **170,407,421** |

**එබැවින් ආදායම් ප්‍රකාශය මත බලපෑම** 2,376,937

*** *****ලංකා කැනරීස් ලිමිටඩ්හි කොටස්වල සිදුකර ඇති ආයෝජන 2024 වර්ෂයේ දී මහා භාණ්ඩාගාරය වෙත පවරා ඇත.

*****සටහන 14 යටතේ අනෙකුත් වත්කම් යටතේ පිකෝ ආර්ට් ඉන්ටර්නැෂනල් හඳුනාගෙන ඇති අතර , 2023 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශවල හඳුනාගත් පරිදි එය අනෙකුත් කොටස් යටතේ වර්ගීකරණය කිරීමෙන් බැහැර කර තිබේ.

| නම | කොටස් සංඛ්‍යාව | කොටසක වෙළඳපොළ අගය | 2024/12/31 දිනට කොටස්වල අගය |
|---|---|---|---|
| කළම්බු ඩොක්යාඩ් පීඑල්සී | 145,698 | 65.90 | 9,601,498 |
| ලංකා ටයිල්ස් පීඑල්සී | 8,705 | 58.40 | 508,372 |
| එස් ඒ සිල්වා ඇන්ඩ් සන්ස් ලංකා ලිමිටඩ් | 1,413,772 | 112.21 | 158,639,356 |

එස් ඒ සිල්වා ඇන්ඩ් සන්ස් ලංකා ලිමිටඩ් සතු කොටස්වල අගය නිර්ණය කරගනු ලැබුවේ සමාන සමාගමක් පදනම් කරගනිමිනි. 336.64

336.64න් 1/3ක් පමණක් තක්සේරු කිරීම සඳහා ගන්නා ලදී . 112.21

*** ශ්‍රී.ල.ගි.ප්‍ර LKAS 39 ප්‍රකාරව හානිකරණය සඳහා හිමිකම් කොටස්වල සිදුකළ ආයෝජන පරීක්ෂා කරන ලදී . කළම්බු ඩොක්යාඩ් පීඑල්සී සහ ලංකා ටයිල්ස් පීඑල්සී යන සමාගම්වල කොටස් වෙළඳපොළ අගය මත මිනුම්කරණය කරන ලදී.

2023 වර්ෂයේ දී එස් ඒ සිල්වා ඇන්ඩ් සන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ ඊට සමාන සමාගම යන සමාගම් ද්විත්වයම පාඩු ලබන ලදී. එස් ඒ සිල්වා ඇන්ඩ් සන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්හි කොටස්වල වටිනාකම හානිකරණය සඳහා පරීක්ෂා කරන ලද අතර අගය හානිකරණය සඳහා සාක්ෂි නොතිබිණි .

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**
**2024 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ**
**මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**

| | සටහන | ශ්‍රී.ලං.ගි.ප්‍ර 2024.12.31 රු. | ශ්‍රී.ලං.ගි.ප්‍ර 2023.12.31 රු. |
|---|---|---|---|
| **(13)** තොග | | | |
| ලිපිද්‍රව්‍ය | | 2,987,447 | 3,429,856 |
| තොග - විවිධ වත්කම් | | 455,929 | 78,902 |
| | | **3,443,376** | **3,508,758** |
| **(14)** වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | | | |
| අපනයනකරුවන්ගේ ණය | | 37,984,520 | 38,027,520 |
| ඌව පරණගම අපනයන ප්‍රවර්ධන | | 10,403,683 | 10,403,683 |
| පිකෝ ආර්ට් ඉන්ටර්නැෂනල් | | 49,250,000 | 49,250,000 |
| (-) ණය හානිකරණය සඳහා වෙන් කිරීම් | | (97,638,203) | (97,681,203) |
| | | - | - |
| කාර්ය මණ්ඩල ණය - ජංගම | **(14.1)** | 7,282,000 | 7,426,425 |
| ආයෝජන සඳහා ලැබිය යුතු පොලිය | | 413,067 | 364,780 |
| අනෙකුත් ණයකරුවෝ | | 13,581,512 | 9,874,079 |
| (-) ණය හානිකරණය සඳහා වෙන් කිරීම් | | (8,055,091) | (7,989,321) |
| | | **13,221,489** | **9,675,963** |
| **(14.1)** කාර්ය මණ්ඩල ණය | | | |
| <u>ජංගම නොවන</u> | | | |
| කාර්ය මණ්ඩල ණය | | 27,641,115 | 31,984,221 |
| අඩු කළා: නොගෙවන ලද කාර්ය මණ්ඩල ණය සඳහා වෙන් කිරීම් | | (63,884) | (63,884) |
| පෙර ගෙවූ කාර්ය මණ්ඩල ප්‍රතිලාභ (සටහන 14.1.2) | | 8,438,731 | 10,422,223 |
| අඩු කළා: වෙළඳපොළෙන් බැහැර අනුපාතික මත පොළිය සඳහා විලම්භනය කළ සාධාරණ අගය ගැලපුම් | | (6,391,547) | (9,050,410) |
| | | **29,624,415** | **33,292,150** |
| <u>ජංගම</u> | | | |
| කාර්ය මණ්ඩල ණය | | 7,865,258 | 8,517,037 |
| පෙර ගෙවූ කාර්ය මණ්ඩල ප්‍රතිලාභ (සටහන 14.1.2) | | 1,261,694 | 1,449,904 |
| අඩු කළා: නොගෙවන ලද කාර්ය මණ්ඩල ණය සඳහා වෙන් කිරීම් | | | |
| වෙළඳපොළෙන් බැහැර අනුපාතික මත පොළිය සඳහා විලම්භනය කළ සාධාරණ අගය ගැලපුම් | | (1,844,952) | (2,540,516) |
| | | **7,282,000** | **7,426,425** |

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**
**2024 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ**
**මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**

| | | සටහන | ශ්‍රී.ලං.ගි.ප්‍ර 2024.12.31 රු. | ශ්‍රී.ලං.ගි.ප්‍ර 2023.12.31 රු. |
|---|---|---|---|---|
| **(15)** | **අත්තිකාරම් හා පූර්ව ගෙවීම්** | | | |
| | පූර්ව ගෙවීම් | **(15.1)** | 88,200,207 | 71,817,890 |
| | අත්තිකාරම් | **(15.2)** | 3,311,577 | 6,199,657 |
| | සේවා සඳහා තැන්පතු | | 1,356,450 | 1,356,450 |
| | (-) ණය හානිකරණ සඳහා වෙන් කිරීම් | | (884,949) | (884,949) |
| | | | **91,983,286** | **78,489,048** |
| **(15.1)** | පූර්ව ගෙවීම් - ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනය | | 80,406,316 | 67,526,426 |
| | පූර්ව ගෙවීම් - අනෙකුත් | | 7,793,891 | 4,291,464 |
| | | | **88,200,207** | **71,817,890** |
| **(15.2)** | ජාතික අපනයන සන්නාම සකස් කිරීම සඳහා අත්තිකාරම් | | - | 1,894,357 |
| | කාබනික තත්ත්ව සහතිකකරණය සඳහා අත්තිකාරම් - අපනයන සංවර්ධන මණ්ඩලය මගින් සහාය ලබාදීමේ යෝජනා ක්‍රමය 2023 | | - | 1,903,440 |
| | ජාතික ඇසුරුම් මධ්‍යස්ථානය සැලසුම් කිරීම සහ ඉදිකිරීම සඳහා අත්තිකාරම් | | - | 667,957 |
| | රෙදිපිළි සඳහා අත්තිකාරම් | | 1,260,000 | 1,057,500 |
| | අනෙකුත් අත්තිකාරම් | | 2,051,577 | 676,403 |
| | | | **3,311,577** | **6,199,657** |
| **(16)** | **මුදල් හා මුදල් සමාන දෑ** | | | |
| | කෙටි කාලීන ආයෝජන | **(16.1)** | 75,826,011 | 155,581,307 |
| | ලංකා බැංකුව - ලේක්විව් (306605) | | 17,943,796 | 27,172,951 |
| | ජාතික සංවර්ධන බැංකුව | | 1,555,028 | 167,946 |
| | ලංකා බැංකුව - ආයතනික ශාඛාව | | 1,378,266 | 523,087 |
| | සම්පත් බැංකුව - මහනුවර | | 315 | 185 |
| | සම්පත් බැංකුව - ගාල්ල | | 1,121 | 1,033 |
| | ලංකා බැංකුව - මන්නාරම | | 2,677 | 1,500 |
| | සම්පත් බැංකුව - කුරුණෑගල | | 626 | 500 |
| | ලංකා බැංකුව - බැංකුව මගින් සිදුකරන | | - | - |
| | අතැති මුදල් | | 2,628 | 1,864 |
| | | | **96,710,468** | **183,450,373** |

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**

**2024 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ**

**මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**

| | සටහන | ශ්‍රී.ලං.ගි.ප්‍ර 2024.12.31 රු. | ශ්‍රී.ලං.ගි.ප්‍ර 2023.12.31 රු. |
|---|---|---|---|
| **(16.1) කෙටිකාලීන ආයෝජන** | | | |
| ස්ථාවර තැන්පතු - ලංකා බැංකුව - ලේක් වීව් ශාඛාව | | 75,826,011 | 155,581,307 |
| | | **75,826,011** | **155,581,307** |
| **(17) ලැබූ ප්‍රදාන - හිමිකම් දායකත්වය** | | | |
| මහා භාණ්ඩාගාරය මගින් ලබාදුන් ප්‍රාග්ධනය | | 7,904,002 | 7,904,002 |
| UNDP දායකත්වය | | 2,110,282 | 2,110,282 |
| | | **10,014,284** | **10,014,284** |
| **(18) ලැබූ ප්‍රදාන** | | | |
| රජයේ දායකත්වය - මෝටර් වාහන | | 38,826,450 | 38,826,450 |
| රජයේ දායකත්වය - අනෙකුත් | | 26,924,743 | 26,924,743 |
| ප්‍රදාන - අනෙකුත් | | 38,834,874 | 11,757,028 |
| ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානයේ (ITC) දායකත්වය | | 12,716 | 12,716 |
| අපනයන ප්‍රවර්ධන ලේකම් කාර්යාලය | | 202,677 | 202,677 |
| ප්‍රදාන - වෙළඳපොළ ප්‍රවේශ වැඩසටහන | | 939,000 | 939,000 |
| (-) රජයේ ප්‍රදානයන් ක්‍රමක්ෂය | | (64,107,451) | (56,397,959) |
| | | **41,633,010** | **22,264,655** |
| **(19) වෙන් කිරීම් හා අනෙකුත් වගකීම්** | | | |
| අපනයනකරුවන්ගේ දායකත්වය | | 122,936,186 | 166,513,106 |
| නැවත ආපසු ගෙවන තැන්පතු | | 8,908,528 | 8,918,528 |
| ජනාධිපති අපනයන සම්මාන | | 3,528,807 | |
| | | **135,373,521** | **175,431,634** |
| **(20) විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම්** | | | |
| ඉදිරියට ගෙන ආ ශේෂය | | 33,998,835 | 27,771,814 |
| වර්ෂය තුළ වෙන් කිරීම් | | 9,967,882 | 13,138,566 |
| වර්ෂය තුළ ගෙවීම් | | (18,715,037) | (6,911,545) |
| ඉදිරියට ගෙන ගිය ශේෂය | | **25,251,680** | **33,998,835** |

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**

**2024 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ**

**මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**

| | | සටහන | ශ්‍රී.ලං.ගි.ප්‍ර 2024.12.31 රු. | ශ්‍රී.ලං.ගි.ප්‍ර 2023.12.31 රු. |
|---|---|---|---|---|
| **(21)** | **අනෙකුත් ගෙවිය යුතු** | | | |
| | ගෙවිය යුතු මුද්දර ගාස්තු | | 27,625 | 23,760 |
| | ගෙවිය යුතුව ඇති උපයන විට ගෙවීමේ බද්ද | | 320,487 | 175,303 |
| | ගෙවිය යුතුව ඇති රඳවාගැනීමේ බද්ද | | 1,177,800 | |
| | ගෙවිය යුතු වැටුප් | | 14,900 | |
| | හිමිකම් නොඉල්ල වූ විවිධ ගෙවීම් | | 47,165 | 47,165 |
| | සේවක අර්ථසාධක අරමුදල සඳහා ගෙවිය යුතු | | - | 2,166,535 |
| | සේවක භාරකාර අරමුදල සඳහා ගෙවිය යුතු | | - | 259,984 |
| | සේවකයින්ගේ අවසන් ගෙවීම් | | 43,997 | 43,997 |
| | ගෙවිය යුතු විගණන ගාස්තු | | 1,546,980 | 1,546,980 |
| | ටෙන්ඩර්වලට අදාළව නැවත ආපසු ගෙවන තැන්පතු මුදල් | | 51,000 | 49,000 |
| | ඉදිරිපත් නොකළ චෙක්පත් - ණය හිමියෝ | | 3,117,196 | 105,416 |
| | සේවා ගිවිසුම්වලට අදාළ හිඟ හිටි වැටුප් සඳහා වෙන්කිරීම් | | 3,048,943 | 6,400,487 |
| | අනෙකුත් උපචිත වියදම් | | 19,704,952 | 22,970,037 |
| | පාලන ගිණුම - ජාතික අපනයන උපාය මාර්ග | | 2,284,276 | 124,276 |
| | පාලන ගිණුම - වෙළඳ පොළ ප්‍රවේශ වැඩසටහන | | 950,000 | - |
| | පාලන ගිණුම - කිතුල් නිෂ්පාදන වැඩිදියුණු කිරීම | | 266,026 | 288,122 |
| | පාලන ගිණුම - කෝපි අපනයන ප්‍රවර්ධන ගම්මාන වැඩසටහන | | 642,213 | 642,213 |
| | ජාතික අපනයන සන්නාම | | 1,112,453 | 1,112,453 |
| | ගෙවිය යුතු විශ්‍රාම වැටුප් ගිණුම | | 29,238 | |
| | | | **34,385,250** | **35,955,728** |

**(22)** ශ්‍රී.ල.ගි.ප්‍ර LKAS 39 ප්‍රකාරව, හිමිකම් කොටස්වල සිදුකළ ආයෝජන සම්බන්ධයෙන් හානිකරණය සඳහා පරීක්ෂා කරන ලදී. කළම්බු ඩොක්යාඩ් පීඑල්සී සහ ලංකා ටයිල්ස් පීඑල්සී කොටස් 2024.12.31 දිනට වෙළඳපොළ අගයන් මත මිනුම්කරණය කළ අතර එස් ඒ සිල්වා ඇන්ඩ් සන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්හි කොටස් ඊට සමාන සමාගමක 2022.12.31 දිනට වෙළඳපොළ අගය මත මිනුම්කරණය කරන ලදී.

**(23)** **කාර්ය මණ්ඩල ණය**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ සේවකයන් සහනදායි පොලී අනුපාතික යටතේ වන ණය පහසුකම් සඳහා හිමිකම් ලබයි. ගිණුම්කරණ ප්‍රමිත “IFRS 9 - මූල්‍ය උපකරණ” ප්‍රකාරව එම ණය, වට්ටම්ගත කළ මුදල් ප්‍රවාහ යටතේ සාධාරණ අගයට පවතී. ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත SLFRS 9 - “මූල්‍ය උපකරණ” ප්‍රකාරව කාර්ය මණ්ඩල ණය මුලින් සාධාරණ අගයට හඳුනාගන්නා අතර ඉන් අනතුරුව ඵලදායි පොලී අනුපාතිකය (EIR) භාවිතා කර ක්‍රමක්ෂය පිරිවැයෙන් හානිකරණ සඳහා වෙන් කිරීම් අඩුකර මිනුම්කරණය කෙරේ.

වෙන්කළ අගය හා එහි සාධාරණ අගය අතර වෙනස, පෙර ගෙවූ කාර්ය මණ්ඩල පිරිවැයක් සහ සාධාරණ අගය හානිවීමක් ලෙස සලකනු ලැබේ. ගෙවූ කාර්ය මණ්ඩල පිරිවැය ක්‍රමක්ෂය කරනුයේ අපේක්ෂිත සේවකයාගේ ජීව සේවා කාලය අනුවය.

සාධාරණ අගය හානිය ගණනය කරනුයේ ඵලදායි පොලී අනුපාතිකයේ අනිවාර්යෙන් පැවැතිය යුතු කොටස් වන අත්පත් කරගැනීම හා ගාස්තු හා පිරිවැය මත වන වට්ටම් කිරීමක් හෝ වාරික මුදල සැලකිල්ලට ගැනීමෙනි. සාධාරණ අගය හානිවීම ලාභ හෝ අලාභ ප්‍රකාශයේ “අනෙකුත් ආදායම්” යටතේ ඇතුළත් කරගනු ලැබේ.

**වට්ටම් අනුපාතිකය**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ කළමනාකාරිත්වය විසින් එකඟ වූ පරිදි කොමර්ෂල් බැංකුවේ සාමාන්‍ය හරිත ණය දීමේ අනුපාතිකය (AWLR) වට්ටම් අනුපාතිකය වශයෙන් යොදා ගන්නා අතර , එය ණය කාල සීමාව අනුව වෙනස් වේ . ශ්‍රී ලංකා මහ බැංකුවේ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට අනුව 2024 දෙසැම්බර් 31 වන දිනට සාමාන්‍ය හරිත ණය දීමේ අනුපාතිකය 12.06% කි.

කාර්ය මණ්ඩල ණය සම්බන්ධයෙන් වූ පහත කොටස්වලට අදාළ ගිණුම්කරණය SLFRS 9 සහ LKAS 19 යන ප්‍රමිත අනුව සිදු කෙරේ .

| | | |
|---|---|---|
| කාර්ය මණ්ඩල ණය | රු. | 35,501,667 |
| අඩු කළා: වෙළඳපොළෙන් බැහැර ණය අනුපාතික මත විලම්භිත සාධාරණ අගය මත ගැලපුම් (සටහන 23.1) | රු. | (7,874,163) |
| පෙර ගෙවූ කාර්ය මණ්ඩල ප්‍රතිලාභ (සටහන 23.2) | රු. | 9,779,393 |
| කාර්ය මණ්ඩල ණය මත ශුද්ධ පොලී ආදායම | රු. | 37,406,897 |

**සටහන (23.1) වෙළඳපොළෙන් බැහැර අනුපාතික යටතේ වන ණය මත විලම්භිත සාධාරණ අගය ගැලපුම්**

| | | |
|---|---|---|
| ආරම්භක ශේෂය | රු. | 11,228,591 |
| වාර්තාකරණ දිනයට පූර්ව වර්ෂ ගැලපුම් | රු. | (6,453,830) |
| වර්ෂය තුළ ප්‍රදානය කළ ණයවලින් සාධාරණ අගය හානිය / (ලාභය) | රු. | 3,099,402 |
| අවසන් දළ ධාරණ අගය | රු. | 7,874,163 |

**සටහන (23.2) පෙර ගෙවූ කාර්ය මණ්ඩල ප්‍රතිලාභ**

| | | |
|---|---|---|
| ආරම්භක ශේෂය | රු. | 11,951,096 |
| වර්ෂය තුළ ප්‍රදානය කළ ණයවලින් සාධාරණ අගය හානිය/ (ලාභය) | රු. | 3,099,402 |
| අඩුකළා: කාර්ය මණ්ඩල ණය ප්‍රතිලාභ ක්‍රමක්ෂය | රු. | (5,271,105) |
| අවසන් දළ ධාරණ අගය | රු. | 9,779,393 |

## (24) ආශ්‍රිත පාර්ශව ගනුදෙනු

### (24.1) ආශ්‍රිත සමාගම - ඩෙවලොප්මන්ට් හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

ඇතැම් නිශ්චිත ක්‍රියාකාරකම් සඳහා ව්‍යාපාරයේ සාමාන්‍ය කටයුතු අතරේ දී එහි ආශ්‍රිත සමාගම වෙත, එනම් ඩෙවලොප්මන්ට් හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත ගෙවීම් සිදුකරන අතර එම ගෙවීම් ආශ්‍රිත පාර්ශව ගනුදෙනු වශයෙන් සලකනු ලැබේ. වාර්තාකරණ කාල පරිච්ඡේදය තුළ, හිඟ හිටි ශේෂ හා බැදීම් ඇතුළත් පහත ගනුදෙනු එවැනි ආශ්‍රිත පාර්ශව සමග ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සිදුකර තිබේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත LKAS 24 හි දැක්වෙන හෙළිදරව්කිරීමේ අවශ්‍යතා අනුව පහත විස්තර ඉදිරිපත් කෙරේ (27 වැනි පරිච්ඡේදය).

| නම | ගනුදෙනු | 2024<br>වටිනාකම (රු.) | 2023<br>වටිනාකම (රු.) |
|---|---|---|---|
| ඩෙවලොප්මන්ට් හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | කුලිය | 74,800,762 | 85,417,958 |
| | විදුලිය | 26,874,465 | 25,457,621 |
| | ජලය | 410,281 | 415,976 |
| | පිරිසිදු කිරීමේ සේවා | 466,434 | 415,991 |
| | ශ්‍රවණාගාරය කුලි පදනම මත ලබාදීමේ ගාස්තු | 446,494 | 91,345 |
| | හිමිකම් ලැබීම් (රඳවා ගත් බදු හැර) | 34,231,362 | 34,231,362 |

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**
**2024 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ**
**මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**

**(24.2) ප්‍රධාන කළමනාකරණ පිරිස්**

පහත සඳහන් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ අධ්‍යක්ෂවරුන්ගෙන් (HM කාණ්ඩය) කළමනාකරණ කමිටුව සමන්විත වන අතර, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත LKAS 24 හි දැක්වෙන හෙළිදරව්කිරීමේ අවශ්‍යතා අනුව 2024 වර්ෂය සඳහා ඔවුන්ගේ සමහාර පාරිශ්‍රමිකය, ලබාගත් ණයවල විස්තර පහත සඳහන් ආකාරයෙන් වේ.

| නම සහ තනතුර | සමහාර පාරිශ්‍රමිකය | අනෙකුත් පාරිශ්‍රමික | ණය විස්තර (රු.) | | |
|---|---|---|---|---|---|
| | | | ලබා දුන් ණය | වර්ෂය තුළ ආපසු අයකරගත් ණය | **2024/12/31** දිනට හිඟ හිටි මුදල |
| ආචාර්ය කින්ග්ස්ලි බර්නාඩ් මහතා හිටපු සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී | 1,327,190 | - | - | - | - |
| මංගල විජේසිංහ මහතා සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී | - | - | - | - | - |
| සි.ඩී.ධර්මසේන මිය අධ්‍යක්ෂ ජනරාල් | 663,676 | - | - | - | - |
| මාලිනී බැද්දේගමගේ මිය හිටපු වැ.බ. අධ්‍යක්ෂ ජනරාල් | 287,103 | 2,345,613 | - | - | - |
| කේ.ඒ.වී.ප්‍රේමතිලක මිය අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන) | 2,497,825 | 157,235 | - | - | - |
| ඕ.එම්.සී.කුමුදූනි මිය අධ්‍යක්ෂ | 2,818,855 | 147,580 | - | - | - |
| එල්.වයි.ආර්.අයි.කොඩිකාර මිය | 1,842,025 | 122,610 | - | - | - |
| ජේ.එස්.බදුගම මහතා අධ්‍යක්ෂ | 2,380,735 | 104,056 | - | - | - |
| ඩී.ටී.විජේරත්න මිය අධ්‍යක්ෂ | 2,219,801 | 140,770 | 250,000 | 87,121 | 162,879 |
| එෆ්.ආර්.ගෆූර් මිය අධ්‍යක්ෂ | 1,181,316 | - | - | - | - |
| කේ.ඩී.පෙරේරා මහතා අධ්‍යක්ෂ | 2,452,496 | 122,610 | - | - | - |
| එම්.දිසානායක මිය අධ්‍යක්ෂ | 1,869,050 | 127,150 | 250,000 | 87,121 | 162,879 |
| එස්.යූ.රත්නසේකර මහතා අධ්‍යක්ෂ | 1,681,988 | 118,070 | 250,000 | - | 250,000 |

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**
**2024 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ**
**මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**

**(25) අසම්භාව්‍ය වත්කම් හා වගකීම්**

පහත දක්වා ඇති විස්තර හැර ශේෂ පත්‍ර දිනට අසම්භාව්‍ය වත්කම් හෝ වගකීම් වෙනත් කිසිවක් නොමැත .

| 2024.12.31 දිනට අසම්භාව්‍ය වත්කමේ ස්වභාවය | අසම්භාව්‍ය වත්කම පැන නැගුන පාර්ශවයේ නම | සම්භාවී/ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ රු. | මුදල් ප්‍රවාහ ගලාඒම මිනිය නොහැකි නම් |
|---|---|---|---|
| i. හිඟ හිට ඇති කුලී , විදුලි හා සනීපාරක්ෂක ගාස්තු නැවත ආපසු අය ගැනීම සඳහා ගොනුකර ඇති නඩුව - චෙන්නායි ට්‍රේඩ් සෙන්ටර් | ජෙම් නේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් | 2,226,597 | බේරුම්කරණය සඳහා නීති ගාස්තු |
| | යුනික් මල්ටි ආටිස්ට් | 194,143 | |
| | සාරා ඕස් ලෙදර් (ප්‍රයිවට්) ලිමිටඩ් | 1,131,017 | |
| ii. MASP යටතේ ලබාදී ඇති අත්තිකාරම් ගෙවීම ආපසු අයකර ගැනීම සඳහා ගොනුකර ඇති නඩුව | මොනාලිසා ප්‍රඩක්ට්ස් | | |
| | ෆැක්ටරි ස්ටයිල් (ප්‍රයිවට්) ලිමිටඩ් | 1,735,360 | නීති ගාස්තු |
| | බෝම්බුවල රබර් | | |
| iii. ණය ගෙවීම පැහැර හැරීම් | වර්ක්ස් ඔෆ් ආට්ස් | 16,000 | - |
| | රාජාස් ජුවලරි | 90,418 | - |
| | සිලෝන් ඕනමෙන්ටල් සෙරමික්ස් | 19,720 | - |
| | සමන් ජෙම්ස් ඇන්ඩ් ජුවෙලර්ස් | 73,841 | - |
| | යුනික් මල්ටි ආටිස්ට්ස් | 157,007 | - |
| iv. මෙතෙක් නැවත නොගෙවා ඇති , අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ගෙවා ඇති පෙර ගෙවීම නැවත අයකර ගැනීම සඳහා | සෝලා ග්‍රීන් ප්ලාන්ටේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 2,303,225 | - |
| v. වැටුපෙන් අයකර ගැනීම | ඩබ්.එච්.සී.ඩබ්.ප්‍රනාන්දු | 32,783 | - |
| | ආර්.එම්.එස්.කේ.ප්‍රියංකර | 24,479 | - |
| | එම්.ජේ.බී.පී.මාරසිංහ | 45,292 | |

**(26) වාර්තාකරණ දිනයෙන් පසු සිදුවීම්**

**(26.1) කම්කරු අධිකරණය විසින් විශේෂ ජීවන වියදම් දීමනාව සම්බන්ධයෙන් නිකුත් කළ අවසන් තීන්දුව**

2017/10/01 වන දින සිට ගෙවීම අත්හිටුවා ඇති විශේෂ ජීවන වියදම් දීමනාවට අදාළ කම්කරු ආරවුල සම්බන්ධයෙන් කම්කරු දෙපාර්තමේන්තුව විසින් අවසන් තීරණයක් ප්‍රකාශයට පත් කර තිබේ.

එම කම්කරු අධිකරණයේ තීන්දුව ප්‍රකාරව, 2023/03/21 වැනි දින සිට මෙම විශේෂ ජීවන වියදම් දීමනාව සඳහා සේවකයන් 49ක් සුදුසුකම් ලබන අතර 2022.12.31 වැනි දිනට මුළු වගකීම වනුයේ රු. 6,400,487 කි.

ඉහත බේරුම්කරණ තීරණය ප්‍රදානය කිරීමට එරෙහිව රිට් ආඥාවක් ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් කම්කරු කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත 2024/02/29 වැනි දිනැතිව රු. 4,915,890.89 ක් තැන්පත් කරන ලදී.

2024/12/31 දිනට වෙන් කිරීම් ගණනය කිරීම රු. 7,964,833.98 ක් දක්වා ඉහළ ගොස් ඇති අතර, ඒ අනුව 2024 වර්ෂය සඳහා රු. 1,564,346.98 ක ප්‍රතිපාදනයක් වෙන් කර තිබේ.

# විගණකාධිපති වාර්තාව 2024

*2025 ජුලි 31 දිනැති අංක TAC/E/EDB/FS/2024/27 දරන ලිපිය මඟින් විගණකාධිපති විසින් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ සභාපති වෙත යොමුකළ එම මණ්ඩලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වැනි වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාවේ සිංහල පරිවර්තනය*

සභාපති
ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වැනි වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

.......................................................................................................................................................

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ ("මණ්ඩලය") 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශ තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08හි 42 වැනි ඡේදය ප්‍රකාරව, පසුගිය වර්ෂවල සිදුවූ ප්‍රතිවර්ගීකරණ දෝෂය නිරවද්‍ය කිරීමේ දී, රු. 49,250,000 ක වටිනාකමකින් යුතු ප්‍රතිවර්ගීකරණය කළ කොටස් සහ වෙළඳ ණයගැතියන්ගේ සංසන්දනාත්මක තොරතුරු මූල්‍ය ප්‍රකාශවල නැවත සඳහන් නොකරන ලදී.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16හි (LKAS 16) 51 සහ 79 වැනි ඡේද ප්‍රකාරව, වත්කමක අවශේෂ අගය සහ ප්‍රයෝජ්‍ය ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය කර ගිණුම්ගත කළ යුතු ය. එසේ වුව ද, පූර්ණ වශයෙන් ක්ෂය කර තිබූ නමුදු තවමත් භාවිතයේ පවතින දේපළ, පිරියත සහ උපකරණ අයිතම 3,813ක් තක්සේරු කිරීම හෝ ගිණුම්ගත කිරීම සිදුකර නොතිබුණි.

(ඇ) සංවර්ධන කාර්යයන් සඳහා අපනයනකරුවන්ගේ දායකත්වය, ජාත්‍යන්තර මූල්‍ය සංස්ථා (IFC) අරමුදල සහ සම්මන්ත්‍රණ සහ පාඨමාලා ගාස්තුවලින් ලද ආදායම හඳුනාගැනීමට යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 18හි (LKAS 18) 35 වැනි ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශවල හෙළිදරවු කර නොතිබුණි.

(ඈ) පුද්ගලික සමාගමක කොටස් 1,413,772 ක වෙළඳපොළ අගයට අදාළව මණ්ඩලය විසින් සිදුකර තිබූ රු. 13,150,000 ක ආයෝජනය, 2024 දෙසැම්බර් 31 වැනි දිනට රු. 158,639, 356 ක් ලෙස මූල්‍ය ප්‍රකාශවල දක්වා තිබුණු අතර, මෙය 2022 දෙසැම්බර් 31 වැනි දිනට එහි වෙළඳපොළ අගය විය. එසේ වුව ද, 2024 දෙසැම්බර් 31 වැනි දිනට කොටස්වල වෙළඳපොළ අගය යනු 2022 දෙසැම්බර් 31 වැනි දිනට කොටස්වල වෙළඳපොළ අගයම බව සහ කොටස්වල වෙළඳපොළ අගය ගණනය කිරීමේ පදනමෙහි නිරවද්‍යතාවය විගණනය වෙත තහවුරු නොවිණි.

(ඉ) ඉදිරි වර්ෂයට අදාළ රු. 2,506,145ක් වශයෙන් වූ ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාවේ (IFC) ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස හඳුනාගැනීම, සංවර්ධන කාර්යයන් සඳහා අපනයනකරුවන්ගේ දායකත්වය සහ ජාත්‍යන්තර මූල්‍ය සංස්ථා අරමුදලේ ආදායම යන දෙකම යටතේ රු.14,087,416ක් වාර්තා කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම රු.16,593,561ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) විදේශ වෙළඳ ප්‍රදර්ශන වියදම් සහ වෙළඳ තොරතුරු සහ සේවා වියදම් පිළිවෙලින් රු. 9,400,597ක් සහ රු.2,506,145ක් වැඩියෙන් දක්වා තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් සමාලෝචිත වර්ෂයේ අපනයන සංවර්ධන වියදම් රු.11,906,742ක් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) බයෝෆැක් වෙළඳ ප්‍රදර්ශනය සඳහා අපනයනකරුවන්ගේ දායකත්වය ලෙජරයට අනුව රු.24,926,297ක් සහ එහි කාර්ය සටහනට අනුව රු. 25,825,297ක් විය. ඒ අනුව, එම ශේෂ දෙක අතර රු. 899,000ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඖ) විගණනය සඳහා කොටස් සහතික ඉදිරිපත් නොකළ හෙයින් රු. 34,581,905ක් වශයෙන් පැවති කොටස්වල ආයෝජන සම්භාරය සහ රු. 34,423,710ක වටිනාකමකට ඒ මත සිදුකළ හානිකරණය ද තහවුරු කළ නොහැකි විණි.

(ඔ) සමාගම් 26කට අදාළව ඒවායේ පැවැත්ම පිළිබඳ සාක්ෂි නොතිබීම හේතුවෙන් එකී සමාගම්වල සාමාන්‍ය කොටස්වල සිදුකර තිබූ රු. 5,614,330ක ආයෝජන සහ වරණීය කොටස්වල සිදුකර තිබූ රු.34,602,698ක ආයෝජන නැවත ආපසු ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව වෙතින් ලැබී තිබූ තහවුරු කිරීමකට අනුව, සමාගම් ලැයිස්තුවේ එකී සමාගම් නොපැවතිණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශ විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසය යි.

## 1.3 මණ්ඩලයේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත්, මණ්ඩලයේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකාරිත්වය වගකිව යුතු ය.

මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර, මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේ දී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශ සමඟ හෝ විගණනයේ දී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීම යි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නොමැත.

## 1.4 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යෑමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විසින් මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට දීමෙහෙයුම් නැවත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

## 1.5 මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයක් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්;

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන්මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම්

හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා සිදුවන බැවිනි.

- මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමුකළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු ය. කෙසේ වුව ද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකි ය.

- මූල්‍ය ප්‍රකාශවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික සහ නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට මණ්ඩලය විසින් නිසි මූල්‍ය වාර්තා පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශ ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 මාගේ වාර්තාවේ තත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ (ඉ) වශයෙන් දැක්වෙන විගණන කරුණු හැර ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදුකරන ලද නිර්දේශයන්, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයට අනුකූලව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ ලබාගන්නා ලද සාක්ෂි මත, පහත සඳහන් ප්‍රකාශ සිදුකිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධ වී ඇති යම් ගිවිසුමක් සම්බන්ධයෙන් ඍජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, පහත සඳහන් කරුණු හැර, යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියාකර ඇති බව;

| | නීති/ විධානයට යොමුව | විස්තරය |
|---|---|---|
| (අ) | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 2(1) සහ 102 වගන්ති | ආදායම් බදු සඳහා ලියාපදිංචි වීමට හෝ බදු ගෙවීමෙන් නිදහස් වීමේ තත්ත්වය ලබාගැනීමට මණ්ඩලය විසින් පියවර ගෙන නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ VIII පරිච්ඡේදයේ 6.1 වැනි ඡේදය | පැයකට ගෙවිය යුතු අතිකාල දීමනා ගෙවීමේ අනුමත අනුපාතිකය වනුයේ මූලික වැටුපෙන් 1/240ක් වුව ද, භාණ්ඩාගාර අනුමැතියකින් |

| | | |
|---|---|---|
| | | තොරව, මණ්ඩලය විසින් මූලික වැටුපෙන් 1/120ක් යන අනුපාතිකය යොදා ගෙන තිබුණු අතර, අතිකාල සහ නිවාඩු දින වැටුප් වශයෙන් රු.7,590,234ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණි. |
| (ඇ) | 2015 මැයි 25 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අංක 01/2015 | මණ්ඩලය විසින් ප්‍රවාහන දීමනා සඳහා හිමිකම් නොලබන එහි PL, MA සහ JM යන සේවා කාණ්ඩවල සේවකයන් 166 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂය තුළ දී ප්‍රවාහන දීමනා වශයෙන් එකතුව රු. 15,545,690ක් ගෙවා තිබුණි. |
| (ඇ) | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ 2024 දෙසැම්බර් 30 දිනැති අංක TO/CFM/2023/Miscellaneous දරන ලිපියේ 03 වැනි ඡේදය | භාණ්ඩාගාරය විසින් අරමුදල් නිකුත් කර තිබුණ ද, වර්ෂය තුළ අපේක්ෂිත කාර්යය සම්පූර්ණ කර නොමැති නම් හෝ, අදාළ කාර්යය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව උපයෝගී කර නොගත් ශේෂයක් පවතී නම්, එවැනි අරමුදල් අදාළ මූල්‍ය වර්ෂය අවසානවීමට පෙර භාණ්ඩාගාරය වෙත භාරදිය යුතු ය. එසේ වුව ද, ලැබී ඇති නමුදු වර්ෂය තුළ උපයෝගී කර නොගත් රු. 27,077,846 ක් වූ මුදල අනෙකුත් ප්‍රදාන වෙත මාරු කර රඳවාගෙන තිබුණි. |

2.2.3 2018 අංක 19 දරන විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, පහත සඳහන් කරුණු හැර, මණ්ඩලය විසින් එහි බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇතිබව;

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා තිබූ අනුමැතිය ලබා දී නොතිබුණ ද, මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ 1985 වර්ෂයේ සිට 4.2%ක පොලී අනුපාතිකයක් යටතේ කාණ්ඩ හතරකින් සමන්විත කාර්ය මණ්ඩල ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරමින් පවතී.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාලසීමාවන් තුළ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව;

## 2.3 වෙනත් කරුණු

(අ) මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වැනි දින වන විට අපනයනකරුවන් වෙත ලබා දී ඇති රු. 37,984,520ක් වූ අපනයන ණයවලින් අපනයනකරුවන් 146 දනෙකුෙ වෙතින් අයවිය යුතු මුදල රු. 36,788,520කි. මෙ මුදලින් සියයට 97ක් වසර 26ක කාල සීමාවක් මුළුල්ලේ අයකර ගෙන නොතිබුණි.

(ආ) ඌව පරණගම අපනයන නිෂ්පාදන ගම්මාන (UPEPV) වැඩසටහන යටතේ ගොවීන් වෙත ලබා දී තිබූ රු. 10,403,683ක ණය ශේෂයක් වසර 15 ක් මුළුල්ලේම අයකර ගැනීමට මණ්ඩලය විසින් අපොහොසත් වී තිබුණි.

(ඇ) අනෙකුත් ණය ගැතියන්ගෙන් අයකර ගත යුතු රු. 8,131,218ක මුදලක් වසර 15 ක් මුළුල්ලේම අයකර ගැනීමට මණ්ඩලය විසින් අපොහොසත් වී තිබුණි.

(ඈ) ආයතන 07කින් සේවා ලබා ගැනීම සඳහා තැන්පත් කර තිබූ රු. 901,000ක වටිනාකමකින් යුතු තැන්පතු අයකර ගැනීමට වසර 08 සිට 26 දක්වා කාලයක් ගතවී තිබුණි.

(ඉ) මණ්ඩලය විසින් 2018 සිට 2022 දක්වා කාල සීමාව තුළ වෙළඳපොළ ප්‍රවේශ සහාය වැඩසටහන යටතේ ව්‍යාපාර සංවිධාන 103ක් සඳහා රු.231,424,708ක මුදලක් ප්‍රදානය කර තිබුණි. ඒ අතුරින් රු.72,479,504 ප්‍රදානය කරතිබූ ව්‍යාපාර සංවිධාන 29 එකී කාල සීමාව තුළ අපනයන කටයුතුවල නිරත වී සිටි බවට විගණනයට තහවුරු නොවිණි. තව ද, රු. 9,674,300ක් ප්‍රදානය කර ඇති සංවිධාන 05ක් සහ රු. 1,796,531ක් ප්‍රදානය කර ඇති තවත් සංවිධාන 05ක් පිළිවෙලින් 01 වැනි වසර සහ 02 වැනි වසරවල දී පමණක් අපනයන කටයුතුවල නිරතවී තිබුණි. 2022 දෙසැම්බර් මාසයේ දී මෙම වැඩසටහන අවසන් කිරීමෙන් අනතුරුව මණ්ඩලය විසින් අඛණ්ඩ පසු විපරම් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

අත්/කළේ. ජී.එච්.ඩී.ධර්මපාල

විගණකාධිපති (වැ.බ.)

## මූල්‍ය වාර්තාව / 2015 සිට 2024 දක්වා මූල්‍ය කටයුතුවල සුවිශේෂි කරුණු

1979 අංක 40 දරන පනත යටතේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාපනය කර පවත්වා ගෙන යන ව්‍යවස්ථාපිත ආයතනයක් වශයෙන්, විනිවිදබව සහ වගවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ කැපවීම අඛණ්ඩව පවතී. අපනයන සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය අංශය විසින් කළමනාකාරිත්වය සහ අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ කරුණු සාකච්ඡා කර මූල්‍ය කළමනාකරණ කාර්යයන් ක්‍රියාත්මක කරනු ලැබේ.

ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (IFRS) සමඟ අනුකූලවන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (SLFRS සහ LKASs) ප්‍රකාරව මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, විස්තීර්ණ ආදායම, හිමිකම් වෙනස්වීම, මුදල් ප්‍රවාහ, සහ සටහන්වලින් සමන්විත මූල්‍ය ප්‍රකාශන ඉතා සුපරික්ෂාකාරී අයුරින් පිළියෙල කර තිබේ. අපනයන සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය තොරතුරුවල සංගතබව සහ සංසන්දනාත්මක බව මෙම ප්‍රමිත මගින් සහතික කෙරෙන අතර එමඟින් එහි මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලැබේ.

අදාළ සටහන් යටතේ සාධාරණ අගය සම්බන්ධයෙන් අනාවරණය කිරීම් යෝග්‍ය වෙයැයි හැඟෙන අවස්ථාවලදී හැර අපනයන සංවර්ධන මණ්ඩලය එහි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී ඓතිහාසික පිරිවැය පදනමට අනුගත වේ. මූල්‍ය තත්ත්වය පිළිබඳ පැහැදිලිබව වැඩිදියුණු කරමින්, වත්කම් සහ වගකීම් ඒවායේ ස්වභාවය අනුව සහ ඒවායේ සාපේක්ෂ ද්‍රවශීලතාවයේ අනුපිළිවෙල අනුව වර්ගීකරණය කෙරේ.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නව ප්‍රමිතීන්, සංශෝධන සහ දැනට පවතින ප්‍රමිත සඳහා අර්ථ නිරූපණ ප්‍රකාශයට පත්කරන අතර, මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ඒවායේ බලපෑම තක්සේරු කර නොමැත. එසේ වුව ද, බලාත්මක වීමෙන් අනතුරුව මූල්‍ය ප්‍රකාශන සඳහා අදාළ වේ යැයි අපේක්ෂා කරන මෙම ප්‍රමිතීන්, අර්ථ නිරූපණ සහ සංශෝධන ක්‍රියාවට නැංවීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය කැපවී සිටියි.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී කළමනාකාරිත්වය විසින් විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන භාවිතා කරන බව සඳහන් කිරීම වැදගත් වි. මෙම සාධක සම්බන්ධයෙන් වන අවිනිශ්චිතතාවය හේතුවෙන් අනාගතයේ දී වත්කම් හා වගකීම්වල ධාරණ අගය සඳහා ගැලපුම් කිරීමේ විභවයක් ඇති වේ. මූල්‍ය වාර්තාකරණය ඔස්සේ මණ්ඩලයේ තත්‍ය මූල්‍ය තත්ත්වය පිළිබිඹුවන බව සහතික කිරීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය එහි ප්‍රවේශය සම්බන්ධයෙන් සුපරීක්ෂාකාරීව සිටියි.

## 2015 සිට 2024 දක්වා මූල්‍ය කටයුතුවල සුවිශේෂී කරුණු

**ආදායම** රු.මි.

| අයිතමය | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| භාණ්ඩාගාර අරමුදල් | 462.8 | 364.5 | 352.6 | 529.9 | 466.9 | 343.9 | 489.2 | 351.5 | 363.8 | 459.7 |
| සංවර්ධන කටයුතු සඳහා අපනයනකරුවන්ගේ දායකත්වය | 84.0 | 64.9 | 60.0 | 57.4 | 89.3 | 45.4 | 21.5 | 119.0 | 233.5 | 311.5 |
| ලාභාංශ ආදායම | 54.1 | 42.9 | 60.2 | 40.2 | 34.8 | 38.6 | 40.3 | 90.7 | 58.2 | 43.2* |
| අනෙකුත් ආදායම් | 22.8 | 50.0 | 31.9 | 20.8 | 22.6 | 12.5 | 19.2 | 18.9 | 58.9 | 67.1 |
| **මුළු ආදායම** | **623.6** | **522.2** | **504.6** | **648.2** | **613.6** | **440.4** | **570.3** | **580.0** | **714.4** | **881.5** |

**වියදම්** රු.මි.

| අයිතමය | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 361.3 | 338.9 | 373.8 | 400.6 | 402.3 | 370.5 | 372.7 | 357.0 | 400.3 | 405.9 |
| ප්‍රාග්ධන/ සංවර්ධන වියදම් | 245.6 | 208.0 | 227.4 | 255.8 | 199.8 | 66.7 | 109.7 | 145.8 | 317.9 | 471.6 |
| **මුළු වියදම** | **606.9** | **546.9** | **601.1** | **656.5** | **602.2** | **437.2** | **482.4** | **502.8** | **718.2** | **877.5** |

**විස්තීර්ණ ආදායම** රු.මි.

| අයිතමය | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම | 623.6 | 522.2 | 504.6 | 648.2 | 613.6 | 440.4 | 570.3 | 580.0 | 714.4 | 881.5 |
| වියදම (පුනරාවර්තන/ සංවර්ධන) | 606.9 | 546.9 | 601.1 | 656.5 | 602.2 | 437.2 | 482.4 | 502.8 | 718.2 | 877.5 |
| හානිය සඳහා වෙන් කිරීම් | - | - | - | - | - | - | (0.4) | (137.4) | 2.6 | - |
| **ඌනතාව/ අතිරික්තය** | **16.7** | **(24.7)** | **(96.5)** | **(8.2)** | **11.4** | **3.2** | **88.3** | **214.7** | **(6.4)** | **4.0** |
| මූල්‍ය නොවන ගනුදෙනු | | | | | | | | | | |
| ආශ්‍රිත සමාගම්වල ලාභය/ අලාභයේ කොටස | 53.4 | 70.5 | 76.2 | (91.2) | 55.3 | 70.8 | 123.4 | 4.2 | 90.2 | 71.6 |
| අනෙකුත් විස්තීර්ණ ආදායම් | - | - | - | - | - | - | - | 95.5 | (6.1) | (4.0) |
| **මුළු විස්තීර්ණ ආදායම** | **70.1** | **45.8** | **(20.3)** | **(99.4)** | **66.7** | **74.0** | **211.7** | **314.4** | **77.7** | **71.7** |

**මූල්‍ය තත්ත්වය** **රු.මි.**

| අයිතමය | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | | | | | | |
| ජංගම නොවන වත්කම් | 993.3 | 1062.4 | 1124.0 | 1189.2 | 1106.1 | 1142.1 | 1206.3 | 1555.3 | 1634.6 | 1686.8 |
| ජංගම වත්කම් | 238.7 | 269.0 | 215.5 | 194.1 | 206.1 | 191.7 | 182.8 | 175.5 | 275.1 | 205.3 |
| **මුළු වත්කම්** | **1232.0** | **1331.4** | **1339.5** | **1383.3** | **1312.2** | **1333.8** | **1389.0** | **1730.8** | **1909.7** | **1892.1** |
| **හිමිකම් සහ වගකීම්** | | | | | | | | | | |
| හිමිකම්වල දායකත්වය | 10.0 | 10.0 | 10.0 | 10.0 | 10.0 | 10.0 | 10.0 | 10.0 | 10.0 | 10.0 |
| වියදමට එරෙහිව සමුච්චිත ආදායම | 1026.3 | 1092.3 | 1114.2 | 1093.3 | 1010.8 | 1064.9 | 1138.7 | 1554.4 | 1632.0 | 1645.4 |
| **මුළු හිමිකම්** | **1036.3** | **1102.3** | **1124.2** | **1103.3** | **1020.8** | **1074.9** | **1148.7** | **1564.4** | **1642.0** | **1655.4** |
| **ලැබී ඇති ප්‍රදානයන්** | | | | | | | | | | |
| රජයේ ප්‍රදාන | 13.2 | 38.8 | 44.3 | 49.7 | 54.4 | 56.1 | 60.5 | 65.0 | 78.7 | 105.7 |
| රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම | (3.9) | (7.2) | (11.4) | (16.7) | (22.7) | (29.5) | (36.5) | (50.0) | (56.4) | (64.1) |
| | **9.4** | **31.6** | **33.0** | **33.0** | **31.7** | **26.6** | **23.9** | **14.9** | **22.3** | **41.6** |
| **ජංගම නොවන වගකීම්** | | | | | | | | | | |
| ප්‍රතිපාදන සහ අනෙකුත් වගකීම් | 26.5 | 29.2 | 30.5 | 19.4 | 52.4 | 57.4 | 37.1 | 58.4 | 175.4 | 135.4 |
| විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම් | 84.4 | 93.2 | 88.1 | 90.0 | 79.0 | 75.4 | 68.2 | 27.8 | 34.0 | 25.3 |
| අනෙකුත් ගෙවිය යුතු | 75.5 | 75.1 | 63.8 | 137.5 | 128.3 | 99.4 | 74.7 | 65.4 | 36.0 | 34.4 |
| **මුළු ජංගම නොවන වගකීම්** | **186.4** | **197.5** | **182.3** | **246.9** | **259.7** | **232.3** | **179.9** | **151.5** | **245.4** | **195.1** |
| **මුළු හිමිකම් සහ වගකීම්** | **1232.0** | **1331.4** | **1339.5** | **1383.3** | **1312.2** | **1333.8** | **1352.6** | **1730.8** | **1909.7** | **1892.1** |